# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

# கமத்தொழில் அபிவிருத்தி அதிகார சபை

# AGRICULTURAL DEVELOPMENT AUTHORITY

**1987 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂයේ වාර්තාව**

**1987 டிசெம்பர் 31 உடன் முடிவுள்ள வருடத்துக்கான ஆண்டு அறிக்கை**

Annual Report for year ended 31 December 1987



# පටුන

කෘෂිකර්ම සංවර්ධන අධිකාරිය


| පිළිවෙළ | | පිටුව |
|---|---|---|
| 1. | සාමාන්‍ය තොරතුරු<br>ප්‍රධාන කාර්යාලීය විධායක කාර්ය මණ්ඩලය<br>මැතිවරණ කොට්ඨාශ කාර්ය මණ්ඩලය<br>මැතිවරණ කොට්ඨාශ 110 සඳහා වූ සේවක සංඛ්‍යාව ... ... ... | 1—15 |
| 2. | සභාපතිතුමාගේ සමාලෝචනය ... ... ... | 16—20 |
| 3. | දකුණු පළාත භාර අධ්‍යක්ෂතුමාගේ වාර්තාව ... ... ... | 21—23 |
| 4. | ඌව පළාත භාර අධ්‍යක්ෂතුමාගේ වාර්තාව ... ... ... | 24—26 |
| 5. | උතුරු මැද පළාත භාර අධ්‍යක්ෂතුමාගේ වාර්තාව ... ... | 27—29 |
| 6. | වයඹ පළාත භාර අධ්‍යක්ෂතුමාගේ වාර්තාව ... ... ... | 30—33 |
| 7. | මධ්‍යම පළාත භාර අධ්‍යක්ෂතුමාගේ වාර්තාව ... ... ... | 34—36 |
| 8. | බටහිර පළාත භාර අධ්‍යක්ෂතුමාගේ වාර්තාව ... ... ... | 37—40 |
| 9. | උතුරු පළාත භාර අධ්‍යක්ෂතුමාගේ වාර්තාව ... ... ... | 41—43 |
| 10. | සබරගමු පළාත භාර අධ්‍යක්ෂතුමාගේ වාර්තාව ... ... ... | 44—46 |
| 11. | නැගෙනහිර පළාත භාර අධ්‍යක්ෂතුමාගේ වාර්තාව ... ... ... | 47—49 |
| 12. | පුහුණු හා ප්‍රචාරක කටයුතු භාර අධ්‍යක්ෂතුමාගේ වාර්තාව ... ... ... | 50—53 |
| 13. | කෘෂිකාර්මික යෙදවුම් අධ්‍යක්ෂතුමාගේ වාර්තාව ... ... ... | 54—59 |
| 14. | අලෙවි අධ්‍යක්ෂතුමාගේ වාර්තාව ... ... ... | 60—64 |
| 15. | ව්‍යාපෘති ඇගයීමේ අධ්‍යක්ෂතුමාගේ වාර්තාව ... ... ... | 65—68 |
| 16. | 1986.12.31 දිනට ශේෂ පත්‍රය සහ 1986.01.01 සිට 1986.12.31 දක්වා ආදයම සහ වියදම් ගිණුම ... | 69—75 |
| 17. | විගණකාධිපති සටහන ... ... ... | 76 |
| 18. | විගණකාධිපති වාර්තාව ... ... ... | 77—81 |
| 19. | විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් සභාපතිතුමාගේ අදහස් ... ... | 82—83 |


DEPARTMENT OF AGRICULTURE
CENTRAL
1 - -5-1990
LIBRARY
PERADENIYA.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

**සාමාන්‍ය තොරතුරු — වාර්ෂික වාර්තාව—1987**

**අධ්‍යක්ෂ මණ්ඩලය :-**

| | | |
|---|---|---|
| රන්ජන් විජේරත්න (එෆ්.සී.අයි.පී) | — | සභාපති. |
| ආර්. අයි. ප්‍රනාන්දුපුල්ලේ (සභාපති - පො.ව.ම.) | — | අධ්‍යක්ෂ. |
| එච්. එම්. සී. කපිලරත්න (ගොවිජනසේවා කොමසාරිස්) | — | අධ්‍යක්ෂ. |
| ආචාර්ය එස්. ඩී. අයි. ඊ. ගුණවර්ධන (කෘෂිකර්ම අධ්‍යක්ෂ) | — | අධ්‍යක්ෂ. |
| ආචාර්ය සී. ආර්. පානබොක්ක | — | අධ්‍යක්ෂ. |
| නීතිඥ මර්වින් සමරවීර | — | අධ්‍යක්ෂ. |
| සී. එම්. බී. බෝගොල්ලාගම | — | අධ්‍යක්ෂ. |

**ප්‍රධාන කාර්යාලය :**

තැ. පෙ. 1767 - අංක 38, - ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10.

**බැංකු කරුවෝ**

මහජන බැංකුව

**විගණකවරු :**

විගණකාධිපති

**ප්‍රධාන කාර්යාලයේ කාර්ය මණ්ඩලය (පළාත් අධ්‍යක්ෂවරු)**

| | | |
|---|---|---|
| දකුණු පළාත | ඒ. ඕ. බී. ද අල්මේදා | බී. එස්. සී. (ස්වාභාවික විද්‍යාව , ඒ. සී. අයි පී. එළවලු භෝග නිශ්පාදනය හා අලෙවිය පිළිබඳ හැදෑරීම (රට්ගර්ස් විශ්ව විද්‍යාලය, ඇ. එ. ජනපදය) සෝයා බෝංචි නිශ්පාදනය හා පරිහරණය පිළිබඳ හැදෑරීම (ඉලිනොයිස් විශ්ව විද්‍යාලය ඇ. එ. ජනපදය), දුරස්ථ සංවේදී තාක්ෂණය පිළිබඳ හැදෑරීම(ආතර් සී ක්ලාක් කේන්ද්‍රය) කෘෂිකාර්මික අලෙවිකරණ තොරතුරු විධි පිළිබඳ හැදෑරීම (ඒ.එෆ්.එම්.ඒ., පිලිපීනය) කෘෂිකාර්මික ව්‍යාපෘති සැළසුම් කිරීම හා සංවර්ධනය පිළිබඳ හැදෑරීම (ඊශ්‍රායලය.) |
| උතුරුමැද පළාත | එන්. ජී. වික්‍රමසිංහ | බී. එස්. සී., ඒ. අයි. එම්. ඒ. |
| වයඹ පළාත | ජී. ඒ. කුමාරගේ | |
| මධ්‍යම පළාත | පී. සී. අබේනායක | |
| බටහිර පළාත | ජී. එල්. ඩී. මෙල් | |

| | | |
|---|---|---|
| උතුරු පළාත | අයි. එම්. වේදනායගම් | බී. එස්. සී. (කෘෂිකර්ම) (පරිගණක විධි කළමනාකරණය පිළිබඳ සහතිකය), ජා. ව්‍යා. ක. ආ. ශ්‍රී ලංකා 1986 |
| සබරගමු පළාත | පී. ඒ. ආර්. පතිරණ | |
| නැගෙනහිර පළාත | ඩී. එච්. එස්. ඩබ්. තිලකරත්න | කෘෂිකර්ම ඩිප්ලෝමා |
| ඌව පළාත | මර්වින් එෆ්. ගුණවර්ධන | |

**නියෝජ්‍ය පළාත් අධ්‍යක්ෂවරු :-**

**දකුණු පළාත :-**

| | | |
|---|---|---|
| ගාල්ල | ඒ. එම්. අබේරත්න | කෘෂිකර්ම ඩිප්ලෝමා. |
| මාතර | ඩී. ආර්. අල්විස් (87/2/1 දින සිට) | බී. ඒ. |
| හම්බන්තොට | ඩී. එස්. ඒ. ගමගේ | කෘෂිකර්ම ඩිප්ලෝමා. |

**උතුරු මැද පළාත :-**

| | | |
|---|---|---|
| අනුරාධපුරය | ජී. කරුණාසේන | |
| පොළොන්නරුව | ඩී. එස්. කේ. විතාන | බී.ඒ. |

**වයඹ පළාත :-**

| | | |
|---|---|---|
| කුරුණෑගල | එස්. බී. රකව | කෘෂිකර්ම ඩිප්ලෝමා. |
| පුත්තලම | එල්. පී. පතිරණ | බී. එස්. සී. (කෘෂිකර්ම) |

**මධ්‍යම පළාත :-**

| | | |
|---|---|---|
| මාතලේ | එන්. ලියෝනිදාස් | |
| මහනුවර | එන්. එස්. එස්. කේ. සේමසිංහ | කෘෂිකර්ම ඩිප්ලෝමා |
| නුවරඑළිය | ආර්. දීප්ත කුලතිලක | එම්. එස්. සී. (කෘෂිකර්ම) |

**බටහිර පළාත :-**

| | | |
|---|---|---|
| කළුතර | ඒ. එල්. වී. ප්‍රනාන්දු | බී. එස්. සී. (වතු කළමණාකරණය හා තක්සේරු කරණය). |
| ගම්පහ | ආර්. ඩබ්. ඩී. ඩබ්. පී. බී. රාජකරුණා | කෘෂිකර්ම ඩිප්ලෝමා |

**උතුරු පළාත :-**

| | | |
|---|---|---|
| වව්නියාව | කේ. ගනේෂරත්නම් 87/11/1 (දිනසිට) | බී. එස්. සී. (කෘෂිකර්ම). |

**සබරගමු පළාත :-**

| | | |
|---|---|---|
| රත්නපුරය | ඩී. ඩී. ද. එස්. අමරවීර | කෘෂිකර්ම ඩිප්ලෝමා, කෘෂිකර්ම ඉංජිනේරු කරණය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය. (බටහිර ජර්මනිය) |

| | | |
|---|---|---|
| කෑගල්ල | එස්. එම්. සෙනෙවිරත්න | කෘෂි/ඩිප්ලෝමා. |

**නැගෙනහිර පළාත :-**

| | | |
|---|---|---|
| අම්පාර | ආර්. මාදවන් | බී. එස්. සී. |
| මඩකලපුව | වී. කනගරත්නම් (87/12/01 දිනසිට) | කෘෂි/ඩිප්ලෝමා. |
| ත්‍රිකුණාමලය | ඩී. ජයසිංහ (87/2/1 දින සිට) | කෘෂි/ඩිප්ලෝමා. |

**ඌව පළාත :-**

| | | |
|---|---|---|
| මොණරාගල | ඒ. සී. ආර්. ද සිල්වා | |
| බදුල්ල | ගැමුණු සමරකෝන් | |

**පුහුණු හා ප්‍රචාරක :-**

| | | |
|---|---|---|
| අධ්‍යක්ෂ | එන්. යූ. අයි. පෙරේරා | කෘෂිකර්ම ඩිප්ලෝමා ද්විතීය පුහුණු (කෘෂිකර්ම විද්‍යා) පශ්චාත් උපාධි ඩිප්ලෝමා (කෘෂි අධ්‍යාපනය) වූස්ටර් එක්සත් රාජධානිය. |

**කෘෂි යෙදවුම්:-**

| | | |
|---|---|---|
| අධ්‍යක්ෂ | ආර්. ටී. සී. පීරිස් | බී. එස්. සී. (ඉංජිනේරු) එම්. ඉංජිනේරු (වාරිමාර්ග සහ ජල බලය) එම්. අයි. සී. ඊ. (ලන්ඩන්) ශ්‍රී ලංකා වරලත් ඉංජිනේරු ආයතනයේ සාමාජික. |

**නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් :-**

| | | |
|---|---|---|
| පොහොර හා කෘෂි රසායන ද්‍රව්‍ය | බී. බී. ඒ. ඊ. මැදිවක | බී. එස්. සී. 30/06/87 දක්වා. |
| වාරිමාර්ග | එස්. සී. මංචනායක | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ, ජ්‍යෙෂ්ඨ කාර්මික නිලධාරී විභාගය, ලෝක බැංකුවේ ආර්ථික සංවර්ධන ආයතනයේ විදේශ සාමාජික |
| කෘෂි උපකරණ හා ගොවිපල බලය | ඒ. ඩී. එම්. කරුණාරත්න | කෘෂිකර්ම ඩිප්ලෝමා, රබර් තාක්ෂණික විද්‍යාව, ක්‍රවුන් සහතිකය, (කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ නඩත්තුව හා පාලනය - එක්සත් රාජධානිය) |
| බීජ හා රෝපන ද්‍රව්‍ය | පී. එම්. බී. ඒකනායක | බී. එස්. සී. (කෘෂිකර්ම) |
| සත්ව පාලනය | ආර්. එම්. බී. ප්‍රනාන්දු | බී. එස්. සී. (කෘෂිකර්ම) එම්.එස්.සී (කෘෂිකර්ම) |
| කෘෂිකාර්මික ණය හා රක්ෂණ | එස්. පී. ගුණතිලක 15/05/87 සිට | බී. ඒ. (ලංකා) ව්‍යාපාර කළමණාකරණය පිළිබඳ පාඨමාලාව (එන්. අයි. බී. එම්) ප්‍රථම කොටස- බැංකුකරුවන්ගේ ආයතනය - ලන්ඩන්. එම මධ්‍යම පරීක්ෂණය බැංකුකරුවන්ගේ ආයතනය ශ්‍රී ලංකා) |

**අලෙවි කටයුතු :-**

| | | |
|---|---|---|
| අධ්‍යක්ෂ | ආචාර්ය උපාලි නානායක්කාර | බී. ඒ. (ආර්ථික විද්‍යාව) ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය පේරාදෙනිය, ඩිප්ලෝමා. අයි. බී. කේ. (ලන්ඩන්), එම්. ඒ. (සංනිවේදන), එම්. එස්. සී. (කෘෂිකාර්මික ආර්ථික විද්‍යාව), එම්. බී. ඒ. (ආහාර ක්‍රම, ආර්ථික විද්‍යාව සහ කළමණාකරණය) පී. එච්. ඩී. (කෘෂිකාර්මික ආර්ථික විද්‍යාව) මිචිගන් ජනපද විශ්ව විද්‍යාලය, ඇමෙරිකා එක්සත් ජනපදය. |

**නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් :-**

| | | |
|---|---|---|
| ගබඩා හා ගුදම් | ඩී. ටී. කිංග්ස්ලි බර්නාඩ් | බී. එස්. සී. (සංඛ්‍යායනය හා ගණිතය) පරිගණක විධි සැලසුම් ඩිප්ලෝමා (ජා. ව්‍යා. ක. ආ) කෘෂි අලෙවි ඩිප්ලෝමා ජාත්‍යන්තර කෘෂිකර්ම අධ්‍යාපන පාසැල, කොළරාඩෝ ප්‍රාන්ත විශ්ව විද්‍යාලය, එක්සත් ජනපදය, අලෙවි කළමණාකරණය පිළිබඳ ඩිප්ලෝමා (ජා. ව්‍ය. ක. ආ.) එම්. බී. ඒ. කොළඹ විශ්ව විද්‍යාලය. |
| ප්‍රවාහන හා සංනිවේදන | ඩබ්. ඒ. ප්‍රනාන්දු | බී. එස්. සී (සංඛ්‍යායනය හා ගණිතය) අලෙවි කළමණාකරණය පිළිබඳ ඩිප්ලෝමා (ජා. ව්‍ය. ක. ආ.) (87/8/17 දක්වා) |
| මිළ හා සංඛ්‍යාලේඛන | පී. ඩී. සී. එෆ්. ලොයිඩ් | බී. එස්. සී. (සංඛ්‍යායනය හා ගණිතය) |
| සංඛ්‍යාලේඛන නිලධාරී | ටී. මුතුමාල | බී. එස්. සී. (සංඛ්‍යායනය හා ගණිතය) |

**ව්‍යාපෘති ඇගයීම් :-**

| | | |
|---|---|---|
| අධ්‍යක්ෂ | ඒ. බී. ඩී. පී. වික්‍රමරත්න | (විද්‍යාවේදී උපාධි, වරලත් රසායන විද්‍යාඥ ලංකා රසායන විද්‍යා ආයතනය සාමාජික) |

**ගිණුම් :-**

| | | |
|---|---|---|
| ප්‍රධාන ගණකාධිකාරී | එස්. සී. හතරසිංහ මහත්මිය. | |

**පරිපාලනය :-**

| | | |
|---|---|---|
| අධ්‍යක්ෂ | සී. ජේ. පී. ගුණවර්ධන | බී. ඒ. (ලංකා) |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | සුසන්ත පෙරේරා (30/09/87 දක්වා) | බී. එස්. සී. (විද්‍යාලංකාර) |
| | එම්. සේනානායක (87/12/1 දින සිට) | බී. ඒ. |
| සහකාර අධ්‍යක්ෂ ප්‍රවාහන | ඩී. කන්දඋඩහේවා | බී. ඒ. විශේෂවේදී (ප්‍රවාහන ආර්ථික විද්‍යාව) මෝටර් කාර්මික විද්‍යා සහතිකය(ල. ජ. කා. අ. ආ). |

| | |
|---|---|
| සහකාර අධ්‍යක්ෂ පරිපාලන පිරිස් හා සැපයුම්) | ඩී. ගමආරිය |
| පරිගණක විශ්ලේෂක වැඩසටහන් සම්පාදක | ඒ. පී. සමරකෝන් |
| සභාපතිගේ පෞද්ගලික ලේකම්වරුන් | ඒ. එන්. අමරසේකර මෙනවිය.<br>එච්. කේ. මල්දෙණිය මෙනවිය. |

| පළාත | මැතිවරණ කොට්ඨාශය | කෘෂිකාර්මික කළමණාකරුගේ නම | කෘෂිකාර්මික කළමනා කරුගේ කාර්යාලීය ලිපිනය. |
|---|---|---|---|
| දකුණු පළාත | වැලිගම | ඩී. ගුණවර්ධන, ක්ෂේත්‍ර පර්යේෂණ ඩිප්ලෝමා, බටහිර ජර්මනිය | ගො.සේ.ම. - බොරාල, වැලිගම |
| | අකුරැස්ස | එච්.ඩබ්. ගුණසේකර (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම. - අකුරැස්ස |
| | හක්මන | එන්. එච්. පාලිත යාපා | ගො.සේ.ම. - පස්ගොඩ, දෙනියාය හරහා. |
| | දෙනියාය | ඒ. පී. රණතුංග (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම. - මොරවක |
| | මාතර | පී. විනෝදහේවා (බී.ඒ.) | ගො.සේ.ම. - ඉසදීන් නගරය, ගොඩගම, මාතර. |
| | කඹුරුපිටිය | සිරිල් රාජපක්ෂ | ගො.සේ.ම. - කඹුරුපිටිය |
| | දෙවිනුවර | ඩී. එන්. යාපා | ගො.සේ.ම. - දික්වැල්ල. |
| | තංගල්ල | එච්. ඒ. පියසිරි (බී.ඒ.) | ගො.සේ.ම. - නෙටොල්පිටිය. |
| | මුල්කිරිගල | එස්. වී. වීරරත්න | ගො.සේ.ම. - වලස්මුල්ල. |
| | බෙලිඅත්ත | ඒ. පී. එස්. විජේසිංහ | ගො.සේ.ම. - බෙලිඅත්ත. |
| | තිස්සමහාරාම 1 | එච්. එම්. ඒ. බී. කරුණාරත්න (බී.ඒ.) 30/09/87 දක්වා | ගො.සේ.ම. අම්බලන්තොට. |
| | තිස්සමහාරාම 11 | සිරිමල් අබේධීර (බී.ඒ.) | ගො.සේ.ම. යෝධකන්ඩිය. |
| | අක්මීමන | ජී. කොඩිතුවක්කු (කෘෂි. ඩිප්ලෝමා) | ගො.සේ.ම. - ලබුදූව. |
| | හිනිදුම | ඒ. එච්. පී. ගුණවර්ධන | ගො.සේ.ම, - නාගොඩ, ඇතුමලේ. |

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය



| පළාත | මැතිවරණ කොට්ඨාශය | කෘෂිකාර්මික කළමණාකරුගේ නම | කෘෂිකාර්මික කළමණාකරුගේ කාර්යාලීය ලිපිනය |
|---|---|---|---|
| | කරන්දෙණිය | ජී. ඩී. ගුණරත්න (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම. උරගස්මංහන්දිය. |
| | බද්දේගම | ටී. පී. ජී. ඒ. ද. අල්විස් (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම. - වඳුරඹ. |
| | හබරාදූව | බී. ඩී. ඒ. ද. සිල්වා ගාර්දියවසම් ගුරු පුහුණු සහතිකය (කෘෂිකර්ම විශේෂ) | ගො.සේ.ම. - කොග්ගල |
| | බෙන්තර ඇල්පිටිය | ජේ. කොඩිතුවක්කු (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම. - ඇල්පිටිය. |
| | අම්බලන්ගොඩ | එම්. එල්. කුලතුංග (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම. අම්බලන්ගොඩ. |
| උතුරු මැද පළාත | බටහිර අනුරාධපුරය 1 | ආර්. එස්. ඩී. මහදිවුල්වැව | ගො.සේ.ම. ඇලයාපත්තුව |
| | බටහිර අනුරාධපුරය 2 | එච්. එම්. පී. හේරත් (කෘෂි./ඩිප්ලෝමා) | ගො.සේ.ම. නොච්චියාගම |
| | නැගෙනහිර අනුරාධපුරය | ඩබ්. ධර්මවර්ධන | ගො.සේ.ම., ගොඩගේ මාවත, නවනගරය, අනුරාධපුරය |
| | කැකිරාව | ආර්. එම්. පී. බණ්ඩාරනායක (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම., කැකිරාව |
| | මිහින්තලේ | කේ. බී. රත්නායක (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම., තිරප්පනේ |
| | කලාවැව | එස්. ආර්. බී. පළුගස්වැව (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම., එප්පාවල |
| | හොරොව්පතාන 1 | ඒ. ආර්. එම්. ඒ. රත්නායක (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම. ගලෙන්බිඳුනුවැව |
| | හොරොව්පතාන 2 | ආර්. එම්. එස්. රත්නායක (බී.ඒ.) | ගො.සේ.ම. හොරොව්පතාන |
| | මැදවච්චිය 1 | කේ. එම්. පොඩිඅප්පුහාමි (ප්‍රා. කෘ. පා. සහතිකය) | ගො.සේ.ම., මැදවච්චිය |
| | මැදවච්චිය 2 | ඩී. සුභසිංහ (බී.ඒ.) | ගො.සේ.ම., ඇතාකඩ |

| පළාත් | මැතිවරණ කොට්ඨාශය | කෘෂිකාර්මික කළමණාකරුගේ නම | කෘෂිකාර්මික කළමණාකරුගේ කාර්යාලීය ලිපිනය |
|---|---|---|---|
| | මින්නේරිය 1 | යූ. අප්පුහාමි බී. ඒ, | ගො.සේ.ම., බකමූණ |
| | මින්නේරිය 2 | පී. ඩබ්. තිලකරත්න බණ්ඩා (බී.ඒ.) | ගො.සේ.ම. හිඟුරක්ගොඩ |
| | මැදිරිගිරිය | ඒ. ඩබ්. ආරියරත්න (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම. මැදිරිගිරිය |
| | පොළොන්නරුව 1 | ඩී. බී. වීරසූරියගෙදර (බී.ඒ., ගෞ.) | ගො.සේ.ම. මනම්පිටිය |
| | පොළොන්නරුව 2 | පුරප්පාඩුයි | ගො.සේ.ම., නවනගරය, පොළොන්නරුව |
| වයඹ පළාත | පඩුවස්නුවර | ආර්. එම්. නිමල් බණ්ඩාර | ගො.සේ.ම., තුත්තිරිපිටිගම, හෙට්ටිපොල |
| | දොඩම්ගස්ලන්ද | ආර්. ඩී. ජේ. රාජපක්ෂ (09/04/87 සිට) | ගො.සේ.ම., රම්බඩගල්ල |
| | බිංගිරිය | ඩබ්. ඒ. එන්. විජේසිංහ (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම., දූම්මලසූරිය |
| | යාපහුව | ඊ. එස්. ගුණසේකර (කෘෂි /ඩිප්ලෝමා) | ගො.සේ.ම., මහව |
| | නිකවැරටිය | එස්. ඒ. එල්. සේනානායක (කෘෂි. /ඩිප්ලෝමා) (87/6/30 දක්වා) | ගො.සේ.ම., නිකවැරටිය |
| | මාවතගම | එච්. එල්. ජයසිංහ | ගො.සේ.ම., මාවතගම |
| | දඹදෙණිය | ඒ. වරාගොඩ (බී.ඒ.) | ගො.සේ.ම., නාරම්මල |
| | ගල්ගමුව | ටී. එම්. ජයතිලක (විද්‍යාවේදී රාජ්‍ය මූල්‍ය හා අයබදු) | ගො.සේ.ම., ගල්ගමුව |
| | වාරියපොල | ඩබ්. ඒ. ජේ. කේ. වාසලමුණි (බී.එස්සී.) | ගො.සේ.ම. වාරියපොල |
| | හිරියාල | ඒ. එම්. අබේරත්න (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම., ගනේවත්ත |
| | පොල්ගහවෙල | එස්. ඒ. කුලරත්න | ගො.සේ.ම. පොල්ගහවෙල |
| | කුලියාපිටිය | පී. එම්. ධර්මසේන (බී.ඒ.) | ගො.සේ.ම. කුලියාපිටිය |

| පළාත | මැතිවරණ කොට්ඨාශය | කෘෂිකාර්මික කළමණාකරුගේ නම | කෘෂිකාර්මික කළමණා කරුගේ කාර්යාලීය ලිපිනය |
|---|---|---|---|
| | කටුගම්පොල | සරත් ශ්‍රී රාජවික්‍රම (කෘෂි. /ඩිප්ලෝමා) | ලේකම් කාර්යාල ගොඩනැගිල්ල, පන්නල |
| | කුරුණෑගල | ජී. ආර්. කේ. හේරත් (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම. දකුණු රවුම්පාර, කුරුණෑගල |
| | ආණමඩුව(දකුණ) | කේ. ඒ. ඩී. පීටර් (බී.ඒ.) | ගො.සේ.ම., ආණමඩුව |
| | ආණමඩුව (උතුර) | කේ. ඩී. ජයවීර (බී.ඒ.) | ගො.සේ.ම., පුත්තලම, තබ්බෝව |
| | පුත්තලම | වී. ජී. කිව්. ප්‍රනාන්දු (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම. මදුරන්කුලිය |
| | නාත්තන්ඩිය | පී. ඒ. ප්‍රනාන්දු (බී. එස්. සී. ,කෘෂිකර්මය) | ගො.සේ.ම., තබ්බෝව |
| | වෙන්නප්පුව | ජී. එම්. පියරත්න (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම., හාල්දඩුවන, දංකොටුව |
| | හලාවත | ඩබ්. පී. එස්. වීරසිංහ (බී.ඒ.) | ගො.සේ.ම. මුගුණුවටවන |
| මධ්‍යම පළාත | | | |
| | තෙල්දෙණිය | එම්. විජේතුංග (බී.ඒ.) | ගො.සේ.ම. තෙල්දෙණිය |
| | උඩුදුම්බර | ආර්. එම්. ආර්. රණවීර (බී.ඒ.) | ගම්සභා කාර්යාලය හසලක |
| | හාරිස්පත්තුව | එස්. එම්. එස්. සුලේමාන් (බී.ඒ.) | ගො.සේ.ම., යටිවාවල, කටුගස්තොට |
| | ගම්පොල | ආනන්ද සමරසිංහ (බී.ඒ.) | ගො.සේ.ම., ගම්පොල |
| | පාතදුම්බර | පුරප්පාඩුයි | ගො.සේ ම., වත්තේගම |
| | ගලගෙදර | ඩී. ආර්. කේ. හේනේගම (බී.ඒ.) | ගො.සේ.ම., ගලගෙදර |
| | නාවලපිටිය | ඩබ්. බී. වීරසිංහ (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම., කුරුදුවත්ත, උඩහේන්තැන්න |
| | යටිනුවර | එච්. එම්. ජයවීර බණ්ඩාර (බී.ඒ.) | ගො.සේ.ම., ගිරාගම, පිළිමතලාව |
| | උඩුනුවර | අයි. එම්. ජී. සෙනෙවිරත්න (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම., ඉඹුල්දෙණිය, හන්දෙස්ස |

| පළාත | මැතිවරණ කොට්ඨාශය | කෘෂිකාර්මික කළමණාකරුගේ නම | කෘෂිකාර්මික කළමණාකරුගේ කාර්යාලීය ලිපිනය |
|---|---|---|---|
| මධ්‍යම පළාත | කුණ්ඩසාලේ | ගාමිණී ගුණසේකර (බී.ඒ.) | ගො.සේ.ම., ගුණ්නැපාන |
| | හේවාහැට | එස්. බී. දිසානායක (බී.ඒ.) | ගො.සේ.ම., තලාතුඔය |
| | රත්තොට | ඒ. එම්. විද්‍යාරත්න (බී.ඒ.) | ගො.සේ.ම., වේරගම, කයිකාවල |
| | දඹුල්ල 1 | ඒ. ජී. රංබණ්ඩා (බී.ඒ.) | ගො.සේ.ම., දඹුල්ල |
| | දඹුල්ල 2 | බී. කේ. සෝමසිරි (බී.ඒ.) | ගො.සේ.ම., ගලේවෙල |
| | මාතලේ | සී. බී. යටවර (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම. පලාපත්වල |
| | ලග්ගල 1 | එච්. එම්. ජී. ඒකනායක (බී.ඒ.) | ගො.සේ.ම., අලුගොල්ල, නාඋල |
| | ලග්ගල 2 | එන්. කේ. රත්තින්ද (බී.ඒ.) | ගො.සේ.ම. හෙට්ටිපොල, විල්ගමුව |
| | හඟුරන්කෙත | එන්. බී. ඩබ්. එන්. පොලොන්වල (බී.ඒ.) | ගො.සේ.ම. හඟුරන්කෙත |
| | කොත්මලේ | ඒ. ඩබ්. පියදාස (බී.ඒ.) | ගො.සේ.ම. පූණ්ඩළුඔය |
| | වලපනේ | පී. බී. එම්. රණවීර (බී.ඒ.) | ගො.සේ.ම. මුල්හල්කැලේ, වලපනේ |
| | නුවරඑළිය | ආර්. එම්. පී. මාපා (බී.ඒ.) | ගො.සේ.ම., ලිඳුල |
| | මස්කෙළිය | ජී. කේ. නන්දසේන (බී.ඒ.) | ගො.සේ.ම. ගිනිගත්හේන |
| බටහිර පළාත | | | |
| | දොම්පෙ | ජේ. පී. පෙරේරා (බී.ඒ.) | ගො.සේ.ම., වැකේ, කිරිදිවැල |
| | ගම්පහ | ඩබ්. එල්. පී. ආරියසේන (බී.ඒ.) | ගො.සේ.ම. මුදුන්ගොඩ |
| | කටාන | ඒ. එච්. එස්. විජේරත්න (බී.ඒ.) | ගො.සේ.ම. ආඩිඅම්බලම |

| පළාත | මැතිවරණ කොට්ඨාශය | කෘෂිකාර්මක කළමණාකරුගේ නම | කෘෂිකාර්මික කළමණා කරුගේ කාර්යාලීය ලිපිනය |
|---|---|---|---|
| බටහිර පළාත | කැළණිය | ඩී. ටී. දිසානායක (බී. එස්. සී. කෘෂි.) | ගො.සේ.ම, කැළණිය, මහර, කඩවත |
| | මහර | ආර්. ඒ. ඩී. ඒ. රාමනායක | ගො.සේ.ම., සූරියපාලුව, කඩවත |
| | ජාඇල | ටී. ඩී. එන්. තෝමස් (බී.ඒ.) | ගො.සේ.ම., ජාඇල |
| | අත්තනගල්ල | ටී. ඒ. කරුණාතිලක (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම. වේයන්ගොඩ පාර, නිට්ටඹුව |
| | මීනුවන්ගොඩ | කේ. ඒ. ඒ. කුරුප්පු (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම. මීනුවන්ගොඩ |
| | දිවුලපිටිය | අයි. ඒ. ජී. ආර්. ඉඹුලාන (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම., වල්පිට |
| | මීරිගම | ජී. එම්. එස්. පෙරේරා (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම., මීරිගම |
| | බියගම | කේ. ඩී. වසන්ත කුමාර (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම., දෙල්ගොඩ |
| | වත්තල | පි. එච්. එන්. පෙරේරා (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම., පමුණුගම |
| | මතුගම | සී. ඩබ්. විජේගුණවර්ධන (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම., මතුගම |
| | බණ්ඩාරගම | ටී. ඒ. පෙරේරා (බී.ඒ.) | ගො.සේ.ම. බණ්ඩාරගම |
| | හොරණ | ඩී. බී. අබේසිංහ (බී.ඒ.) | ගො.සේ.ම., හොරණ |
| | බුලත්සිංහල | එම්. කේ. වික්‍රමරත්න (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම. බුලත්සිංහල |
| | අගලවත්ත | ඩී. .ඩී දයාරත්න (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම., අගලවත්ත |
| | කළුතර | ජී. ගාල්ලගේ (87/12/01 සිට) | ගො.සේ.ම., නාගොඩ, කළුතර |
| | බේරුවල | එම්. එල්. වීරකෝන් | ගො.සේ.ම., නාගොඩ, කළුතර |

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය



| පළාත | මැතිවරණ කොට්ඨාශය | කෘෂිකාර්මික කළමණාකරුගේ නම | කෘෂිකාර්මික කළමණා කරුගේ කාර්යාලීය ලිපිනය |
|---|---|---|---|
| බටහිර පළාත | හෝමාගම | ටී. ඒ. කේ. රණවීර (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම., හෝමාගම |
| | අවිස්සාවෙල්ල | එම්. ඩී. සී. වී .ගුණතිලක (බී. එස්. සී. කෘෂිකර්ම) | ගො.සේ.ම., කොස්ගම |
| | කඩුවෙල | එල්. ඩී. එන්. ජයසේකර (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම., මාලඹේ |
| | මහරගම | ගුණපාල මහානාම (බී.ඒ., විශේෂවේදී ජනසංනිවේදන) | ගො.සේ.ම. උඩහමුල්ල |
| | කැස්බෑව | ආර්. ඒ. එස්. ජයවර්ධන (සං /අධ්‍යයනවේදී විශේෂ උපාධිය) | ගො.සේ.ම. බෝකුන්දර |
| උතුරු පළාත | | | |
| | මුලතිව් 1 | එන්. සෙල්වරාජා (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම. මුල්ලියවලෙයි, මුලතිව් |
| | මුලතිව් 11 | වී. ශ්‍රීස්කන්දරාජා (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම. පන්ඩියකුලම්, වව්නිකුලම් |
| | කිලිනොච්චි 1 | එස්. සිවගුරුනාදන් (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම., උරුත්‍රපුරම් |
| | කිලිනොච්චි 11 | කේ. අරසකුලසිංහම් (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම. පුලියම්පොකනෙ |
| | මන්නාරම 1 | පී. ක්‍රිසෝස්ටම් (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම., මන්තායි, තිරුකේස්වරම් |
| | මන්නාරම 11 | එම්. ශාන්තම්පිල්ලේ (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම. මුරුන්කන් |
| | වව්නියාව 1 | පී. කුගදාසන් (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම. පොම්පයිමඩු |
| | වව්නියාව 11 | කේ. ගනේෂරත්නම් (බී.එස්.සී., 86/10/30 දක්වා) | ගො.සේ.ම., ඕමන්තයි, වව්නියා |
| | වව්නියාව 111 | එස්. රාජරත්න (බී.ඒ. විශේෂ) | ගො.සේ.ම., මඩුකන්ද |
| සබරගමුව පළාත | | | |
| | නිවිතිගල | කේ. එම්. ජේ. බණ්ඩාර (සංවර්ධන අධ්‍යයනවේදී, වි. උපාධිය) | ගො.සේ.ම., නිවිතිගල |

| පළාත | මැතිවරණ කොට්ඨාශය | කෘෂිකාර්මික කළමණාකරුගේ නම | කෘෂිකාර්මික කළමණාකරුගේ කාර්යාලීය ලිපිනය |
|---|---|---|---|
| සබරගමුව පළාත | රක්වාන | ආර්. ජී. පුංචිමහත්තයා (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම. ගොඩකවෙල |
| | බලංගොඩ | ඊ. ඩබ්. අබේරත්න (බී.ඒ.) | ගො.සේ.ම., බුලත්ගම, බලංගොඩ |
| | කලවාන | ඒ. ජී. කේ. දව්ගලගම (බී.ඒ.) | කෘෂි. සං. අධිකාරිය කලවාන |
| | කොළොන්න | ඒ. පී. ජයසූරිය (බී.ඒ., ගෞරව) | ගො.සේ.ම. ඇඹිලිපිටිය |
| | රත්නපුරය | එම්. පී. විජේපාල (බී.ඒ.) | ගො.සේ.ම., කුරුවිට |
| | පැල්මඩුල්ල | එන්. එස්. ගුණවර්ධන ම/මී (බී.එස්.සී.) | ගො.සේ.ම. පැල්මඩුල්ල |
| | ඇහැලියගොඩ | අයි. ඩී. ජයසිංහ (බී.ඒ.) | ගො.සේ.ම. ඇහැලියගොඩ |
| | කෑගල්ල | ඩබ්. ජී. විමලරත්න | ගො.සේ.ම., පරගම්මන |
| | යටියන්තොට | ඒ. ආර්. එම්. එස්. එම්. බී. රණසිංහ (කෘෂි. ඩිප්ලෝමා) | ගො.සේ.ම. යටියන්තොට |
| | අරනායක | කේ. වීරසිංහ | ගො.සේ.ම., උස්සාපිටිය, අරනායක |
| | දැදිගම | එච්. එම්. ජී. එන්. කේ. කලුහැන්දිවල (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම. අඹේපුස්ස, වරකාපොල |
| | රුවන්වැල්ල | බී. ඒ. කේ. පී. ගුණසිංහ (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම. රුවන්වැල්ල |
| | රඹුක්කන | එස්. ඩී. මාරසිංහ (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම., රඹුක්කන |
| | දැරණියගල | ඊ. ඒ. සමරජීව (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම., පනාවල, ඇහැලියගොඩ |
| | මාවනැල්ල | ආර්. එම්. එස්. නොයෙල් (බී.එස්.සී., ගෞරව) | ගො.සේ.ම., බැමිනිවත්ත |
| | ගලිගමුව | එස්. එම්. ජේ. බී. සේනානායක (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම. යටටෝගොඩ |

| පළාත | මැතිවරණ කොට්ඨාශය | කෘෂිකාර්මික කළමණාකරුගේ නම | කෘෂිකාර්මික කළමණාකරුගේ කාර්යාලීය ලිපිනය |
|---|---|---|---|
| නැගෙනහිර පළාත | | | |
| | පොතුවිල් 1 | එම්. අයි. අහමඩ් ලෙබ්බෙ (කෘෂි. /ඩිප්ලෝමා) | උපදිසාපති කාර්යාලය, අඩාලච්චේනයි |
| | පොතුවිල් 11 | එස්. සුන්දරම්පිල්ලේ (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම., තම්බිලුවිල් |
| | සමන්තුරේ | අයි. ඒ. ජබාර් (කෘෂි. /ඩිප්ලෝමා) | ''යස්මින්'', සමන්තුරේ |
| | අම්පාර 1 | කේ. ජී. එස්. විජේසිරි (බී.ඒ. විශේෂ) | ගො.සේ.ම., උහන |
| | අම්පාර 11 | ඩී. ආර්. ගුණවර්ධන | ගො.සේ.ම., මහඔය |
| | කල්කුඩා 1 | පී. ගුණපාලසිංහම් | ගො.සේ.ම., වෙන්කලාඩි |
| | කල්කුඩා 11 | එන්. තුෂයන්දන් (බී.එස්.සී.- කෘෂිකර්ම) | ගො.සේ.ම. වාලච්චෙනෙයි |
| | ත්‍රිකුණාමලය | පුරප්පාඩුයි | ගො.සේ.ම., උප්පුවෙලි |
| | සේරුවිල 1 | පී. ඊ. රාජකරුණා (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම., කන්තලේ |
| | සේරුවිල 11 | පුරප්පාඩුයි | ගො.සේ.ම., පන්කුලම් |
| | පදිරිප්පු | ආර්. තේවේන්දිරරාජා (බී.එස්.සී.) | ගො.සේ.ම. කලුවන්චිකුඩි |
| | මුතූර් | ඒ. බී. ලදරුසේන (ප්‍ර.කෘ.පා.ස.) | ගො.සේ.ම. මොල්ලිපතාන |
| | මඩකලපුව | වී. කනගරත්නම් (කෘෂි./ඩිප්ලෝමා, 30/11/87 දක්වා | ගො.සේ.ම., කල්ලඩි |
| ඌව පළාත | | | |
| | වැලිමඩ | එම්. බී. එම්. ආර්. බණ්ඩාර (බී.ඒ.) | ගො.සේ.ම. කැප්පෙටිපොල |
| | බණ්ඩාරවෙල | එස්. එම්. ගුණවර්ධන (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම., විශාඛා මාවත, බණ්ඩාරවෙල |
| | හපුතලේ 1 | කේ. බී. එම්. සෙනෙවිරත්න (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම., නිකපොත |
| | හපුතලේ 11 | ආර්. එම්. එස්. රත්නායක (බී.ඒ.) | ගො.සේ.ම., දියතලාව |

| පළාත | මැතිවරණ කොට්ඨාශය | කෘෂි කාර්මික කළමණාකරුගේ නම | කෘෂි කාර්මික කළමණාකරුගේ කාර්යාලීය ලිපිනය |
|---|---|---|---|
| ඌව පළාත | වියලුව | වයි. එම්. මුතුබණ්ඩා යාපා (බී.ඒ.) | පා. ම. කාර්යාලය බාරේ, රිදීපාන, බදුල්ල |
| | ඌව පරණගම | ඩී. ඩබ්. එම්. ජයසේන (බී.ඒ.) | ගො.සේ.ම., යටිපලාත, අඹගස්දෝව |
| | මහියංගනය 1 | ටී. එම්. ආරියවංශ (බී.ඒ.) | ගො.සේ.ම. මහියංගනය |
| | මහියංගනය 11 | ටී. එම්. යූ. එල්. ඒකනායක (බී.ඒ.) | ගො.සේ.ම. රිදීමාලියද්ද |
| | බදුල්ල | ඩබ්. රංජන් ඩයස් (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම., රඹුක්පොත, බදුල්ල |
| | පස්සර | ඩබ්. එම්. උභයරත්න (බී.ඒ.) | ගො.සේ.ම., පස්සර |
| | හාලිඇල | කේ. ඒ. ප්‍රේමසිරි (බී.එස්.සී.) | ගො.සේ.ම., හාලිඇල |
| | වැල්ලවාය 1 | එල්. ආර්. එම්. ජී. කදුරුගමුව | ගො.සේ.ම., වැල්ලවාය |
| | වැල්ලවාය 11 | ඩබ්. හඳපාන්ගල (බී.ඒ., 87/09/30 දක්වා) | ගො.සේ.ම. තණමල්විල |
| | බිබිල 1 | ආර්. එම්. බලවර්ධන (බී.ඒ.) | ගො.සේ.ම., මැදගම, බිබිල |
| | බිබිල 11 | ඒ. එම්. ගුණවර්ධන බණ්ඩා (සංවර්ධන අධ්‍යයනවේදී විශේෂ උපාධිය) | ගො.සේ.ම., බිබිල |
| | මොණරාගල 1 | එච්. එම්. සමරකෝන් බණ්ඩා (බී.එස්.සී.) | ගො.සේ.ම. බඩල්කුඹුර |
| | මොණරාගල 11 | ඩබ්. එස්. පෙරේරා (කෘෂි. /ඩිප්ලෝමා) | ගො.සේ.ම., මොණරාගල |

| තනතුර | සේවක සංඛ්‍යාව | පත්කල සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| පළාත් අධ්‍යක්ෂවරු | 09 | 09 | නැත |
| අධ්‍යක්ෂ — කෘෂිකාර්මික යෙදවුම් | 01 | 01 | නැත |
| අධ්‍යක්ෂ — පුහුණු සහ ප්‍රචාරක | 01 | 01 | නැත |
| අධ්‍යක්ෂ — අලෙවි | 01 | 01 | නැත |
| අධ්‍යක්ෂ — පරිපාලන | 01 | 01 | නැත |
| අධ්‍යක්ෂ — ව්‍යාපෘති ඇගයීම් | 01 | 01 | නැත |
| ප්‍රධාන ගණකාධිකාරී | 01 | 01 | නැත |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ — පරිපාලන | 01 | 01 | නැත |
| නියෝජ්‍ය පළාත් භාර අධ්‍යක්ෂ | 20 | 20 | නැත |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ යෙදවුම් — බීජ හා රෝපන ද්‍රව්‍ය | 01 | 01 | නැත |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ යෙදවුම් — පොහොර හා කෘෂි රසායන ද්‍රව්‍ය | 01 | — | 01 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ යෙදවුම් — කෘෂිකාර්මික ණය සහ රක්ෂණ | 01 | 01 | නැත |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ යෙදවුම් — කෘෂිකාර්මික උපකරණ හා ගොවිපල බලය | 01 | 01 | නැත |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ යෙදවුම් — සත්ව පාලනය | 01 | 01 | නැත |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ යෙදවුම් — වාරිමාර්ග | 01 | 01 | නැත |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ අලෙවි — මිළ හා සංඛ්‍යාලේඛණ | 01 | 01 | නැත |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ අලෙවි — ගබඩා හා ගුදම් | 01 | 01 | නැත |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ අලෙවි — ප්‍රවාහන හා සංනිවේදන | 01 | — | 01 |
| සහකාර අධ්‍යක්ෂ — ප්‍රවාහන | 01 | 01 | නැත |
| සහකාර අධ්‍යක්ෂ — පරිපාලන | 01 | 01 | නැත |
| සංඛ්‍යා ලේඛණ නිලධාරී | 01 | 01 | නැත |
| පරිගනක විශ්ලේෂක — වැඩ සටහන් සම්පාදක | 01 | 01 | නැත |
| සභාපතිතුමාගේ පෞද්ගලික ලේකම් | 03 | 02 | 01 |
| කෘෂිකාර්මික කළමණාකරුවන් | 157 | 147 | 10 |
| පොත් තබන්නා | 02 | 02 | නැත |
| පරිවර්තක | 01 | 01 | නැත |
| ලිපිකරු — ප්‍රධාන කාර්යාලය (දෙවන හා තුන්වන ශ්‍රේණිය) | 12 | 12 | නැත |
| ලිපිකරුවන් — මැතිවරණ කොට්ඨාශ කාර්යාල | 157 | 148 | 08 |
| ලිපිකරුවන් — නියෝජ්‍ය පළාත් අධ්‍යක්ෂ කාර්යාල | 20 | 19 | 01 |
| ලඝු ලේඛක — (සිංහල හා ඉංග්‍රීසි) | | | |
| ලේකම් ශ්‍රේණිය | | 02 | |
| ඉහළ ශ්‍රේණිය | 28 | 12 | |
| පහළ ශ්‍රේණිය | | 13 | 01 |
| යතුරු ලේඛක | 02 | 02 | නැත |
| පිළිගැනීමේ නිලධාරිනී/දුරකථන ක්‍රියාකරවන්නී | 01 | 01 | නැත |
| රියදුරු — ප්‍රධාන කාර්යාලය | 22 | 21 | 01 |
| රියදුරු — මැතිවරණ කොට්ඨාශ කාර්යාල | 157 | 136 | 21 |
| රියදුරු — නියෝජ්‍ය පළාත් අධ්‍යක්ෂ කාර්යාල | 20 | 17 | 03 |
| කාර්යාල කාර්ය සහායක — දෙවන ශ්‍රේණිය | 12 | 09 | 03 |
| සහකාර ආරක්ෂක නියාමක | 01 | 01 | නැත |
| කම්කරු | 01 | — | 01 |
| එකතුව | 645 | 593 | 52 |

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## සභාපතිතුමාගේ සමාලෝචනය — 1987

වර්ෂ 1978 ජනවාරි මස 10 වැනි දින පිහිටුවන ලද මෙම අධිකාරිය ජාතිය වෙනුවෙන් දස වසක සේවයක් සම්පූර්ණ කර තිබේ. මෙම කාල සීමාව තුළ එය වසරක් වසරක් පාසා තම ක්‍රියාකාරීත්වය ක්‍රමයෙන් ව්‍යාප්ත කරන ලද අතර, දැන් එය යාපනේ අර්ධද්වීපය හැර දිවයිනේ සියලුම කෘෂිකාර්මික මැතිවරණ කොට්ඨාශ තුළ ව්‍යාප්තව පවතී. ජාතිවාදී කෝලාහල හේතුකොට ගෙන, 1983 ජූලි මාසයෙන් පසු සම්බන්ධීකරණ වැඩ කටයුතු අඩපන වූ ,විශේෂයෙන්ම උතුරු පළාතත්, නැගෙනහිර පළාතත් හැර දිවයිනේ සෙසු සියලුම ප්‍රදේශවල ආහාර බෝග අංශයේ මෙන්ම සත්ව පාලන අංශයේද, කෘෂිකාර්මික නිෂ්පාදන අතින් නියත ප්‍රතිඵල ලබා ඇති බවට මම සෑහීමට පත් වී සිටිමි. 1986 සහ 1987 යන වර්ෂවල දිවයින පුරා පැවති දැඩි නියඟය කෘෂිකාර්මික නිෂ්පාදන කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කළ තවත් සාධකයක් වූ අතර, එම නියං තත්වයෙන් වඩාත්ම හානිකර බලපෑම් ඇති වූයේ වැඩි නිෂ්පාදන ප්‍රමාණයන් ලබා දෙන කුරුණෑගල, හම්බන්තොට, උතුරු මැද පළාත සහ උතුරු පළාත යන ප්‍රදේශවලය. කන්තලේ වැව් බැම්ම බිඳීයාම හේතුකොට ගෙන ත්‍රිකුණාමලේ තත්ත්වය වඩාත් බරපතල විය. වැවේ බැම්ම අළුත් වැඩියා කිරීමේ වැඩ කටයුතු 1987 අවසාන භාගයේදී නිම කරන ලද නමුදු වැවෙන් පහළ ඇළ මාර්ග ආදියේ අළුත් වැඩියා කිරීමේ වැඩ කටයුතු තවදුරටත් කළ යුතුව තිබේ.

### කාලගුණය හා වාරිමාර්ග

දිගුකල් පවත්නා නියං කාල පරිච්ඡේද නොහොත් අධික වර්ෂාපතනය අවුරුදු දහයෙන් දහයට පමණ සිදුවන බව අත්දැකීම් මගින් පෙනී ගොස් තිබේ. එවැනි චක්‍රාකාර සිදුවීම කදී මහ කන්නයේ අස්වැන්න මෙන්ම යල කන්නයේ අස්වැන්න ද අසාර්ථක වුවහොත්, එවැනි තත්ත්වයක් නිසා, විශේෂයෙන්ම වියළි කලාපයේ ගොවීන් බොහෝමයක් ඉතා අසරණ තත්ත්වයකට පත්වීමට ඉඩ තිබේ. රජය විසින් මෙම තත්ත්වය අවබෝධ කරගෙන, එයින් ඇතිවන අහිතකර බලපෑම් හැකිතරම් අඩුකරලීම සඳහා සුදුසු පියවර ගැනීමට දැන් කාලය පැමිණ ඇත. වියළි කලාපයට අයත් දිස්ත්‍රික්කවල ඇති ජලය ප්‍රමාණය වැඩි කිරීම, ප්‍රමුඛතාව ලැබිය යුතු කාර්යයක් වශයෙන් සැලකිල්ලට භාජනය කළ යුතුයි.

වර්ෂ 1987 දී කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇතිවූ ඛෙදජනක තත්ක්වය කැපී පෙනෙන නිදසුනක් වශයෙන් දැක්විය හැක. මේ ආකාරයෙන්ම, මහවැළි ගඟට සහ එහි අතු ගංගාවලට ජලය සපයා දෙන ප්‍රදේශ තුළ වර්ෂා පතනය නොමැතිවීම හේතුකොටගෙන මහවැලි ජලමාර්ග පද්ධතිය ඔස්සේ බෙදා හැරීම සඳහා ප්‍රමාණවත් ජලය නොමැතිවීම නිසා උතුරු මැද පළාතේද මෙවැනිම ජල හිඟයක් ඇති විය. උතුරු පළාතේ වැව්, ජලයෙන් පිරීයෑම වැලැක්වීම ට හේතු වූයේ ඊසාන දිග මෝසම් වැසි අසාර්ථකවීමයි. මෙවැනි තත්ත්වයන් යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයට අතිරේක ජලය සැපයීම අත්‍යාවශ්‍ය කාර්යයක් වන්නේය. උතුරු හා උතුරු මැද පළාත්වල මොරගහකන්ද යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම ප්‍රමුඛතාව ලැබිය යුතු කාර්යයක් වන්නේය. උතුරු හා උතුරු මැද පළාත්වල කැනූ ළිං සඳහා සහනාධාර සහිත ණය යෝජනා ක්‍රමයක් සලසා දීම සඳහා වූ යෝජනාවක් ගැන මගේ පසුගිය වාර්තාවෙහි සඳහන් කළෙමි. මෙම යෝජනා ක්‍රමයට මොණරාගල හා වැල්ලවාය යන දිස්ත්‍රික්කද ඇතුලත් කළ යුතුය යන කොන්දේසියට යටත් කර කැබිනට් මණ්ඩලය විසින් මෙම යෝජනාව අනුමත කරනු ලැබූ නමුදු, 1987 දී මේ සම්බන්ධයෙන් කිසිදු ප්‍රගතියක් ලබා නැත. 1988 දී ප්‍රයෝජනයට ගැනීම සඳහා කෘෂිකාර්මික සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශය විසින් රුපියල් මිලියන තුනක් වෙන් කර දී තිබේ.

එය එසේ වුවද, ආසියානු සංවර්ධන බැංකුවේ ශ්‍රී ලංකා ග්‍රාමීය ණය ව්‍යාපෘතිය යටතේ ,පොළොන්නරුව, පුත්තලම, ත්‍රිකුණාමලය සහ මඩකලපුව යන දිස්ත්‍රික්ක තුළ කැනූ ළිං ඉදිකිරීම සඳහා 1987 අවසානය දක්වා ණය මුදල් 94 ක් අනුමත කරන ලදී. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ස්වයං රැකියා වැඩ සටහනේ ණය යෝජනා ක්‍රමය යටතේ 1987 අවසානය දක්වා අනුමත කර ඇති මුළු ණය සංඛ්‍යාව 63 කි. අනුරාධපුර වියළි කලාපීය ව්‍යාපෘතිය යටතේ වර්ෂය අවසානය දක්වා අනුමත කර ඇත්තේ ණය මුදල් 7 ක් පමණි.

මහ පරිමාණයේ සහ සුළු පරිමාණයේ වාරිමාර්ග වැඩ සඳහා වැය කරන ලද මුළු මුදල 1977 දී රුපියල් මිලියන 102.6 සිට 1986 දී රුපියල් මිලියන 824.6 දක්වා වූ වාර්ෂික වැඩිවීමක් පෙන්නුම් කළේය. විමධ්‍යගත අයවැය යටතේ මුදල් යෙදවූ ව්‍යාපෘති සහ ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන ව්‍යාපෘති යටතේ කරන ලද වැඩ හැර, 1987 සඳහා ඇස්තමේන්තු කරන ලද වැඩ රුපියල් මිලියන 1012.4 ක් විය. පසුගිය අවුරුදු 10 ඇතුළත කරන ලද වාරිමාර්ග පුනරුත්ථාපනය කිරීමේ වැඩ කටයුතු සඳහා රජයට සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් වැය කිරීමට සිදු විය.

එබැවින් මෙම පුනරුත්ථාපන වැඩ සටහන ඉදිරි කාලයේදී විධිමත් ලෙස පවත්වාගෙන යෑම අත්‍යාවශ්‍ය වන්නේය. 1988 සිට පළාත් සභා ක්‍රියාත්මකවීම ආරම්භ වීමත් සමග ඒ ඒ පළාත්වල වාරිමාර්ග යෝජනා ක්‍රම නඩත්තු කිරීම සඳහා ප්‍රමාණවත් මුදල් එම පළාත් සභා මගින් ලබා දිය හැකිවන අතර එමගින් එම මුදල් ලබා දිය යුතුද වන්නේය. තවද, වැඩකටයුතු උසස් මට්ටමකින් නිම කිරීම සහතික කිරීම සඳහා එමගින් වඩා හොඳ අධීක්ෂණයක් කළ හැකිද වේ.

### ආහාර නිෂ්පාදනය

ඉහත සඳහන් කරුණු හේතුකොටගෙන ආහාර බෝග අංශයේ වැඩ කටයුතු අපේක්ෂා කළ තරම් සාර්ථක නොවිය. වී නිෂ්පාදනය 1986/1987 මහ කන්නයේදී බුසල් මිලියන 66.7 ක් හා 1987 යල කන්නයේදී බුසල් මිලියන 34.3 ක් විය. ඒ අනුව නිපදවන මුළු වී ප්‍රමාණය බුසල් මිලියන 101 ක් වූ අතර 1987 දී ආනයනය කරන ලද සහල් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 102,416 ක් විය.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

**සභාපතිතුමාගේ සමාලෝචනය — 1987**

කුඹුරු ගොවියන් සඳහා රජය විසින් දැනටමත් සලසා ඇති පහසුකම් සම්බන්ධයෙන් පසුගිය වර්ෂය සඳහා වූ මගේ සමාලෝචනයෙහි කරුණු සඳහන් කළෙමි. වී සඳහා දැනට ගෙවනු ලබන සහතික මිළ බුසලකට රුපියල් 70 කි. ගොවියාගේ නිෂ්පාදන මිළ ගණන් කෙරෙහි බලපාන බාහිර හේතූන් නිසා මෙවැනි මිළ මට්ටමක් අනියත වශයෙන් පවත්වා ගෙන යාමට නුපුළුවන. ප්‍රධාන වශයෙන් මුදල් සම කිරීමේ ගණන් වැඩිවීම හේතුකොට ගෙන පොහොර, කෘෂි රසායන සහ ගොවිපල උපකරණ වල මිළ ඉහළ යෑම නිසා, පසුගිය අවුරුදු කීපය තුළ යෙදවුම්වල මිළ සීඝ්‍රයෙන් වැඩි වී තිබේ. යථාර්ථයට අනුකූලවීමට නම් රජය විසින් යෙදවුම් වල මිළ ගණන් සොයා බලා වී සඳහා දැන් ගෙවනු ලබන සහතික මිළ සංශෝධනය කළ යුතුවේ. ගොවියන් සඳහා මෙතෙක් සලසා දී ඇති දිරි ගැන්වීම් අනුව, නිෂ්පාදනය වැඩි කරන ලෙස කරන ලද ඉල්ලීම කෙරෙහි ඔවුහු ප්‍රතිචාරී වී ඇති බව අමතක නොකළ යුතුයි. තවදුරටත් නිෂ්පාදනය වැඩි කිරීම සඳහා ගොවීන් නොකඩවා දිරි ගැන්වීම් සහතික කරනු පිණිස, කලින් සිදු කරන ලද පරිදි සහතික මිළ ගනන් වරින් වර සංශෝධනය කිරීමේ ඇති වැදගත්කම අවධාරණය කළ යුතුවේ. මෙම අංශය කෙරෙහි අවධානය යොමු කළහොත්, ශ්‍රී ලංකාවට අවශ්‍ය සම්පූර්ණ වී ප්‍රමාණය මෙරට ගොවියන් විසින් තව දුරටත් නිෂ්පාදනය කරනු ඇතැයි යනු මගේ විශ්වාසයයි.

අතිරේක ආහාර බෝග නිෂ්පාදනය වැඩි කිරීමේ ඇති අවශ්‍යතාව නැවත නැවතත් සඳහන් කිරීමට කැමැත්තෙමි. ගොවියන් විසින් මෙම බෝග නිෂ්පාදනය කිරීමට නම්, සහනාධාර යෝජනා ක්‍රමය යටතේ වියළි කලාපයට අයත් ප්‍රදේශ තුළ 'කනින ලද ලිං' ක්‍රියාත්මක කිරීම අවශ්‍ය දිරිගැන්වීමක් වන්නේය. එවැනි ප්‍රදේශවල ලිං ඉදිකිරීමේ වැඩ පිළිවෙල ක්‍රියාත්මක කරනු ලැබූ විට, දැනට සැලසී ඇති වාරිමාර්ග ක්‍රම මගින් ජලය සපයා ගැනීමට නොහැකි වියළි කලාපයේ උස්බිම් ප්‍රදේශවල අතිරේක ආහාර බෝග වගා කිරීමට ගොවියන්ට හැකිවනු පිණිස, මෙම යෝජනා ක්‍රමය ව්‍යාප්ත කිරීමට මෙම අධිකාරිය දරන ප්‍රයත්නය තවදුරටත් පවත්වාගෙන යනවා ඇත.

ධාන්‍ය හා මාංශ බෝග ඇතුළත් කරමින් අප රටේ ආහාර පිළිබඳ විවිධත්වය වැඩි කිරීමට අමතර වශයෙන්, පශු සම්පත් සංවර්ධනය කිරීමද වැදගත් වන බව අමතක නොකළ යුතු අතර, එහි සාර්ථකත්වය, සත්ව ආහාර නිෂ්පාදනය සඳහා යොදාගනු ලබන සෝයා ,බඩ ඉරිඟු, තල, ආදිය පහසුවෙන් ලබාගත හැකිවීම මත රඳා පවතී. අවශ්‍ය බෝග වර්ග නිෂ්පාදනය කිරීම සඳහා ගොවියන්ට කරුණු අවබෝධකර දීමට මෙම අධිකාරියට පුළුවන. එහෙත් බඩ ඉරිඟු වගා කළ ගොවියන්ට සිදුවූ පරිදි, තම අලෙවිකල නොහැකි නිෂ්පාදන තමන් ලඟ රැස්කර තබා ගැනීමට ගොවියන්ට සිදු නොවන සේ තම නිෂ්පාදන සාධාරණ මිළකට අලෙවි කර ගැනීමේ හැකියාව සහතික වන අයුරින් රජය විසින් නිසි පියවර ගත යුතුයි. ගොවියන් විසින් මෙම බෝග වර්ග සෑහෙන ප්‍රමාණ වලින් නිෂ්පාදනය කිරීමෙන් පසු, ඒ නිසා ඒ හා සමාන බෝග වර්ග ආනයනය කිරීම තහනම් කිරීමට සිදුවිය හැකි වුවත්, ගොවියන් විසින් නිෂ්පාදනය කරනලද බෝග මිළට ගත යුතුයි. අපගේ ගොවියන් මෙන්ම කෘෂි කර්මාන්තද ආරක්ෂා කර ගැනීමට නම්, සීමා පැනවිය යුතු කාලය ඉක්මනින්ම පැමිණෙනවා ඇත.

1987 වර්ෂය තුළ නිෂ්පාදනය කරන ලද අතිරේක ආහාර බෝග පිළිබඳ තාවකාලික සංඛ්‍යා පහත දැක්වේ.

| | ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් | නිෂ්පාදනය මැට්‍රික් ටොන් |
|---|---|---|
| කව්පි | 30,224 | 22,931 |
| සෝයා බෝංචි | 6,737 | 6,770 |
| මුං ඇට | 36,480 | 24,183 |
| උඳු | 13,879 | 11,487 |
| බඩ ඉරිඟු | 40,597 | 44,703 |

කාලගුණ තත්ත්වයේ වෙනස්වීම්වලට යටත්ව, පසුගිය දසකය තුළ පහත රට මෙන්ම, උඩරට එළවළු වගා කටයුතු අපනයන සඳහාද තරමක් ඉඩකඩ සලසමින්, දේශීය පාරිභෝගිකයාගේ අවශ්‍යතා සපුරාලීම ක්‍රමයෙන් වර්ධනය වී තිබේ. මෙම අංශයේද කෘෂිකාර්මික යෙදවුම් සඳහා වූ වියදමේ වැඩිවීමක් පෙනෙන්නට තිබුනි. එළවළු වගා කරන ගොවියෝද අපනයනය සඳහා ඉල්ලුමක් ඇති විදේශීය එළවළු වර්ග සමහරක් වගා කරමින් මෙම අංශයේ නව නැම්මක් අනුගමනය කරති.

**රුක් වගා**

කුඩා රබර් වතු හිමියන්ගේ රබර් සකස් කිරීමේ වැඩ පිළිවෙලක් 1987 දී රජයේ රබර් කර්මාන්තශාලා මගින් ක්‍රියාත්මක කරනු ලැබූ අතර එය වර්ෂයේ මැද භාගය දක්වා මනාව ක්‍රියාත්මක විය. 1987 මැද භාගයේදී ක්‍රේප් රබර් මිළ ෂීට් රබර් මිළට වඩා අඩුවූ විට ෂීට් රබර් නිෂ්පාදනය කිරීම කුඩා රබර් වතු හිමියන්ට වඩා ලාභදායක විය. ක්‍රේප් රබර් මිළ වැඩිවී මිළ ගණන් පිළිබඳ මෙම තත්ත්වය වෙනස් වූ වහාම, තම රබර් කිරි රජය සතු කර්මාන්ත ශාලා මගින් ක්‍රේප් රබර් බවට හරවා ගැනීමට නිදහස තිබේ. කුඩා රබර් ඉඩම් හිමියන්ට අවශ්‍ය, රෝපන ද්‍රව්‍ය හා පොහොර වැනි යෙදවුම් රබර් උප දේශක සේවය මගින් සපයා දෙනු ලැබේ. කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය, රජය සතු තේ කර්මාන්ත ශාලාවලද සහභාගිත්වය ඇතිව, පෞද්ගලික අංශය සමග තරඟකාරී ලෙස, තේ දළු එක්රැස් කිරීම, රෝපන ද්‍රව්‍ය, පොහොර ආදිය සැපයීම ඇතුළු සේවාවක් සලසා දී තිබේ. මෙම යෝජනා ක්‍රමය ආරම්භ කිරීමෙන් පසු කුඩා තේ වතු හිමියන්ගෙන් 30% ට ආසන්න සංඛ්‍යාවක් තම තේ දළු රජයේ තේ කර්මාන්ත ශාලාවලට සපයන අතර මෙය තවදුරටත් වැඩිවීමේ ලකුණු පෙනෙන්ට තිබේ.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## සභාපතිතුමාගේ සමාලෝචනය — 1987

1986 වර්ෂය සඳහා වූ මගේ පසුගිය සමාලෝචනයෙහි සඳහන් කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්තිය සඳහා වූ ශ්‍රී ලංකා මණ්ඩලය, ලෝක බැංකුවේ සහාය ඇතිව, පාර්ලිමේන්තු පනතක් මගින් 1987 දී පිහිටුවනු ලැබූ බැව් සතුටින් සඳහන් කරමි. මෙම මණ්ඩලය විසින් ආහාර බෝගවලට අමතරව, තේ, රබර්, පොල් සහ උක් සඳහා දැනට පිහිටුවා ඇති පර්යේෂණ ආයතනද අධීක්ෂණය කරනවා ඇත.

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශය සංවර්ධනය කිරීමෙහිලා මෙම මණ්ඩලය විසින් වැදගත් වූ එමෙන්ම වගකිවයුතු මෙහෙයක් ඉටුකළ යුතුවේ. ලබාගත හැකි ඉඩම් ප්‍රමාණය අඩුවෙමින් පවතින අතර, ජනගහනය වර්ධනය වෙමින් පවත්නා අප රටේ, එන්ට එන්ටම වැඩිවන ආහාර අවශ්‍යතා සපුරාලීම පිණිස මෙම මණ්ඩලය විසින් වඩා දියුණු කළ බෝග වර්ග සොයා බලා, එමගින් අස්වැන්න වැඩිකළ යුතුවා පමණක් නොව, අපනයන කිරීමේ හැකියාවක් පළතුරු, ධාන්‍ය හා එළවළු වර්ගද අළුතෙන් වගා කිරීමට කටයුතු සැලැස්විය යුතුවේ. මෙම මණ්ඩලය, කැපවීමකින් යුක්තව සේවය කරන සුදුසුකම්ලත් පුද්ගලයන් විසින් තවදුරටත් පාලනය කරනු, ඇතැයි මම අපේක්ෂා කරමි.

### උක් වගා කිරීම

දැනට නිෂ්පාදන කටයුතු ආරම්භ කර ඇති සීමා සහිත පැල්වත්ත සීනි සමාගමට දැනට නිපදවනු ලබන උක් ප්‍රමාණයට වඩා වැඩි උක් ප්‍රමාණයක් සකස් කිරීමේ ධාරිතාවයක් තිබේ. මෙම සමාගම විසින් පදිංචි කරුවන් ට ඉඩම් ලබාදී නිවාස හා යෙදවුම් සපයා දී ඇති අතර, 'බාහිර වගාකරුවන්' වශයෙන් උක් වගා කරන ලෙස ඒ අවට ඉඩම් හිමියන් උනන්දු කරවා, ආධාර කරමින් ඔවුන් විසින් වගා කරනු ලබන උක් සහතික මිළට මිළදී ගනු ලැබේ. මෙම අධිකාරිය පහත සඳහන් පහසුකම් සලසා දීමෙන්, බාහිර වගාකරුවන්ගේ යෝජණා ක්‍රමය යටතේ පැල්වත්ත සීනි සමාගමට සහාය විය.

1. පැල්වත්ත සීනි සමාගම විසින් බීජ උක්, පොහොර, තාක්ෂණික දැනුම ආදිය ලබාදීමෙන් බාහිර වගාකරුවන් ට සහාය වන අතර, බාහිර වගා කරුවන් විසින් ඒ සඳහා ඇත්ත වශයෙන් වැය කළ මුදල පමණක් සමාගම ට ගෙවිය යුතුවේ.

2. එවැනි වියදම් දැරීම සඳහා ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමයක් යටතේ රුපියල් මිලියන 39 ආසන්න මුදලක් ලබාදී ඇති අතර, පැල්වත්ත සංකීර්ණයේ සිට සැතපුම් 18 සිට 20 දක්වා දුර ප්‍රමාණයක බාහිර වගාකරුවන් ඊට ඇතුළත්වේ. හල්දුම්මුල්ල උප දිසාපති කොට්ඨාශය, මැදගම හා මඩුල්සීම උප දිසාපති කොට්ඨාශ මීට ඇතුළත් වන පරිදි මෙය ව්‍යාප්ත කර තිබේ. බාහිර වගාකරුවන් විසින් වගා කිරීමට නියමිත මුළු බිම් ප්‍රමාණය අක්කර 7,800 ක් වශයෙන් ගණන් බලා ඇති අතර එයින් අක්කර 2,252 ක් 1987 දී වගා කරන ලදී. ඉතිරි කොටස යෝජනා ක්‍රමය යටතේ 1988, 1989 වර්ෂ තුල වගා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### කෘෂිකාර්මික රක්ෂණ හා ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය

රජය විසින් මෙම යෝජනා ක්‍රමය ඉදිරිපත් කිරීම ප්‍රශංසා කටයුතු ක්‍රියාවක් වන අතර ,මෙහි අරමුණු ඉටුකර ගැනීම, ජාතියේ 'ජීවනාලිය' වශයෙන් සැලකිය හැකි ප්‍රජාවගේ මෙම අංශයට අප්‍රමාණ එල ප්‍රයෝජන ලබා දෙන කාර්යයක් වනවා ඇත. මවිසින් ගොවියන් සමග පවත්වන ලද සාකච්ඡා අනුව පහත සඳහන් නිරීක්ෂණ ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි.

වගා හානියක් සිදුවූ අවස්ථාවකදී තමන්ට සිදුවූ පාඩුව, කෘෂිකාර්මික රක්ෂණය යටතේ සම්පූර්ණයෙන් ආපසු ලබා ගැනීමට හැකිවේදැයි ගොවියන් තුළ සැකයක් පවතී. මෙවැනි සැකයක් ඇතිවීමට හේතු වශයෙන් කරුණු දෙකක් ඉදිරිපත් කළ හැක. දැන් පවත්නා ක්‍රමය යටතේ කිසිම ප්‍රතිපත්තියක් නොමැති ගොවීන් හා අත්වැල් බැඳ ගන්නා ආසන්නතම පාලන නිලධාරීන් සිටින බැවින්, පළමුකොට, වන්දි ගෙවීමේ ක්‍රමය සම්පූර්ණයෙන් ක්‍රමවත් කළ යුතුයි. ඉඩමක නියම අයිතිකරු හඳුනාගෙන එම ඉඩම වගා කරනු ලබන්නේ අයිතිකරු විසින් ද එසේ නැතහොත් බදු ගැනුම් කරුවකු විසින්ද යන්න තහවුරු කරගත යුතුයි. ඉඩමක් ඇත්තවශයෙන් බදු ගැනුම් කරුවෙකු විසින් වගා කරනු ලබන අතර ඉඩම අයිතිකරු විසින් වන්දි ඉල්ලා සිටි අවස්ථා සොයා ගෙන තිබේ. වෙනත් අවස්ථ වලදී, නිලධාරීන් ඇතැම් ගොවීන්ට අනුබල දී ඇත්ත වශයෙන් කිසිදු හානියක් සිදුවී නොමැති වගාවන් වෙනුවෙන් අලාභ ඉල්ලා සිටින මෙන් එම ගොවීන් උනන්දු කරවා එම මුදල් ගොවියන් හා අදාල නිලධාරීන් අතර බෙදා ගෙන ඇත. කෘෂිකාර්මික රක්ෂණ මණ්ඩලය විසින් මෙම අඩුපාඩු අධ්‍යයනය කර රක්ෂණ යෝජනා ක්‍රමය නිසි පරිදි ක්‍රියාත්මක කිරීමේ ක්‍රම හා විධි සකස් කළ යුතුවේ.

දෙවනුව, නියඟ හා ගංවතුර වැනි ආපදා හේතුකොටගෙන කෘෂිකාර්මික අංශය සහමුලින් විනාශ වී ගිය අවස්ථාවලදී සිදුවී ඇති හානිය සාමාන්‍යයෙන් ව්‍යාප්තව පවතී. එවැනි අවස්ථාවකදී, ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම් පත්‍ර විශාල සංඛ්‍යාව අනුව කෘෂිකාර්මික රක්ෂණ මණ්ඩලයේ මුදල් තත්ත්වය ප්‍රමාණවත් නොවේ. කෘෂිකාර්මික රක්ෂණය සාර්ථක ලෙස පවත්වා ගෙන යනු ලබන සංවර්ධනය වූ රට වල පවා එවැනි යෝජනා ක්‍රම නඩත්තු කිරීම සඳහා ඒ ඒ රජයෙන් සහනාධාර ලැබෙන බැවින්, ගොවියන්ගෙන් ලැබෙන වාරික මුදල්වලින් කෘෂිකාර්මික රක්ෂණ මණ්ඩලය පවත්වා ගෙන යෑම සිහිනයක් පමණි. මේ වනාහි භාණ්ඩාගාරයේ අවධානය යොමු විය යුතු අංශයකි.

ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ගැන සලකා බැලීමේදී, වර්තමාන ගොවීහු ඔවුන්ට පෙර විසූ ගොවියන්ට වඩා උගත් පිරිසක් වන බව අප විසින් අමතක නොකළ යුතුයි. තමන් වෙත ඉදිරිපත් කරනු ලබන කවර හෝ ප්‍රදානයක් විශ්ලේෂණය කර එහි වාසිදායක හා අවාසිදායක තැන් හඳුනා ගැනීමේ හැකියාවක් ඔවුන් තුළ තිබේ. දැනට ඔවුන් වෙත ඉදිරිපත්

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## සභාපතිතුමාගේ සමාලෝචනය — 1987

කර ඇති රක්ෂණ යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් ඔවුන් විසින් කර ඇති එක් පැමිණිල්ලක් වනුයේ පොළිය ගණන් බලනු ලබන්නේ ගොවියන් විසින් ගෙවා ඇති දළ වාරිකය මත බවත්, රක්ෂණ ඔප්පුව පරිණත වීමේදී ලැබිය යුතු 'වැල් පොළිය' ගණන් නොගන්නා බවත්ය. යෝජනා ක්‍රමය සාර්ථකවීමට නම් මෙම අඩුපාඩු නිවැරදි කළ යුතු වන්නේය.

**සත්ත්ව පාලනය**

පශු සම්පත් අංශය නිරතුරුවම මෙම අධිකාරියේ අවධානයට යොමු වී තිබුනු අතර, සතුන් ලබා ගැනීම සීමාවීමේ බාධක තිබියදීත් බෝ කිරීම සඳහා ගොවියන්ට අවශ්‍ය ගවයන් ලබා දීම සඳහා සෑම උත්සාහයක්ම දරන ලදි. බරපතලම ප්‍රශ්නය වූයේ පහසුවෙන් ලබාගත නොහැකි වූ කිරි දෙනුන් හා වැස්සියන් සඳහා ඇති ඉල්ලුම සපුරාලීමයි. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් මෙම අඩුව පියවීම සඳහා පියවර ගෙන, වැඩි කිරි ප්‍රමාණයක් ලබාදෙන දෙනුන් ගොවීන්ට ලබා ගැනීමේ පහසුකම් සැලැස්විය යුතුයි. කිරි එළදෙනෙක් හෝ කිරි එළදෙනුන් දෙදෙනෙක් තබා ගෙන ඔවුන්ට අවශ්‍ය ගව ආහාර සැපයීමට සාමාන්‍ය කෘෂිකාර්මික ගොවියෙකුට පුළුවන. මේ සඳහා ගොවියන් උනන්දු කරවීම ජාතික කිරි නිෂ්පාදනය වැඩි කර ආනයනය අඩුකර ගැනීමට ආධාර වනවා පමණක් නොව, එමගින් ගොවි පවුල්තුළ ස්වයං රැකියා බිහි වී ඔවුන්ට අතිරේක ආදායමක් ද ලබා දෙනවා ඇත.

පහත දක්වා ඇති සංඛ්‍යාවලින් පෙනී යන පරිදි 1987 වර්ෂය තුළ ඇතිවූ නියඟය කිරි නිෂ්පාදනය කෙරෙහිද බලපා තිබේ.

| | | | |
|---|---|---|---|
| 1985 | ... | ලීටර | 67,073,000 |
| 1986 | ... | ලීටර | 67,240,000 |
| 1987 | ... | ලීටර | 63,672,928 |

කුර හා මුඛ රෝගය පැතිර යැමක්, උතුරු මැද පළාත, නැගෙණහිර හා වයඹ පළාත්වලින් වාර්තා වූ අතර, නැගෙණහිර පළාතේ ගව වසංගතය හට ගත්තේය. ජාතික පශු සම්පත් බේරා ගැනීම සඳහා මෙම රෝග මර්දනය කර මුලිනුපුටා දැමීම පිණිස පශු වෛද්‍යවරු ඵලදායක පියවර ගත යුතුයි.

අනෙක් අතට කුකුලන් ඇති කිරීමෙහිලා සැලකිය යුතු ප්‍රගතියක් ලබා තිබේ. 1987 තුළ මෙම අධිකාරිය මගින් කුකුළු පැටවුන් 346,394 දෙනෙක් බෙදා දෙන ලද අතර එයින් 62,700 අනුරාධපුර හා පොළොන්නරු දිස්ත්‍රික්ක වලට සපයන ලදි. ස්වයං රැකියාවක් වශයෙන් මෙම වෘත්තිය තෝරා ගෙන ඇති තරුණ තරුණියන්ගෙන් සැදි සුළු ගොවියන් අතර මෙයින් වැඩි කොටසක් බෙදා දෙන ලදි.

කුකුළන් ඇති කිරීමේ කර්මාන්තය වර්ධනය වී ඒ පිළිබඳ උනන්දුවක් ඇතිවූයේ වී නමුදු, මෙම කර්මාන්තය පිළිබඳ ප්‍රශ්ණ නැත්තේද නොවේ. කුකුළු කෑම මිළ එන්ට එන්ටම වැඩි වූ අතර ඒ හේතුකොටගෙන නිෂ්පාදන වියදම ඉහළ නැංගේය. ඒ සමගම 1987 අවසාන කොටසේදී බිත්තරවල සහ මස් කුකුළු මස්වල මිළ ශීඝ්‍රයෙන් පහත වැටුනි. මේ මුළු ව්‍යායාමයේම අසදෘශ ලක්ෂණය වූයේ, ඇතැම් නිෂ්පාදක යන් කෙරෙහි බරපතල අහිතකර තත්ත්වයක් උදා වූ අතර මිළ පහත වැටීම මගින් පාරිභෝගිකයාට වැඩි සෙතක් නොසැල සීමයි. විවෘත ආර්ථිකයක් තුළ වෙළඳ පොලේ බලවේග, නිෂ්පාදකයාගේ හා පාරිභෝගිකයාගේ වාසියට හා අවාසියට ප්‍රතිචාරීවන බවට සැකයක් නැත. එය එසේ වුවද නිෂ්පාදක යාට මෙන්ම පාරිභෝගිකයාටද සාධාරණ වූ මට්ටමක මිළ ගණන් රඳවා ගැනීමේ ක්‍රම හා විධි සොයා ගත යුතුයි. එය කළ හැකි වන්නේ පහත සඳහන් ආකාරයටය:

(අ) තව තවත් බලය ලත් නියෝජිතයන් උනන්දු කර වීමෙන් කුකුළු පැටවුන්ගේ මිළ ගණන් පහත් මට්ටමක රඳවා ගැනීම.

(ආ) දේශීය වශයෙන් වඩ වඩා අමුද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමෙන් කුකුළු කෑම මිළ ගණන් පහත් මට්ටමක රඳවා ගැනීම.

(ඇ) බිත්තර හා කුකුළු මස් මිළ ගණන්, හරක්මස්, මාළු, කරවල ආදියේ මිළ ගණන් සමග තුළනාත්මක මට්ටම්වල පවත්වා ගනිමින්, වෙනත් වර්ගවල සත්ත්ව ප්‍රෝටීන් වෙනුවට බිත්තර හා කුකුළු මස් පරිභෝජනය කරන මෙන් පාරිභෝගිකයන් උනන්දු කරවීම.

බිත්තර හා කුකුළු මස්වල පෝෂණ අගය පිළිබඳ ප්‍රචාරක වැඩ සටහනක් පවත්වා ගෙන යෑම මගින් මෙම ආහාර වර්ග පරිභෝජනය ජනතාව අතර ජනප්‍රිය කිරීමෙහිලා සහාය වීමට සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට පුළුවන. කුකුළු කර්මාන් තය වැනි ස්වයං රැකියා කෙරෙහි තරුණ තරුණියන් ඇද ගැනීමෙන් රැකියා ප්‍රශ්ණය තරමක් දුරට හෝ විසඳා ගැනීමට ඉඩ ඇති බැවින්, ඉහත සඳහන් දුෂ්කරතා මගහරවා ගැනීමෙන් පසු, කුකුළු කර්මාන්තය උනන්දු කරවා තව තවත් ව්‍යාප්ත කළ යුතුයි. මේ සම්බන්ධයෙන් අර්ථවත් ප්‍රතිඵල අත්කර ගැනීම සඳහා, මෙම අධිකාරියට සලසා දී ඇති පහසුකම් තුළින් සෑම උත්සාහයක්ම දරනවා ඇත.

**පොදු කරුණු**

මවිසින් ඉහත සඳහන් කරන ලද කරුණු, එනම්, දැනට සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට ගෙන නොමැති වර්ෂා ජල මාර්ග සමහරක් හරවා වියළි කලාපයේ ප්‍රදේශවලට අමතර ජල සැපයුමක් ලබා දීම, කැබිනට් මණ්ඩලය මගින් අනුමත කර ඇති 'කැනු ලිං' වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීම, අත්‍ය වශ්‍ය නිෂ්පාදන ද්‍රව්‍ය සඳහා වූ සහතික මිළ යෝජණා ක්‍රම සංශෝධනය කිරීම, කුකුළු කර්මාන්තය තහවුරු කිරීම, ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය හා කෘෂිකාර්මික රක්ෂණ ක්‍රමය කෙරෙහි අප්‍රමාදව සැලකිල්ල යොමු කළ යුතු බව අවධාරණය කරනු කැමැත්තෙමි. අනාගතයේදී ආහාර සකස් කිරීම පුළුල් ලෙස සිදු කෙරෙනු පිණිස ආහාර තාක්ෂණය පිළිබඳ ආයතන යක් පිහිටුවීමේ අවශ්‍යතාව මගේ පසුගිය සමාලෝචන යෙන්

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

**සභාපතිතුමාගේ සමාලෝචනය — 1987**

පෙන්වා දුනිමි. ගොවියන්ගේ අවශ්‍යතා සපුරාලිය හැකි ධාරිතාවයක් ඇති 'බීජ බැංකු' පිහිටුවීමද අත්‍යවශ්‍ය වන්නේය. ඉක්මනින් ක්‍රියාත්මක කිරීමේ අරමුණ ඇතිව කෘෂිකාර්මික සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශය විසින් මෙම කරුණු සලකා බලනු ඇතැයි අපේක්ෂා කරමි.

1987 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ වෙනස් වීමක් සිදු නොවූ අතර, මෙම වර්ෂයේදී මට ලැබුණු සහයෝගය ගැන මගේ සියලුම සම අධ්‍යක්ෂවරුන්ට මෙන්ම, කැපවීම කින් යුක්තව තම යුතුකම් නොපිරිහෙලා ඉටු කළ මගේ විධායක නිළධාරීන්ටත්, සෙසු කාර්ය මණ්ඩලයටත් ස්තුති කරමි.

අතිගරු ජනාධිපතිතුමන්ගෙන් සහ 1987 දෙසැම්බර් මාසය දක්වා කෘෂිකාර්මික සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යධුරය හෙබවූ ගාමණී ජයසූරිය මැතිතුමාගෙන් වර්ෂය තුළ ලැබුණු මාර්ගෝපදේශකත්වය හා සහයෝගය පිළිබඳව මගේ කෘතඥ තාව ප්‍රකාශ කරමි. එසේම අප අමාත්‍යාංශය භාරගෙන සිටින ගරු. ඩී. බී. විජේතුංග මැතිතුමා සාදරයෙන් පිළිගනිමි. තවද, මේ අවස්ථාවේදී, තවත් දුෂ්කර වර්ෂයක් ගත කිරීමෙහිලා මෙම අධිකාරිය සමග සහයෝගයෙන් ක්‍රියා කළ දිසා ඇමති වරුන්ටත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටත්, කෘෂිකාර්මික සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම් සහ සෙසු අමාත්‍යාංශවල ලේකම්වරුන්ටත්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් ටත්, සංස්ථාවල හා රාජ්‍ය හා පෞද්ගලික අංශවල සෙසු සියලුම සංවිධානවලටත් අපගේ කෘතඥතාව පූර්ව ස්තුතිය පුදකරමි.

අවසාන වශයෙන්, අප ගොවියන්ගේ මෙන්ම පොදු ජනතාව ගේත් ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා කෘෂිකාර්මික නිෂ්පාදනය වැඩි දියුණු කිරීම පිණිස කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය විසින් ගන්නාවූ ප්‍රයත්නය තවදුරටත් එලෙසම පවත්වාගෙන යන බව නැවතත් අවධාරණය කරනු කැමැත් තෙමි. ස්වභාවික වශයෙන් මෙන්ම මිනිසා විසින් අප රටට කර ඇති විපත්ති මධ්‍යයේ වුවද, අප ජනතාව අධිෂ්ඨාන පූර්වකව ප්‍රගතිය කරා ගමන් කරනවා දැකීම අප ධෛර්යමත් කරවයි. ජාති, කුළ, ආගම් ආදී සියලු භේදවලින් තොරව මෙරට වාසය කරන මුළු මහත් ජනතාවට, ඔවුනොවුන් කෙරෙහි ඉවසීමකින් හා කරුණාවකින් යුක්තව සාමයෙන් හා සාමදානයෙන් ජීවත්වීමට හැකිවන පරිදි, දැනට පවත්නා ජාතිවාදී ප්‍රශ්ණ මෙන්ම තරුණ තරුණියන්ගේ අසහනයද ඉක්මනින් විසඳෙනු ඇතැයි යනු අපගේ අවංක බලාපොරොත්තුවයි. තථාගත සම්බුදු රජාණන්වහන්සේ විසින් කරණීය මෙත්ත සූත්‍රයෙන් දේශනා කර වදාල පරිදි අප රටේ වාසය කරන මුළු මහත් ජනතාවටම සලකමු.

"මාතා යථා නියං පුත්තං
ආයුසා එක පුත්ත මනුරක්ඛෙ
එවම්පි සබ්බභූතෙසු
මානසංභාවයෙ අපරිමාණං "

"ආදරණීය මවක් තම ජීවිතය හෝ නොතකා තම එකම දරුවා ආරක්ෂා කරන්නේ යම්සේද, ඒ ආකාරයෙන්ම මිනිසාා සෙසු සියලු මිනිසුන් මෙන්ම ප්‍රාණීන් කෙරෙහිද කරුණාව හා මෛත්‍රිය දැක්විය යුතුයි."

1988 අප්‍රියෙල් 15
කොළඹ.

**රන්ජන් විජේරත්න**
සභාපති

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## දකුණු පළාත වාර්ෂික වාර්තාව — 1987

### 1. පරිපාලනය

ගාල්ල, රත්ගම සහ බලපිටිය හැර, දකුණු පළාතේ සෙසු සියලුම මැතිවරණ කොට්ඨාශවල දැන් කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය සේවය කරයි.

අවශ්‍ය මැතිවරණ කොට්ඨාශ කාර්ය මණ්ඩල දැන් සම්පූර්ණයෙන් ලබා දී තිබේ.

කෘෂිකාර්මික කළමනාකරුවන්ගේ සේවක සංඛ්‍යාවෙහි ඇති වූ බද්දේගම ඇබෑර්තුව ජූලි මාසයේදී පුරවන ලදී. තිස්ස 11 කලාපයේ කෘෂිකාර්මික කළමනාකරුට විරුද්ධව ඇති විනයානුකූල පරීක්ෂණය නිම කෙරෙන තුරු ඔහුගේ වැඩ තහනම් කර තිබේ.

දිස්ත්‍රික්ක පරිපාලනය සම්බන්ධයෙන්, මාතර දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය පළාත් අධ්‍යක්ෂවරයා වර්ෂය ආරම්භයේදී කළුතර දිස්ත්‍රික්කයට මාරු කරන ලදුව එම ඇබෑර්තුවට පෙබරවාරි මාසයේදී නව පත්වීමක් සිදු කරන ලදී. ගාල්ල සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල නියෝජ්‍ය පළාත් අධ්‍යක්ෂවරු වෙනස් වීමක් නොමැතිව තවදුරටත් සේවය කරති.

### 2. ක්‍රියාකාරිත්වය

### 1. ගොවි ජන සේවා මධ්‍යස්ථාන

1987 ජූලි මාසයේ ඇති වූ කලබලකාරී ක්‍රියා මගින් ඇතැම් මධ්‍යස්ථාන විනාශ කිරීම හා ඇතැම් මධ්‍යස්ථානවලට හානි සිදු කිරීම හේතු කොටගෙන, මීට කලින් වර්ෂවලදී වාර්තා කරන ලද ගොවි ජන සේවා වැඩ කටයුතුවල ප්‍රගතිශීලී වර්ධනයේ බරපතල පසුබෑමක් ඇති විය. මාතර දිස්ත්‍රික්කයේ දෙයියන්දර සහ අකුරැස්ස සහ හම්බන්තොට දිස්ත්‍රික්කයේ බෙලිඅත්ත ලුනම හා අඟුණකොළපැලැස්සේ පිහිටි ගොවි ජන සේවා මධ්‍යස්ථානවලට වඩාත්ම හානි සිදු කරනු ලැබූ අතර ඒවායේ ගොඩනැගිලි, කාර්යාල ලී බඩු හා උපකරණ සම්පූර්ණයෙන් නොහොත් අඩ වශයෙන් ගිනි බත් හෝ විනාශ හෝ කරන ලදී. මෙම ගොවි ජන සේවා මධ්‍යස්ථානවල පිහිටා තිබුනු කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ මැතිවරණ කොට්ඨාශ කාර්යාලවලටද එම ඉරණමම අත්විය.

තත්ත්වය සාමාන්‍ය අතට හැරෙත්ම, විනාශවීමෙන් බේරා ගත් ගොඩනැගිලිවල සිට හෝ යාබද පිහිටි ගොවි ජන සේවා මධ්‍යස්ථානවල සිට හෝ සේවාවන් ක්‍රියාත්මක කිරීමට තාවකාලික වැඩ පිළිවෙලවල් සලස්වන ලදී.

දැරීමට සිදුවන අධික ප්‍රාග්ධන වියදම අනුව සලකා බලා, හානි සිදුවී ඇති එමෙන්ම විනාශ වී ගිය ගොවි ජන සේවා මධ්‍යස්ථාන අළුත්වැඩියා කිරීම සඳහාත්, කාර්යාල ලී බඩු හා උපකරණ සැපයීම සඳහාත් දෙපාර්තමේන්තු මගින් 1988 වර්ෂය වෙනුවෙන් වැඩ සටහනක් පිළියෙල කර තිබේ.

මෙම කලබලකාරී තත්ත්වයන් මධ්‍යයේ මැතිවරණ කොට්ඨාශ/ගොවිජන සේවා මධ්‍යස්ථාන මට්ටමේ කෘෂිකාර්මික යෙදවුම්/ව්‍යාප්ත සේවාවන් සහ කෘෂිකාර්මික සංවර්ධන වැඩ කටයුතු සමායෝජනය කිරීම අදාල නිලධාරීන්ට පාලනය කල නොහැකි යම් යම් අවහිරකම්වලට භාජනය වී ඇති බැව් පෙනී ගියේය. තත්ත්ව කෙතරම් බරපතල වී ද යත් මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්කවල ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවේ ඇතැම් වගා නිලධාරීන් මෙම තත්ත්වයෙන් අවාසනාවන්ත ලෙස පීඩා ලැබුවන් බවට පත්විය.

කිසිදු කඩාකප්පල් කිරීමක් නොමැතිව ගම් මට්ටමේ ගොවි ජන සේවා වැඩි දියුණු කිරීම හා ඒ ඒ ප්‍රදේශයේ කෘෂිකාර්මික සංවර්ධන වැඩ කටයුතු නගා සිටුවා තත්ත්වය තව තවත් උසස් කිරීම පිණිස, බියෙන් හෝ බාධාවකින් තොරව තම වැඩ කටයුතු ඉටු කිරීමට ක්ෂේත්‍ර නිලධාරීන්ට හැකිවන පරිදි ඉක්මනින් සියල්ල සමථයකට පත්වී සාමාන්‍ය තත්ත්වය උදාවනු ඇතැයි අපේක්ෂා කරමි.

### 11. වගා අංශ

(අ) වී – දිස්ත්‍රික්ක තුනේම වී වගා කටයුතු 1986/87 මහ සහ යල 87 යල යන වගා කන්න දෙකේදීම පැවති දැඩි නියඟයට භාජනය විය. මෙය මතක ඇති කාලයක ඇති වූ වඩාත්ම දැඩි නියඟය බැව් වාර්තා වී තිබේ.

එහි ප්‍රතිඵලය වශයෙන් වර්ෂය තුළ ලබාගත් වී නිෂ්පාදනයේත් සාමාන්‍ය අස්වනු ප්‍රමාණ වලත් අඩු වීමක් වාර්තා විය. එය එසේ වුවද, 1987/88 මහ කන්නය තුළ සාමාන්‍ය වර්ෂා පතනය නිසි කලට ඇතිවී, වී වගා කටයුතු නිසි පරිදි ආරම්භ කිරීම සඳහා සතුටුදායක කාල ගුණ තත්ත්වයක් පැවතුනි.

පසුගිය කන්න දෙක තුළ තුළනාත්මක වී නිෂ්පාදන ප්‍රමාණ සහ වගා කරන ලද කුඹුරු අක්කර ප්‍රමාණය පහත දැක්වේ.

| දිස්ත්‍රික්කය | | යල කන්නය අක්කර | සාමාන්‍ය අස්වැන්න අක්කරයක / බුසල් | මහ කන්නය | අක්කර | සාමාන්‍ය අස්වැන්න අක්කර / බුසල් |
|---|---|---|---|---|---|---|
| ගාළු | 1986 | 50348 | 40.55 | 1986/87 | 58530 | 47.22 |
| | 1987 | 36580 | 35.55 | 1987/88 | 52800 * | 45.00 ** |
| මාතර | 1986 | 44999 | 51.68 | 1986/87 | 45915 | 63.71 |
| | 1987 | 37780 | 48.61 | 1987/88 | 45225 * | 50.00 ** |
| හම්බන්තොට | 1986 | 38365 | 83.48 | 1986/87 | 55200 | 82.20 |
| | 1987 | 21500 | 78.47 | 1987/88 | 54656 * | 80.00 ** |

* අනුමාන සංඛ්‍යා

** ගණන් බැලූ සංඛ්‍යා

(ආ) අතිරේක ආහාර බෝග

මෙහිදීද, විශේෂයෙන්ම හම්බන්තොට දිස්ත්‍රික්කයේ වගා කටයුතු විනාශ කරමින් පැවති නියගය හේතුකොටගෙන මෙම අංශයේ නිෂ්පාදන වැඩ කටයුතුවලට විශාල වශයෙන් හානි සිදු විය.

වර්ෂය තුළ පැවති සාමාන්‍ය වියළි කාල ගුණය හේතුකොට ගෙන වගා කරන ලද බිම් ප්‍රමාණයේ ක්‍රමික වර්ධනයක් ඇති නොවූ නමුදු, ගාලු හා මාතර යන දිස්ත්‍රික්ක වල මෙම අංශයට එතරම් අහිත කර බලපෑමක් ඇති නොවීය.

(ඉ) ගස්වගා අංශය (තේ, රබර්, පොල් සහ සුළු අපනයන බෝග)

නොකඩව පැවති නියඟ හේතුකොට ගෙන හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ වඩාත්ම හානි සිදුවූ අතර එම දිස්ත්‍රික්කයේ පොල් වගා කර ඇති ඉඩම් ප්‍රමාණයෙන් 25% ට වැඩි ප්‍රමාණයක් විනාශ විය. මෙම අංශයෙහි සිදු වී ඇති අලාභහානි පිරිමසාලීම සඳහා පොල් පැළ 214,500 කට වැඩි ප්‍රමාණයක් අවශ්‍යවනු ඇතැයි වාර්තා කර තිබේ. මෙම අංශය පුනරුත්ථාපනය කිරීම සඳහා හම්බන්තොට දිස්ත්‍රික්කයේ විශේෂ පුනරුත්ථාපන ව්‍යාපෘතියක් දියත් කිරීම පිණිස පොල් සංවර්ධන මණ්ඩලය විසින් සංවර්ධන සහනාධාර වැඩ පිළිවෙල යටතේ අවශ්‍ය වැඩ කටයුතු සැලැස්විය යුතුයි.

ගාල්ල හා මාතර යන දිස්ත්‍රික්ක දෙකේ තේ සහ සුළු අපනයන බෝග පිළිබඳ කරුනු සලකා බැලීමේදී, වාරය ආරම්භයේදී මෙම අංශයේ වගා හා සංවර්ධන වැඩ කටයුතු පහත් මට්ටමක පැවතියේ වී නමුදු, සමාලෝචනයට භාජනය වූ කාල පරිච්ඡේදය තුළ සංවර්ධන සහනාධාර වැඩ පිළිවෙල යටතේ ලබා ඇති සාමාන්‍ය ප්‍රගතිය සතුටුදායක වූ බැව් පෙනේ.

රබර් වගාව සම්බන්ධයෙන් කරුණු සලකා බැලීමේදී මෙම කාලය තුළ, රෝගයට භාජනය විය හැකි ආර්.ආර් අයි.සී. 103 කෙලෝන්වල කොරිනෙස්පෝරා කොළ පුල්ලි රෝගය හට ගැනීම සුළු රබර් හිමියන් කෙරෙහි බරපතල විපාක ඇති කර තිබෙන බැව් පෙනේ. රජයේ නියෝගයක් පරිදි, රෝගයට ගොදුරු වී ඇති සියලුම රබර් වගාවන් රබර් පාලක දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ ගලවා විනාශ කර දැමිය යුතු විය. මෙයින් හානියට පත් වගා කරුවන්ට, රබර් නැවත වගා කිරීම සඳහා අවශ්‍ය යෙදවුම් ප්‍රමාණයක් සමග වැඩි කළ සහනාධාරයක් සලසා දෙනු ලැබේ. මෙම ප්‍රශ්ණය හේතුකොටගෙන නිර්දේශ කර ඇති ක්ලෝනවල රෝපන ද්‍රව්‍ය පිළිබඳ බරපතල හිඟයකට මුහුණපෑමට සුළු රබර් ඉඩම් හිමියන්ට සිදුවී තිබේ. පැළ සිටුවීමේ එක් එක් වාරයක් සඳහා නියම කරගත් වැඩ සටහනක් අනුව රෝපණ ද්‍රව්‍ය සැපයීමට රබර් පර්යේෂණ මණ්ඩලයේ සහාය ඇතිව රබර් පාලක දෙපාර්තමේන්තුව විසින් කටයුතු යොදා තිබේ. මෙම අංශයේ නිෂ්පාදන, කුඩා ඉඩම් හිමියන්ට වඩා ලාභදායක වන පරිදි මෙම වර්ෂය තුළ මෙම අංශයේ නිෂ්පාදන මිළ සීමාවල වැඩිවීමක් ස්ථිර වාර්තා වී ඇත.

III. පශු සම්පත්

මූලික අවශ්‍යතා සහ ආධාරක සේවා පහසුකම් ලබාදීම අතින් මෙම අංශයේ සැලකිය යුතු ප්‍රගතියක් වාර්තා වී තිබේ. ගාලු දිස්ත්‍රික්කයෙන් ආරම්භ කර, මෙම අංශයේ සේවාවන් වැඩි දියුණු කිරීම සඳහා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පියවර ගෙන තිබේ. සුළු ඉඩම් හිමියාට ලාභදායක වැඩ පිළිවෙලක් වශයෙන් මෙම නිෂ්පාදන අංශයෙහි නියුක්තවීමට සහාය වීමක් වශයෙන්, තව තවත් ප්‍රමාද නොවී, මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්කවලද මෙම සේවාවන් වැඩි දියුණු කරනු ඇතැයි බලාපොරොත්තුවෙමි.

IV. වාරිමාර්ග

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සහ ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ වන මෙම අංශයේ ප්‍රගතිය, සමාලෝචනයට භාජනය වී ඇති කාල පරිච්ඡේදය තුළ සතුටුදායක විය.

දෙපාර්තමේන්තු දෙක මගින් ක්‍රියාත්මක කරන ලද පුනරුත්ථාපනය කිරීමේ ඉදි කිරීමේ හා නඩත්තු වැඩ පිළිවෙලවල් මගින් උපරිම වී නිෂ්පාදනයක් සහ ඉඩම් ප්‍රයෝජනයට ගැනීමක් සහතික වන පරිදි වඩා උසස් තත්ත්වයක වාරිමාර්ග හා ජලාපවාහන පහසුකම් සලසා දෙන ලදි. දැනට ඉදිවෙමින් පවතින මහ පරිමාණයේ වාරිමාර්ග යෝජනා ක්‍රම:-

1. නිල්වලා ගඟේ ජල ගැල්ම ආරක්ෂා කිරීමේ යෝජනා ක්‍රමය.

11. අධියර-

    පහළ වම් ඉවුරේ සහ අකුරැස්ස නගරයේ කුඹුරු අක්කර 4,600ක් පමණ මීට අයත්වේ.

2. කිරිදිඔය (ලුණුගම්වෙහෙර) වාරිමාර්ග හා ජනපද පිහිටුවීමේ යෝජනා ක්‍රමය.

11 අදියර-

    ගඟ පහළ වැඩ- ඉඩම් සමතලා කිරීම සහ මිනිසුන් පදිංචි කරවීම සඳහා තවත් ඉඩම් අක්කර 10,900 ක් හා ගොවි පවුල් 4,000 ක් සඳහා ඉඩම් ලබා ගැනීම.

තවද, හම්බන්තොට ඒකාබද්ධ කළ ග්‍රාමීය සංවර්ධන වැඩ පිළිවෙලේ වාරිමාර්ග ඉදි කිරීමේ වැඩ සහ ගාල්ල හා මාතර දිස්ත්‍රික්කවල ගම්බද වාරිමාර්ග පුනරුත්ථාපන වැඩ පිළිවෙල ශීඝ්‍රයෙන් කෙරීගෙන යයි.

3. සාමාන්‍ය කරුණු

මෙම අධිකාරිය මගින් සම්බන්ධීකරණය කර මෙහෙය වනු ලබන කෘෂිකාර්මික යෙදවුම් අළෙවි කරණය සහ පුහුණු කිරීමේ කාර්යයන් පිළිබඳ සමාලෝචනය කිරීම අදාල ඒ ඒ අංශ විසින් සවිස්තරව ඉදිරිපත් කරනවා ඇත.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## දකුණු පළාත වාර්ෂික වාර්තාව — 1987

සියලුම අංශවල වගා කටයුතු සහ නිෂ්පාදන වැඩ කටයුතු අවහිර කරමින් ඇති වූ පෙර නොවූ විරූ නියං තත්ත්වයන් හේතුකොට ගෙන සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ කෘෂිකාර්මික අංශයේ වැඩ කටයුතු සීමා කිරීමට සිදුවිය. ධනාත්මක පැත්තෙන් කෘෂිකර්මය, නිෂ්පාදකයාට වඩා ලාභදායක ව්‍යායාමයක් බවට පත්කරමින් නිෂ්පාදනවල මිළ ගණන් ශීඝ්‍ර වැඩි වීමක් පෙන්නුම් කළේය. ඍණාත්මක පැත්තෙන් කෘෂිකර්මය සඳහා යොදාගත හැකි බිම් ප්‍රමාණය සීමා සහිත වීම දිස්ත්‍රික්ක තුනේම අවදානම් මට්ටමක පත්වී තිබුණි. එහි ප්‍රතිඵලය වශයෙන් කෘෂිකාර්මික අංශයේ නිෂ්පාදන වැඩ කටයුතුවල නියැලී සිටින නිෂ්පාදන වයස් සීමාවට අයත් සේවක පිරිස අතිශයින් අධිකවීම අනුව එක් එක් නිෂ්පාදන ඒකකයක් ජීවිකාවෘත්තිය සඳහා ප්‍රමාණවත් නොවන ආර්ථික වශයෙන් ලාභදායක නොවන තත්ත්වයක පත් විය.

ආර්ථික වශයෙන් හානිකර විය හැකි මෙම තත්ත්වය ප්‍රතිපත්ති සකස්කරන්නන් විසින් අවබෝධ කරගෙන 1988 අයවැය ලේඛනයෙන් යෝජනා කර ඇති පරිදි, ප්‍රධාන වශයෙන් කෘෂිකාර්මික වූ සමාජයක මෙම අංශය තුළ රැකියා අවස්ථා ඇති කිරීම සඳහා කෘෂිකර්මය පදනම් කරගත් කර්මාන්ත හා එවැනි වෙනත් ක්‍රියාකාරකම් ආරම්භ කිරීම සඳහා නිසි පියවර ගත යුතුවේ.

මෙම අරමුණ ඇතිව මාතර දිස්ත්‍රික්කයේ සහ හම්බන්තොට දිස්ත්‍රික්කයේ සත්ව පාලන හා ගෘහ නී කර්මාන්ත අංශවල ස්වයං රැකියා ජනනය කිරීම සඳහා පිළිවෙලින් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ හා හම්බන්තොට ඒකාබද්ධ කළ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියේ සහාය ඇතිව කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය මඟින් වැඩ කටයුතු ආරම්භ කර තිබේ. මීට අමතර වශයෙන් සමහර කෘෂිකාර්මික කළමනාකරුවන් විසින් තම වැඩ කටයුතු ක්ෂේත්‍ර මට්ටමේදී ඵලදායක ලෙස ඉටු කිරීම් අවහිර වන අයුරු, ජූලි මාසයේ සිදුවූ කලකෝලහලවල ප්‍රතිඵලයක් වශයෙන් අවුරුද්දේ දෙවන භාගය තුළ මතුවූ ඇතැම් අවහිරකම් මධ්‍යයේ වුවද දිස්ත්‍රික්ක තුනේ කෘෂිකාර්මික සංවර්ධන වැඩ කටයුතු සම්බන්ධීකරණය හා තහවුරු කිරීම සම්බන්ධයෙන් කල යුතුවූ තම වැඩ කොටස කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය විසින් ඉටු කරන ලදී.

අවසාන වශයෙන්, කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමාගෙන් ලැබුණු මග පෙන්වීම හා උපදෙස් අගය කරන අතර ඒ සම්බන්ධයෙන් එතුමා වෙත මගේ කෘතඥතාව පළ කරමි. තවද සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ මා වෙත පැවරී තිබුණු කාර්යයන් ඉටු කිරීමෙහිලා අදාල පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන්, දිස්ත්‍රික්ක සංවර්ධන ලේකම් වරුන්ගෙන් (දිසාපතිවරු) දිස්ත්‍රික්ක/දෙපාර්තමේන්තු නිල ධාරීන්ගෙන් සහ අවසාන වශයෙන් කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියට අයත් මැතිවරණ කොට්ඨාශ, දිස්ත්‍රික්ක සහ ප්‍රධාන කාර්යයාලයේ කාර්ය මණ්ඩලයටත් කෘතඥතාව පළ කර සිටිමි.

ඒ.ඕ.බී.ද. අල්මේදා
1988.02.08 පළාත් අධ්‍යක්ෂ – දකුණු පළාත

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## ඌව පළාත වාර්ෂික වාර්තාව — 1987

### ඌව පළාත

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ගැමි ගොවියා වෙනුවෙන් කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලය කෘෂිකාර්මික වැඩ කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා මුළු ශක්තිය මෙහෙයවා ක්‍රියා කළේය. එය එසේ වුවද, මෙම කාල පරිච්ඡේදය තුළ රටෙහි වරින්වර ඇති වූ කලබලකාරී තත්ත්වය හේතුකොටගෙන මෙම කාර්ය මණ්ඩලයට මෙන්ම කෘෂිකර්මය හා සම්බන්ධ වෙනත් දෙපාර්තමේන්තුවල හා ආයතනවල නිලධාරීන්ටත් ගොවියන් වෙනුවෙන් ඉටුකළ යුතු තම වගකීම් නිසි පරිදි ඉටුකළ නොහැකි විය.

වැල්ලවාය 11 කලාපයේ කෘෂිකාර්මික කළමණාකරු අවුරුද්දකට මදක් වැඩි කාල සීමාවක් තුළ මෙම අධිකාරියේ සේවය කිරීමෙන් පසු 1987 පසු භාගයේදී තම තනතුරෙන් ඉල්ලා අස්විය. එයින් ඇතිවූ ඇබැර්තුව යථා කාලයේදී පිරවිය යුතුව ඇත.

### පරිපාලන ඒකක

ග්‍රාමීය ගොවියාගේ සියලු කෘෂිකාර්මික වැඩ කටයුතු සම්බන්ධීකරණය කිරීමේ මූලික ආයතන ගොවි ජන සේවා මධ්‍යස්ථාන කේන්ද්‍රය කර ගෙන ක්‍රියාත්මක විය. 1987 දී නාගදීප (මහියංගන මැතිවරණ කොට්ඨාශය) ඇතිමලේ සහ හිහරුකඩුව (මොණරාගල මැතිවරණ කොට්ඨාශය) යන නව මධ්‍යස්ථාන තුනක් කෘෂිකාර්මික අංශයේ ක්‍රියාත්මක කරනු ලැබූ අතර, එය හේතු කොටගෙන මෙතෙක් පිහිටුවා තිබුනු 41 ක් වූ මුළු මධ්‍යස්ථාන සංඛ්‍යාවට තවත් නව මධ්‍යස්ථාන තුනක් එකතු විය. ඇත ගොවි ප්‍රදේශවල නව මධ්‍යස්ථාන පිහිටුවන ලෙස කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා විසින් තම ක්ෂේත්‍ර චාරිකාවලින් පසු නිර්දේශ කරන ලද පරිදි, ඔක්කම්පිටියේ මධ්‍යස්ථානය නිම කිරීමෙන් පසු, මෙම පළාත සඳහා වන 47 ක් වූ මුළු මධ්‍යස්ථාන සංඛ්‍යාව සම්පූර්ණවේ. (බදුල්ල හා මොණරාගල සඳහා පිළිවෙලින් 29 ක් හා 18.)

### වගා කටයුතු

වී වගා අංශයේ ව්‍යාප්ත කාර්ය මණ්ඩලය, පැළ නැවත සිටුවීම, පොහොර භාවිතා කිරීම, වල් පැලෑටි මර්ධනය කිරීම, උසස් තත්ත්වයේ බිත්තර වී යොදා ගැනීම ආදිය වැනි නව තාක්ෂණික ක්‍රම උපයෝගී කර ගැනීම කෙරෙහි ගොවියන් උනන්දු කරවීමෙහිලා සමත් වී ඇත. විශේෂයෙන්ම වියලුව හා මහියංගනය මැතිවරණ කොට්ඨාශ හැර බදුල්ල දිස්ත්‍රික්කයේ සෙසු ප්‍රදේශවල පවතින වෙනස්වන සුලු කාලගුණ තත්ත්වයන් සලකා බැලීමේදී, ගොවීන්ගේ ආර්ථික ඉපයීම උපරිම මට්ටම කට නංවාලීම සඳහා වගා කටයුතු පිළිබඳ කාල සටහනක් තිබියදීත්, ප්‍රධාන වශයෙන් ගෙදර දොර එදිනෙදා ප්‍රයෝජනය සඳහා පමණක් වී වගා කරනු ලැබේ. වී වගා අංශයේ සතුටුදායක නිෂ්පාදන මට්ටමක් පවත්වාගෙන යැමෙහිලා ලබා ඇති ප්‍රගතිය සම්බන්ධයෙන් ව්‍යාප්ති කාර්ය මණ්ඩලයට ප්‍රශංසාව හිමිවිය යුතුයි.

### අර්තාපල්

ජාතික පරිභෝජනයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් නිෂ්පාදනය කරන බදුල්ල දිස්ත්‍රික්කයේ අර්තාපල් වගාකරුවන්ට මෙය ඉතාමත් සාර්ථක වර්ෂයක්විය. කලින් වර්ෂවලදී අර්තාපල් වගා කරන ගොවීන්ට මුහුණ පෑමට සිදුවූ ප්‍රශ්ණ මගහරවාලීම සඳහා නිලධාරීන් විසින් පියවර ගෙන තිබුණි.

දිස්ත්‍රික්කය තුළ බීජ අර්තාපල් සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍ර සංඛ්‍යාව 1986 දී 17,982 ක් වූ අතර 1987 දී එම සංඛ්‍යාව 27,413 ක් විය. තවද 1987.12.31 දින දක්වා ගොවීන් වෙත කරන ලද දේශීය බීජ අර්තාපල් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 1,500 ක් විය. සමාලෝචනයට භාජනය වූ කාල සීමාව තුළ 1:6 ක සාර්ථක අස්වැන්නක් ලබා ඇති අතර ඒ හේතු කොටගෙන අර්තාපල් වගා කිරීම සඳහා ඇති ඉල්ලුම වැඩිවිය.

### එළවළු

එළවළු වගා කෙරෙන ප්‍රදේශවල ඇති වූ අධික වර්ෂා පතනය හේතුකොටගෙන 1987 අවසාන භාගය එළවළු වගාව සඳහා හිතකර නොවන කාල පරිච්ඡේදයක් වශයෙන් සලකන ලදී. මෙම වර්ෂාව හේතු කොට ගෙන එළවළු වගාවන් විනාශවී ගිය අතර වර්ෂය අවසාන යේදී එළවළු මිළ ගණන් බෙහෙවින් ඉහළ නැංගේය.

එළවළු බීජ සැපයීමෙහිලා එළවළු ගොවීන්ට මුහුණ පෑමට සිදුවන ගැටළු දැන් දැන් ලිහිල් වීගෙන යැම සැලකිය යුතු ලක්ෂණයක් වන අතර, පෞද්ගලික අංශය මගින් එළවළු බීජ මිළ ඉහළ නංවන විට ගොවීහු ප්‍රතිචාරීවීම ස්වභාවික වන නමුදු, එළවළු බීජ බෙදා හැරීම පෞද්ගලික අංශයට පැවරීමේ ප්‍රතිපත්තිය ගොවියන් විසින් අගය කරනු ලබන බැව් පෙනේ.

### කුඩා තේ වතු

කලින් වර්ෂය හා සසඳා බලන කල, 1987 වර්ෂයේදී කුඩා තේ වතු හිමියන්ට තම තේ දළු සඳහා වැඩි මිළක් ලැබුනි. එම මිළ වැඩිවීම තම තේ වතු වැඩි දියුණු කිරීම සඳහා දිරිගන්වන සුලු ලක්ෂණයක් වූයේ වී නමුදු, අර්තාපල් හා එළවළු මිළ ගණන් ඔවුන්ගේ සිත් ඇද ගන්නා සුලු වූ බැවින් තම තේ වතු කෙරෙහි ඔවුන් තුළ ඇති උනන්දුව අඩුවීමට එය හේතුවූ බැව් පෙනෙන්නට තිබුණි. තේ දළු මිළ උසස් මට්ටමක රැඳී සිටියහොත්, ඔවුන් විසින් තම කුඩා තේ වතු වැඩි දියුණු කිරීම කෙරෙහි සිත් යොමු කරනු ඇතැයි අපේක්ෂා කළ හැක. පොදුවේ සලකා බැලූ විට නව පාලනයක් යටතේ වූ බදුල්ල දිස්ත්‍රික්කයේ කුඩා තේ වතු සංවර්ධනය කිරීමෙහිලා අමතර වගකීම් බාරගැනීම පිණිස සකස් වී තිබේ.

### උක් වගාව

වර්ෂය තුළ පැවති කාලගුණ තත්ත්වයන් උක් වගාව සඳහා හිතකර විය. විවෘත වෙළඳ පොලේ පැවති සතුටුදායක මිළ ගණන් සහ පැල්වත්ත සංකීර්ණය විසින් ගෙවන ලද තරඟකාරී මිළ ගණන් උක් වගා කර ඇති තම ඉඩම් වැඩි දියුණු කිරීම කෙරෙහි උක් වගාකරුවන් උනන්දු කරවන ලදී.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

**ඌව පළාත වාර්ෂික වාර්තාව — 1987**

**පැල්වත්ත සංකීර්ණය**

නියමිත කාලසීමාව තුළ සංකීර්ණය, කර්මාන්ත ශාලාව, නිවාස, මංමාවත්, උක් වගා ආදිය පිහිටුවීමේ අභියෝගයට මුහුණදීමේදී, කර්මාන්ත ශාලාවට අවශ්‍ය අඩු උක් දඬු ප්‍රමාණය මොණරාගල දිස්ත්‍රික්කයේ පිටස්තර වගා කරුවන්ගෙන් ලබාගැනීමට පියවර ගැනීමෙන් මෙම සංකීර්ණය පුළුල් වැඩ පිළිවෙලක් යටතේ වැඩ කටයුතු ආරම්භ කර තිබේ. ප්‍රධාන වශයෙන් යෝජනා ක්‍රම තුනක් එනම් ලංකා බැංකු ණය යෝජනා ක්‍රමය පැල්වත්ත සීනි සමාගමෙන් සහාය ලත් පිටස්තර උක්වගා කරුවන්ගේ යෝජනා ක්‍රමය සහ පිටස්තර උක්වගා කරුවන්ගේ ස්වයං ආධාර යෝජනා ක්‍රමය විවිධාකාරයෙන් ගොවීන්ට සහායවෙමින් සතුටුදායක ලෙස වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

එය එසේවුවද, ලංකා බැංකු ණය යෝජනා ක්‍රමය පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීමට තරම් කාලයක් තවමත් ගත වී නැත. පැල්වත්ත සීනි සමාගමෙන් සහාය ලත් පිටස්තර උක්වගා කරුවන්ගේ යෝජනා ක්‍රමය උක් වගාකරුවන් විසින් අගය කරනු ලබන බැව් කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය මගින් කරනු ලබන සමීක්ෂණය මගින් අනාවරණය වී ඇති අතර කර්මාන්ත ශාලාවට අවශ්‍ය උක් දඬු වැඩි ප්‍රමාණයක් පිටස්තර වගා කරුවන් සඳහා වූ ලංකා බැංකු ණය යෝජනා ක්‍රමය අනුමත කර ඇත්තේ සැතපුම් 18 ක් ඇතුළත ප්‍රදේශය සඳහා පමණක් බැව් මෙහිදී සඳහන් කළ යුතුයි. කලෙක දිවයිනේ ඉතාමත් සරු උක් වගාකරන ප්‍රදේශයක් වූ බදුල්ල දිස්ත්‍රික්කයේ හල්දුම්මුල්ල උප දිසාපති කොට්ඨාශය මෙම යෝජනා ක්‍රමයට ඇතුළත් කර ගැනීමට කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය මගින් සෑම උත්සාහයක්ම දරනු ලැබේ.

**මොණරාගල සංකීර්ණය**

නිවාස, මංමාවත් ,වැවිලි කටයුතු, ගොඩනැගිලි, මිනිසුන් පදිංචි කරවනු ලබන බිම් ප්‍රමාණය, රැකියා ඈදී කරුණු පිළිබඳ අනුමතිය ලැබීමෙන් පසු සංකීර්ණයේ වැඩ කටයුතු සතුටු දායක ලෙස කරගෙන යන ලදී. මෙහිලා සඳහන් කළ යුතු වඩාත්ම වැදගත් කරුණ වන්නේ අනවසරයෙන් පදිංචි වී සිට ඉඩම් අහිමිවී ගිය පවුල්වලට වන්දි වශයෙන් රුපියල් මිලියන 1.35 ක් ගෙවීමයි. තාවකාලිකව නිවාස සහිත පදිංචි කරුවන් 75 දෙනෙකු පමණ පදිංචි කරවීමට හැකිවන තත්ත්වය කට 1987 දී මෙම සංකීර්ණය ඉදිරියට ගමන්කර තිබුනි. මෙහි කේන්ද්‍රය වශයෙන්, වගා කළ හෙක්ටයාර් 478 ක් සමග හෙක්ටයාර් 889 ක බිම් ප්‍රමාණයක් එළිපෙහෙළි කර තිබේ. දැනට මෙම වැඩ බිමෙහි නුපුහුණු සේවක යන් 700, පුහුණු හා තාක්ෂණික සේවකයන් 25, ලිපිකරුවන් 30 විදේශිකයන් දෙදෙනෙකු සමග පාලක නිලධාරීන් 15 සේවය කරති. 1988 මැයි/ජූනි යේදී පමණ පරිපාලන කාර්යාලය සංකීර්ණයේ වැඩ බිමට ගෙන ගොස් කර්මාන්ත ශාලාව ඉදිකිරීමේ වැඩ ආරම්භ කිරීමටත් 1990 අප්‍රියෙල් මාසයේදී පමණ නිෂ්පාදනය ආරම්භ කිරීමටත් අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතිය පිහිටුවීම සඳහා මෙම වැදගත් පියවර ගැනීමත් සමග ශ්‍රී ලංකාවේ නොදියුණු පළාතක් වන සියඹලාඬුව කළ එළිවී තිබේ.

**බඩ ඉරිඟු**

කාලගුණ තත්ත්වය බඩ ඉරිඟු වගා කිරීම සඳහා බෙහෙවින් හිතකර විය. මොණරාගල දිස්ත්‍රික්කය තුළ බඩ ඉරිඟු වගා කරන ලද බිම් ප්‍රමාණය මීට කලින් වර්ෂයේ දී වගා කරන ලද ප්‍රමාණයට වඩා 1:3 න් වැඩි විය. 1987 අවසානයේදී අපේක්ෂිත අති විශාල අස්වනු ප්‍රමාණය මිළට ගැනීම සඳහා වී අලෙවි මණ්ඩලය සියලු වැඩ කටයුතු සූදානම් කර තිබේ. වී අලෙවි මණ්ඩලය කිලෝග්‍රෑම් එකක් රු. 4/- ගණනේ මිළට ගන්නා අතර බඩ ඉරිඟු මිළට ගැනීම සඳහා යොදා ඇති වැඩ පිළිවෙල සම්බන්ධයෙන් කිසිම පැමිණිල්ලක් ලැබී නැත. ගොවිජන සේවා මගින් කිලෝග්‍රෑම් එකක් රු. 3.90 ගණනේද, සමූපකාර මගින් (ප්‍රවාහන ගාස්තු වශයෙන් කි.ග්‍රෑ. සඳහා ශත 25 ක් තබාගෙන) කිලෝ ග්‍රෑම් එකක් රු. 3.75 ගණනේද මිළට ගනු ලැබේ. ඉහත විස්තර කළ මිළට ගැනීමේ වැඩ පිළිවෙල සඵල වුවහොත් බඩ ඉරිඟු වගා කරන්නෝ සෑහීමකට පත්වනවාට සැකයක් නොමැත.

**දෙහි දොඩම්**

මොණරාගල දිස්ත්‍රික්කයේ දෙහි දොඩම් වගාව පුනරුත්ථාපනය කිරීම සඳහා විස්තර කරන ලද වැඩ පිළිවෙල ක්‍රියාත්මක කර තිබේ. අහිතකර කාලගුණ තත්ත්වයන් නිසා ඇතිවන ස්වභාවික අවහිරතා මධ්‍යයේ පලතුරු වගා කිරීමේ සහනාධාර යෝජනා ක්‍රමය දැන් ක්‍රියාත්මක වෙමින් පවතී.

අපනයනය සඳහා දෙහි මිළට ගැනීමෙහි නියැලී සිටින සමාගම දෙහි බහුලව ඇති කාලය තුළ කි.ග්‍රෑ. රු. 3/- සිට රු. 6/- අතර මිළකට දෙහි මිළදී ගනී. මෙම සමාගම ක්‍රියාත්මකවීමට පෙර, දෙහි බහුලව හටගන්නා කාලය තුළ ඒවා ගස්යට ඉදී වැටී කුණු වී ගිය බැවින්, මෙම මිළ ගණන් දෙහි වගා කරුවන්ට වාසිදායක වී ඇති බැව් පෙනේ. මෙම සමාගම දෙහි බහුලව හටගන්නා කාලය තුළ පමණක් දෙහි මිළට ගන්නා බැවින් පාරිභෝගික වෙළඳ පොලෙහි එයින් කිසිදු අහිතකර බලපෑමක් ඇති නො කෙරේ. සියල්ල සලකා බැලුවිට, 1987 වර්ෂය තුළ මෙම සමාගම මගින් දෙහි මෙට්‍රික් ටොන් 172 ක් මිළට ගෙන ඇති අතර, ඔවුන් මෙම ව්‍යාපෘතිය පිට පිටම අවුරුදු තුනක් සාර්ථක ලෙස පවත්වාගෙන ගොස් තිබෙ.

**වාරි මාර්ග**

වෙන්කර දෙනු ලැබූ සීමිත මූල්‍ය සම්පත් ප්‍රමාණය අනුව සලකා බලන කල, සමාලෝචනයට භාජනය වූ කාල පරිච්ඡේදය තුළ සුළු පරිමාණයේ වාරිමාර්ග ක්‍රමය පුනරුත්ථාපනය කිරීම සතුටුදායක විය. රටේ ආරක්ෂක තත්ත්වය අනුව, මුදල් වැය කිරීමේදී ඒ සඳහා ප්‍රමුඛත්වය දිය යුතු වූ බැවින්, විමධ්‍යගත අයවැය යටතේ යෝජිත මුදල් නොලැබුනි.

ලෝක බැංකුව මගින් මුදල් වැය කරන ලද මහ පරිමාණයේ පුනරුත්ථාපන වැඩ සටහන සතුටුදායක ලෙස ක්‍රියාත්මක කර තිබේ.

DEPARTMENT OF AGRICULTURE
CENTRAL
1 - 5 - 1990
LIBRARY
PERADENIYA

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## ඌව පළාත වාර්ෂික වාර්තාව — 1987

**සාමාන්‍ය කරුණු**

ඌව පළාතේ මැතිවරණ කොට්ඨාශ තුළ කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය ක්‍රියාත්මක වීම මගින් ග්‍රාමීය ගොවියාගේ ආර්ථිකය නංවාලීම සඳහා අර්ථවත් සේවයක් ඉටුකර ඇති බැව් වාර්තාගත කිරීමට කැමැත්තෙමි. පසුගිය අවුරුදු ගණනාවක් තුළ ලබාගත් අත්දැකීම් මගින් කෘෂිකාර්මික අංශයේ අපේක්ෂිත සම්බන්ධීකරණය වඩා උසස් මට්ටමකට නංවාලීමෙහිලා අප වෙත පැවරී ඇති කාර්යයන් ඉටු කිරීමට අපට හැකිවී තිබේ.

විශ්වාසය ගොඩනංවාලීමට හැකිවීම සම්බන්ධයෙන් ඌව පළාතේ කෘෂිකාර්මික කළමණාකරු වන්ට කෘතඥවිය යුතුයි. කළමණාකරුවන්ට මග පෙන්වීමෙහිලා නියෝජ්‍ය පළාත් අධ්‍යක්ෂවරුන් දෙදෙනා විසින් ඉටු කරන ලද මෙහෙය මෙහිදී අමතක කළ නොහැකිය.

සෑම අවස්ථාවකදීම කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලයට සහාය වූ දිසා ඇමතිවරුන් දෙදෙනාටත් සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන්ටත් මෙ අවස්ථාවේදී කෘතඥතාව පුද කරමි. දිස්ත්‍රික්ක දෙකේ දිසාපතිවරුන් විසින් දක්වන ලද මග පෙන්වීම අගය කිරීමක් වශයෙන් මෙහිලා වාර්තාගත කරමි.

කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද සියලුම කාර්යයන්හිදී සභාපතිතුමා විසින් මා වෙත දක්වන ලද මාර්ගෝපදේශකත්වය හා දිරිගැන්වීම මවිසින් අතිශයින් අගය කරන බව මෙහිලා සඳහන් නො කළහොත් මෙම සමාලෝචනය සම්පූර්ණ නොවනවා ඇත.

**මර්වින් එෆ්. ගුණවර්ධන**
පළාත් අධ්‍යක්ෂ – ඌව පළාත

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## උතුරු මැද පළාත වාර්ෂික වාර්තාව — 1987

### 1. වී

වර්ෂ 1986 දී බුසල් මිලියන 26.50 ක් වූ උතුරු මැද පළාතේ වී නිෂ්පාදනය වර්ෂ 1987 දී බුසල් මිලියන 21.06 දක්වා පහත වැටීමෙන් මුළු වී නිෂ්පාදනයේ බුසල් මිලියන 5.44 ක අඩු වීමක් පෙන්නුම් කළේය. වී නිෂ්පාදනය පහත වැටීම (මහවැලි එච් ප්‍රදේශයේ ඇතුළු) අනුරාධපුර දිස්ත්‍රික්කයේ සිදුවූ අතර, එම දිස්ත්‍රික්කය තුළ අඩුවූ වී නිෂ්පාදනය බුසල් මිලියන 5.45ක් විය. වර්ෂ 1986 දී නිෂ්පාදනය බුසල් මිලියන 14.90 ක් වූ අතර 1987 දී එය බුසල් මිලියන 9.45 ක් විය. 1985/86 මහ කන්නය තුළ උතුරු මැද පළාතේ කුඹුරු අක්කර 248,000 ක් වගා කරනු ලැබූ අතර 1986/87 මහ කන්නයේදී, වගා කළ කුඹුරු අක්කර ප්‍රමාණය 218,000 දක්වා අඩුවිය. 1987 යල කන්නයේදී ද වගා කරන ලද කුඹුරු ප්‍රමාණය 1986 දී වගා කරනු ලැබූ අක්කර 122,000 සිට අක්කර 86,000 දක්වා පහත වැටුනි.

1986 වර්ෂය තුළ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවියන් ලැබූ ආදායම සසඳා බලන කල මෙම වර්ෂය තුළ එම ගොවීන්ට, බුසල රු. 70/– ක් වූ සහතික මිළ ගණන් යටතේ රුපියල් මිලියන 380 පාඩුවක් දැරීමට නොහොත් බුසල රු. 84/– ක් වූ වාර්ෂික සාමාන්‍ය මිළ ගණන් යටතේ රුපියල් මිලියන 456 ක පමණ ආදායම පහත වැටීමක් දරා සිටීමට සිදුවිය. 1986/87 මහ කන්නය සඳහා අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් ලැබුණු සාමාන්‍ය අස්වැන්න අක්කරයකින් බුසල් 88.58 සිට අක්කරයකින් බුසල් 75 දක්වා අඩුවී තිබේ. එය එසේ වුවද, මහවැලි එච් ප්‍රදේශයේ අස්වැන්න අක්කරයකින් බුසල් 91.88 සිට අක්කරයකින් බුසල් 102.25 දක්වා වැඩිවී තිබේ. පොලොන්නරුව දිස්ත්‍රික්කයේද අස්වැන්න අක්කරයකින් බුසල් 94.56 සිට 95.27 දක්වා ස්වල්ප වශයෙන් වැඩි වී ඇත. දිස්ත්‍රික්ක දෙකෙහිම යල අස්වැන්න සුළු වශයෙන් පහත වැටී ඇත.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ (මහවැලි එච් කලාපය) හැර අක්කර 197,500 පමණ වූ අස්වද්දා ඇති මුළු කුඹුරු ප්‍රමාණයෙන් 1986/87 මහ කන්නයේදී සහ 1987 යල කන්නයේදී පිළිවෙලින් අක්කර 71,615 සහ අක්කර 9,268 කුඹුරු ප්‍රමාණයක් පමණක් වගා කරන ලදී. මෙය පිළිවෙලින් වගා කළ හැකි මුළු කුඹුරු ප්‍රමාණයෙන් 36% ක් හා 47% ක් වන්නේය. වර්ෂාපතනය හීනවීම, වගා කරන ලද කුඹුරු ප්‍රමාණය අඩුවීමට හා අස්වැන්න පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු විය. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවීන්ට බෙහෙවින්ම අවශ්‍ය වී ඇති මනා ජල සැපයුමක් සහතික නොකෙරෙන්නේ නම්, වාරිමාර්ග වැව් පුනරුත්ථාපනය කිරීමෙන් හෝ උසස් තත්ත්වයේ බිත්තර වී, පොහොර, කෘෂි රසායන හා ගොවිපල බලය ලබාදීමෙන් හෝ වඩා හොඳ ව්‍යාප්ති සේවා සලසාදීමෙන් හෝ එතරම් ප්‍රයෝජනයක් නොලැබෙනවා ඇත. අනුරාධපුරයේ සුළු පරිමානයේ වැව්වලින් ලැබෙන ජලයෙන් වගා කටයුතු කිරීම අඩමාන ක්‍රියාවක් වන අතර එය මුළුමනින්ම රඳා පවත්නේ අස්ථිරවූත් සදොස්වූත් වර්ෂාපතනය මතය. මහ කන්නයේදී පවා මහා පරිමාණයේ වැව් සිඳී යැමට ඉඩ තිබේ. වැව් බොහොමයක් අධික සංවර්ධනයට භාජනය වී ඇති අතර අක්‍රමවත් වගා කටයුතු නිසා ජලාශ්‍රිත ප්‍රදේශ සේදීගොස් විනාශ වී තිබේ. වගා කරන බිම් ප්‍රදේශය පුළුල් වීම නිසා ජලය සඳහා ඇති අවශ්‍යතාව වැඩිවී ඇති අතර වැව් වැඩි සංඛ්‍යාවක් රොන් මඩවලින් පිරීයැම නිසා එම වැව්වල ජලය රඳවා ගැනීමේ ධාරිතාව අඩුවී තිබේ. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවියන් සඳහා කළ හැකි එක් විසඳුමක් වන්නේ හිස්වී ඇති වැව් බොහොමයක් පිරීයන පරිදි උතුරු මැද පළාතේ ඇළ මාර්ගය ඉදිකිරීමයි. මහවැලි ජලය සැපයුම සහතික වීම නිසා පොලොන්නරුව දිස්ත්‍රික්කයට වඩා භාග්‍යමත් කාලයක් උදා වී තිබේ. මෙම වර්ෂයේ වී නිෂ්පාදනය බුසල් මිලියන 11.6 ක් වූ අතර එය කලින් වර්ෂයේ වී නිෂ්පාදනයට බොහෝ සෙයින් සමාන විය.

### 2. වෙනත් ක්ෂේත්‍ර බෝග

වෙනත් ක්ෂේත්‍ර බෝග අංශයේ ප්‍රතිඵල බලාපොරොත්තු වූ තරම් සතුටුදායක නොවීය. 1986/87 මහ කන්නයේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය නොවෙනස්ව පැවති අතර එය අක්කර 60,000 ක් පමණ විය. බඩ ඉරිඟු සහ සෝයා බෝංචි වගා කරන ලද බිම් ප්‍රමාණවල සුළු වැඩි වීමක් පෙන්නුම් කරමින් එම බිම් ප්‍රමාණ පිළිවෙලින් අක්කර 18,000 සහ 7,000 සිට අක්කර 21,000 සහ 11,000 දක්වා වැඩිවී තිබුණි. 1986 යල කන්නයේදී අක්කර 30,000 ක්වූ මිරිස් වගාව 1987 යල කන්නයේදී වයිරස රෝගයක් හේතු කොට ගෙන අක්කර 10,000 දක්වා පහත වැටුණි.

ප්‍රධාන වශයෙන් යල කන්නය ආරම්භයේදී ජලය නොමැති වීම නිසා කුඹුරු ඉඩම් වලින් 90% පමණ පුරන්ව පවතින අනුරාධපුර දිස්ත්‍රික්කයේ සුදුසු කුඹුරු ඉඩම්වල එම කාල සීමාව තුළ වෙනත් ක්ෂේත්‍ර බෝග වගා කළ හැකි බව අවබෝධ වී තිබේ. පලපුරුදුකම් ලත් දක්ෂ ගොවියන්ට වෙනත් ක්ෂේත්‍ර බෝග වගා කිරීමෙහි වැඩදායක ලෙස නියැලී තම තමන්ගේ පවුල්වල ආදායම වැඩිකර ගැනීමට හැකිවනු පිණිස කුඹුරු ඉඩම්වල කැනූ ළිං ඉදිකර ගැනීම සඳහා ආධාර සපයන ලෙස අප විසින් නිර්දේශ කරන ලදී. අවාසනාවකට මෙන් මේ සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රගතියක් ලබා නොමැත.

අළුත් බෝගවර්ග වගා කිරීමෙන් හා උසස් තත්ත්වයේ බීජ යොදා ගැනීමෙන් වෙනත් ක්ෂේත්‍ර බෝගවල නිෂ්පාදන මට්ටම නංවාලීමේ අවශ්‍යතාවයක් ඇති නමුදු මේ සම්බන්ධයෙන් ගෙන ඇති පියවර ඉතා අල්ප විය. ළිං ජලයෙන් වගා කෙරෙන විවිධ වර්ගයේ ඉඩම් සඳහා සුදුසු වගා සැලැස්මක් මෙතෙක් සැලසුම් කර නැත.

''වතුර පොම්ප සවිකර ඇති ස්ථානවල හා ඒ අවට, සාපේක්ෂ වශයෙන් සුළු බිම් ප්‍රමාණවල වෙනත් ක්ෂේත්‍ර බෝග වැඩි දියුණු කිරීම කෙරෙහි උනන්දුවක් දක්වන වගාකරුවන් කණ්ඩායම්වලට කුඩා වතුර පොම්ප සපයනු ලැබූ ප්‍රදේශ

වල උස්සාන වාරිමාර්ග ක්‍රම පිහිටුවීම අතිශයින් සාර්ථක වී තිබේ.'' '' උපරිම ආදායමක් ලබා ගැනීම සඳහා වැඩි අගයක් සහිත ආර්ථික බෝග වගා කළ යුතු අතර උපරිම අස්වැන්න ප්‍රමාණයන් ලබාගත හැක්කේ අතිශයින් දැඩි වූ පාලන ක්‍රම උපයෝගී කර ගැනීමෙන් පමණි''.

යල මහ දෙකන්නයේදීම කුඹුරු අක්කර දහස් ගණනක් වගා නොකර අතහැර දමා ඇති අතර, ආසියානු සංවර්ධන බැංකුව මගින් මුදල් යොදා ඇති අනුරාධපුර වියළි කලාපීය කෘෂිකාර්මික ව්‍යාපෘතිය යටතේ හෝ යෝජිත සහනාධාර යෝජනා ක්‍රමය යටතේ හෝ මෙම ඉඩම්වල කෘෂි ලිං ඉදි කිරීම සඳහා ණය පහසුකම් සලසාදීම සලකා බලා නොමැත. මෙම යෝජනා ක්‍රම සැලසුම්කර ඇත්තේ උස්බිම් වල වගා කටයුතු සඳහා වන අතර එය මාර්ගා ඇයතනය මගින් සොයා ගන්නා ලද කරුණුවලටත් නොගැඹුරු ලිං පිළිබඳ අප විසින් ලබා ඇති අත්දැකීම්වලටත් සම්පූර්ණයෙන්ම පටහැනි වන්නේය. වියයුතු ලෙසම, අනුරාධපුර වියළි කලාපීය කෘෂි කාර්මික ව්‍යාපෘතිය යටතේ යෝජිත කෘෂි ලිං 320 න් ලබා දී ඇත්තේ ලිං හතක් පමණි.

**3. ණය**

මධ්‍යම කාලීන ණය බෙදා දීම බෙහෙවින් අල්ප විය. මීට කලින් වාර්තා වලද සඳහන් කළ පරිදි ගොවියන් අවදානම වැඩි පිරිසක් වශයෙන් සලකා ඇති බැවින් ඔවුන්ට මුදල් ණයට දීමට බැංකු මැලිවේ. ඉල්ලුම්කරුවන් අනිවාර්ය යෙන්ම නුසුදුස්සන් බවට පත්වන හෙයින් ණයක් ලබා ගැනීම තවමත් ගැටළුවක් වී තිබේ.

ග්‍රාමීය ණය යෝජනා ක්‍රමවල ප්‍රගතිය පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

**(අ) අනුරාධපුර වියළි කලාපීය කෘෂිකාර්මික ව්‍යාපෘතිය**

වෙන්කරන ලද මුළු මුදල රුපියල් මිලියන 23.3 කි. 87.12.31 දිනට ණය දීම සඳහා උපයෝගී කරගෙන ඇත්තේ මෙම මුදලෙන් 11% ක් පමණක් වන අතර, 1987 වර්ෂය තුළදී ඇති ණය සංඛ්‍යාව දෙකක් පමණි.

**(ආ) කිරි පට්ටි සංවර්ධනය සඳහා ණය යෝජනා ක්‍රමය**

මෙම යෝජනා ක්‍රමය ආරම්භ කළ දිනයේ සිට 1987.12.31 දින දක්වා අනුරාධපුර හා පොලොන්නරු දිස්ත්‍රික්ක තුළ මුදා හැර ඇති ණය සංඛ්‍යාව 13 කි. 1987 දී අනුරාධපුර දිස්ත්‍රික්කයේ ණය මුදා හැර නොමැති අතර පොලොන්නරුව දිස්ත්‍රික්කයේ දී ඇත්තේ 2ක් පමණි.

**(ඇ) ආසියානු සංවර්ධන බැංකුව – ශ්‍රී ලංකා ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය**

1987.12.31 දින දක්වා පොලොන්නරුව දිස්ත්‍රික්කය තුළ රෝද දෙකේ ට්‍රැක්ටර් 688 ක් නිකුත් කරන ලදී. මෙයින් වැඩි සංඛ්‍යාවක් නිකුත් කරන ලද්දේ 1986 තුළදීය. බල ශක්තියෙන් ක්‍රියා කරන ඉසීමේ යන්ත්‍ර 38 ක්, වතුර පොම්ප 34 ක් සහ කැනූ ලිං 26 ක් ද 1986 දී ලබා දෙන ලදි. 1987 දී එකම ණය මුදලක්වත් ලබා දී නැත.

**(ඈ) දීප ව්‍යාප්ත ගොවිපල උපකරණ ණය යෝජනා ක්‍රමය**

වර්ෂය අවසානය වන විට අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්ක තුළ පිළිවෙලින් රෝද දෙකේ ට්‍රැක්ටර් ණය 131 ක් හා 61 ක් නිකුත් කර තිබුණි. අනුරාධපුර දිස්ත්‍රික්කයේ වතුර පොම්ප 34 ක් නිකුත් කරන ලදී.

**(ඉ) ණය යෝජනා ක්‍රම - ස්වයං රැකියා වැඩ පිළිවෙල, අනුරාධපුර දිස්ත්‍රික්කය**

මුළු මුදල් ප්‍රමාණයෙන් 29.4% ක් මේ දක්වා වැය කර තිබේ. මෙම යෝජනා ක්‍රමය යටතේ කැනූ ලිං 63 ක් සහ වතුර පොම්ප 100 ක් ලබා දී ඇත.

ණය පහසුකම් අවශ්‍ය ගොවීන් ලක්ෂ ගණනක් සිටින අතර අවුරුදු තුනක් නොහොත් හතරක් ඇතුළත සියයකට පමණ ණය පහසුකම් සලසා දීම දුප්පත් ගැමි ජනතාවට කිසිදු සහනයක් සලසන කාර්යයක් නොවන්නේය. එමගින් ඔවුන්ගේ තත්ත්වය කිසිම ආකාරයකින් උසස් නොකරයි. වැඩි පිරිසකට ණය පහසුකම් සලසාදීම අවශ්‍ය වන්නේය.

**4. පශු සම්පත්**

**කුකුළු පාලනය**—මෙම වර්ෂය තුළ කුකුළන් ඇති කිරීම ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වී ඇති අතර එය එන්ට එන්ටම පුළුල්වෙමින් පවතී. කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය මගින් මෙම වර්ෂය ඇතුළත උතුරු මැද පළාතේ ගොවීන් අතර එක් දිනක් වයසැති කුකුළු පැටවුන් 60,000ක් බෙදා දෙන ලදී. ආධාරක හා ව්‍යාප්ත සේවාවන් සහ ගොවීන් පුහුණු කිරීමේ වැඩ සටහන්ද සලසා දෙන ලදී. ගොවීන්ට, ප්ලාස්ටික් දියබඳුන්, ආහාර බඳුන් ආදී අවශ්‍ය උපකරණ සපයා දෙන ලදී. ලබා ඇති ප්‍රගතිය අතිශයින් දිරිගන්වන සුලු විය.

**සාමාන්‍ය කරුණු**

අප රටේ වනාන්තර සඳහා වූ වන විද්‍යාත්මක සීමාව එළඹ ඇති බැව් බලශක්ති විශේෂඥ හා ජනාධිපති උපදේශක ආචාර්ය මොහාන් මුනසිංහ විසින් මීට අවුරුදු කීපයකට පෙර අනතුරු හඟවන ලදී. වනාන්තර ප්‍රමාණය තවදුරටත් අඩුකරනු ලැබුව හොත් කෘෂිකාර්මික පදනමට හානිවන පරිදි අප රට කාන්තාරයක් බවට පත්කරන අතර, දැනට ක්‍රියාත්මක වන්නාවූද එමෙන්ම අනාගතයේ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන්නා වූද සියලු ජල විදුලි යෝජනා ක්‍රම අඩපන වනවා ඇත.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## උතුරු මැද පළාත වාර්ෂික වාර්තාව — 1987

නීති විරෝධී ලෙස වනාන්තරවල ගස් කැපීම තවදුරටත් සිදු කෙරෙන අතර, ජලාශ්‍රිත ප්‍රදේශවල හා ගං ඉවුරු වල රක්ෂිත වන දැන් නොමැති තරම්ය. ඉඩම් නොමැති ගැමියන් විසින් රක්ෂිත වන අනවසරයෙන් අයිතිකර ගැනීම නිත්‍යානුකූල කර තිබේ. මෙය අනුකරණය කිරීමට වෙනත් අයද උනන්දු කරවන සුලු බැවින් එය ප්‍රඥාගෝචර නොවන්නේය.

බිය ගන්වන සුලු වේගයකින් අපගේ වනාන්තර ක්‍රමයෙන් වැනසී යයි. වනාන්තර ආරක්ෂා කරන අයට එම වනාන්තර වල ආරක්ෂාව සහතික කළ නොහැකි වී ඇති බැව් පෙනේ.

ගොවීන්ට වඩා හොඳ තත්ත්වයේ බීජ හා බෝග වර්ග ලබා දිය යුතුයි. ගොවීන්ට උසස් තත්ත්වයේ බීජ ලබාදිය නොහැකි වීම ආහාර වැඩ පිළිවෙලේ දුර්වල තැන්වලින් එකක් වන බැව් පෙනේ. දුප්පත් ගොවීන්ට තමන්ට දැරිය හැකි ප්‍රමාණයේ ණය ලබා ගැනීමට පහසුකම් සැලැස්විය යුතුයි. අනුරාධපුර දිස්ත්‍රික්කයේ රොන්මඩ පිරි වැව් ජල ධාරිතාව වැඩි වන පරිදි එම වැව්වල ගැඹුරු කිරීම සලකා බැලිය යුතුවේ.

**ගාමණී වික්‍රමසිංහ**

පළාත් අධ්‍යක්ෂ – උතුරු මැද පළාත

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## වයඹ පළාත වාර්ෂික වාර්තාව — 1987

### වයඹ පළාත

### 1 සාමාන්‍ය තොරතුරු

වයඹ පළාතේ කෘෂිකාර්මික වැඩ කටයුතු කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය විසින් මැතිවරණ කොට්ඨාශ කළමණාකරුවන්ගේ මාර්ගයෙන් තවදුරටත් සම්බන්ධීකරණය කරන ලදී. දොඩන්ගස්ලන්ද මැතිවරණ කොට්ඨාශයේ කෘෂිකාර්මික කළමණාකරු වශයෙන් සේවය කළ ඩී. ජයසිංහ මහතා ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය පළාත් අධ්‍යක්ෂ වශයෙන් උසස් කරනු ලැබූ අතර එම ඇබෑර්තුවට 1987/4/9 දින සිට ආර්. ඩී. ජේ. රාජපක්ෂ මහතා පත් කරන ලදී. නිකවැරටිය මැතිවරණ කොට්ඨාශයේ කෘෂිකාර්මික කළමණාකරු වශයෙන් සේවය කළ එස්. ඒ. එල්. සේනානායක මහතා අවුරුදු 7 ක සේවයකින් පසු විශ්‍රාම ලැබුවේය.

### 2. පරිපාලන ඒකක/ව්‍යාප්ති යෙදවුම් කාර්ය මණ්ඩල

මැතිවරණ කොට්ඨාශ මට්ටමේ කෘෂිකර්මය පිළිබඳ ප්‍රාදේශීය ප්‍රතිපත්ති සකස් කිරීම අදාල ගොවිජන සේවා මධ්‍යස්ථාන මගින් සහ ගොවියන්ගෙන් හා නිලධාරීන්ගෙන් සමන්විත කමිටු මගින් තවදුරටත් පරිපාලනය කරන ලදී. පොහොර, කෘෂි රසායන, බීජ සහ උපකරණ යන අවශ්‍ය සියලු යෙදවුම් සපයන ලද්දේ මෙම මධ්‍යස්ථාන මගිනි. මධ්‍යස්ථාන සමහරක සිදුවූ වංචනික ක්‍රියා සොයාගෙන ඒ සම්බන්ධයෙන් නිසි පරිදි ක්‍රියා කළේ වී නමුදු ගොවි ජනසේවා කමිටු මධ්‍යස්ථානවල මුදල් තත්ත්වය තවදුරටත් සතුටුදායක ප්‍රගතියක් පෙන්නුම් කළේය.

### 3. වී වගාව

නියගය හේතුකොටගෙන පසුගිය වර්ෂයේදී මෙන් මෙම වර්ෂයේදීද වී වගාවට බරපතල හානි සිදුවිය. මහ කන්නය තුළ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වර්ෂාව පැවති නමුදු, පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවීන්ට තම වගා කටයුතු ආරම්භ කළ නොහැකි විය. සාමාන්‍යයෙන් ඇති නොවන ආකාරයේ පලිබෝධ උවදුරු මහ කන්නයේදී කුරුණෑගල දිස්ත්‍රිකක්යේ ඇතැම් ප්‍රදේශවල වසංගත මට්ටමෙන් ඇති වූ අතර, ඒ නිසාත්, නිසි පරිදි වර්ෂාව නොලැබීම නිසාත්, අස්වැන්න අඩුවනු ඇතැයි අපේක්ෂා කෙරේ. යල කන්නයේදී ඇති වූ අස්වැන්න හානි වීම හේතු කොටගෙන මහ කන්නයේදී බිත්තර වී වල සුළු හිඟයක් ඇති වූ අතර ගොවීන්ගේ අවශ්‍යතා සපුරාලීම පිණිස වෙනත් දිස්ත්‍රික්කවලින් බිත්තර වී ලබා ගැනීම සඳහා කටයුතු සැලැස්වීමට සිදුවිය. කොන්ත්‍රාත් ගොවියන් විසින් බිත්තර වී නිපදවීමේ ද පසුබෑමක් මෙම වර්ෂය තුළ දක්නට ලැබුණි.

වගා කරන ලද කුඹුරු ප්‍රමාණය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| 1987 යල කන්නය | | | | කුරුණෑගල දිස්ත්‍රික්කය | පුත්තලම දිස්ත්‍රික්කය |
|---|---|---|---|---|---|
| වගා කල කුඹුරු ප්‍රමාණය (අක්කර) | ... | ... | ... | 85,448 | 4,122 |
| අස්වනු නෙලා ගත් කුඹුරු අක්කර | ... | ... | ... | 45,023 | 2,409 |
| සාමාන්‍ය අස්වැන්න (අක්කර/බුසල්) | ... | ... | ... | 64.58 | 54.42 |
| 1987/88 මහ කන්නය | | | | | |
| වගා කළ කුඹුරු ප්‍රමාණය (අක්කර) | ... | ... | ... | 174,815 | 21,160 |

### 4. පොල්

1986 සිට නොකඩවා පැවති නියගය හේතුකොට ගෙන මෙය පොල් කර්මාන්තයට අහිතකර වර්ෂයක් වූ අතර, අස්වැන්න බොහෝසෙයින් අඩුවීම හා මිළ ගණන් පහත වැටීම හේතු කොටගෙන ඉඩම් හිමියන්ට අතිශය අවාසිදායක තත්ත්වයක් උදා විය. පොල් වගා මණ්ඩලයේ තවාන්වලටද නියගයෙන් හානි සිදුවූ අතර, පොල් පැල සඳහා මහ කන්නය තුළ පැවති පෙර නොවූ විරු ප්‍රමාණයක/අධික ඉල්ලුම හේතු කොටගෙන සම්පූර්ණ පැල අවශ්‍යතාව සපුරාලිය නොහැකි විය. සැපයිය නොහැකි වූ පොල් ප්‍රමාණය 1988 වර්ෂය තුළ සැපයීමට කටයුතු යොදා තිබේ. පොල් වගා මණ්ඩලයේ සහනාධාර යෝජනා ක්‍රම යටතේ අක්කර 6,496 ක නව/යටි වගා කිරීම, අක්කර 10,933 ක් පුනරුත්ථාපනය කිරීම සහ පොල් පැල 177,576 ක් බෙදා දීම නිම කරන ලදී. ජනතා වතු සංවර්ධන මණ්ඩලයට ,ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සහ පොල් වගා මංඩලයට අයත් රජයේ ඉඩම් වලටද නියගෙන් හානි සිදුවූ අතර, මෙම තත්ත්වය තව දුරටත් පැවතුනහොත් පොල් කර්මාන්තයට බරපතල හානියක් සිදුවිය හැකි බවට භීතියක් පවතී.

### 5 සුළු අපනයන බෝග

ප්‍රධාන වශයෙන් අතුරු බෝගයක් ලෙස පවත්වාගෙන යනු ලබන සුළු අපනයන බෝග වගාවටද මෙම වර්ෂය තුළ හානිකර බලපෑමක් ඇතිවිය. සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවේ සහනාධාර යෝජනා ක්‍රම යටතේ ගොවීන්ට පැල 288,000 ක් නිකුත් කර, අක්කර 653 කෝපි ,ගම්මිරිස් සහ කොකෝ අතුරු බෝග වශයෙන් වගා කරන ලදී. මෙහි

දී ද, වර්ෂාව නොමැති මාසවලදී තම වගාවන් රැකබලා ගැනීම සඳහා කිසියම් විශේෂ සහනාධාර යෝජනා ක්‍රම ඇති කිරීම කෙරෙහි දෙපාර්තමේන්තුව විසින් දැඩි අවධානය යොමු කළ යුතුව තිබුණි.

**6. පලතුරු වගාව**

පලතුරු බෝග වගා කිරීම සඳහා වැඩි ඉල්ලුමක් පවතින බැව් පෙනී ගිය අතර, ගොවියන් විසින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහනාධාර යෝජනා ක්‍රමවලින් උපරිම ප්‍රයෝජන ලබා ගන්නා ලදී. වර්ෂය තුළ ඉඩම් අක්කර 292 ක අඹ, දොඩම්, දෙහි, වැල් දොඩම් සහ ගස් ලබු වගා කරන ලදී. කිසියම් සංවිධානාත්මක වැඩ පිළිවෙලක් යටතේ කෘෂිකාර්මික බෝග වගා කිරීම කෙරෙහි තම අවධානය යොමු කර සිටින ගොවියන්ට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් තව දුරටත් බරපතල වීමට ඉඩ ඇති බැව් අපේක්ෂා කෙරේ. පළාත තුළ පළතුරු සහ එළවලු සකස් කිරීමේ ජංගම ඒකක පිහිටුවීම කෙරෙහි සැලකිල්ල යොමු කළ යුතුවේ.

**7. අතිරේක ආහාර බෝග / එළවළු**

වගා කළ බිම් ප්‍රමාණය :

| | | | |
|---|---|---|---|
| කුරුණෑගල දිස්ත්‍රික්කය | ... | අක්කර | 96,045 |
| පුත්තලම දිස්ත්‍රික්කය | ... | අක්කර | 33,662 |
| එකතුව | | | 129,707 |

මීට කලින් අවුරුදු සමග සසඳා බලන කළ මෙම වර්ෂය තුළ වගා කටයුතු සතුටුදායක බැව් පෙනී යයි. පුත්තලම දිස්ත්‍රික්කය, රතුලූනු හා අමු මිරිස් වගාවේ වර්ධනයක් තව දුරටත් පෙන්නුම් කරයි. කල්පිටිය ප්‍රදේශයේ අර්තාපල් වගා කිරීම ආරම්භ කරනු ලැබූ අතර, එම වගා කටයුතුවලින් සාර්ථක ප්‍රතිඵල ලැබී ඇත. මුං ඇට වගා කිරීම වැඩි වීමත්, සතොස මැදිහත් වීම නිසා නිෂ්පාදන සඳහා සාධාරණ මිළක් ලැබීමත් මෙහිදී දක්නට ලැබුනු විශේෂ ලක්ෂණ විය. එය එසේ වුවද, කව්පි, බඩ ඉරිඟු සහ එළවළු විකිණීමේදී අළෙවිය පිළිබඳ ප්‍රශ්නවලට මුහුණදීමට සිදුවිය.

**8. අළෙවි කිරීම / අපනයන නිෂ්පාදන ගම්**

කෘෂිකාර්මික නිෂ්පාදන අළෙවි කිරීම අතර මැදියන්ගේ මාර්ගයෙන් පෞද්ගලික අංශය මගින් තවදුරටත් සිදු කරනු ලැබේ. කුරුණෑගල දිස්ත්‍රික්කයේ අපනයන නිෂ්පාදන ගම් විසින් අන්නාසි, අමු මිරිස් හා ඉරටු අළෙවි කිරීමෙන් සතුටු දායක ප්‍රගතියක් ලබා ගන්නා ලදී. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ අන්නාසි, චීන ඉඟුරු, කෙඳි නිෂ්පාදන පලතුරු සහ අමු මිරිස් කිලෝ ග්‍රෑම් 13,57286 ක් අපනයනය කිරීමෙන් රුපියල් 1,11,66,112/- ක ආදායමක් උපයා ගන්නා ලදී. එතකුදු වුවත්, අපනයනකරුවන් සහ අපනයන නිෂ්පාදන ගම් අතර පවතින සම්බන්ධීකරණය තවමත් ප්‍රමාණවත් නොවේ. තමන්ට ගෙවනු ලබන මිළ ගණන් පිළිබඳ ගොවියන්ගේ සිත්තුළ තවමත් සැකයක් පවතින බැවින් මෙම අංශය කෙරෙහි අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ප්‍රමුඛත්වය දිය යුතු වන්නේය.

**9. උපකරණ / ගොවිපල බලය**

වගා කටයුතු පිළිබඳව ඇති තීව්‍රතාව මඳවීම හේතුකොටගෙන උපකරණ සඳහා ඇති ඉල්ලුම බොහෝ සෙයින් අඩුවිය. මෙම අඩුවීමට හේතුවූ තවත් කරුණක් නම්, විදේශ විනිමය අනුපාත ඉහළ යෑම හේතුකොටගෙන උපකරණවල මිළ ගණන් හදිසියේ වැඩි වීමයි. ඒකාබද්ධ කළ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති අවසන් කිරීම නිසා බැංකුවල ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කළ නොහැකි වූ අතර එම කරුණද ගොවීන්ගේ මිළට ගැනීමේ හැකියාව කෙරෙහි එක්තරා බලපෑමක් ඇති කළේය. උපකරණ නිෂ්පාදනය කිරීමේ හා ආනයනය කිරීමේ නව නියෝජිතයන් අළුත් එමෙන්ම වඩා දියුණු තත්ත්වයේ උපකරණ සහිතව මෙම ක්ෂේත්‍රයට අවතීර්ණයවීම දිරිමත් කරවන ලක්ෂණයක් විය. වැඩි තරඟකාරී තත්ත්වයක් ඇතිවීමත් සමග අනාගතයේදී ගොවීන්ට වඩා හොඳ සේවාවක් සැලසෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**10. බැංකු වැඩ කටයුතු / ණය යෝජනා ක්‍රම**

| | ණය සංඛ්‍යාව | මුදල - රුපියල් |
|---|---|---|
| 1. වගා/පොල් පොහොර අතිරේක ආහාර බෝග | 5,237 | 2,37,42,492/- |
| 2. උපකරණ | 170 | 35,90,365/- |
| 3. සත්ව පාලනය | 466 | 26,05,320/- |

ඒකාබද්ධ කළ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය හා විශේෂ ණය යෝජනා ක්‍රම අවසන් කිරීමත් සමග, කෘෂිකාර්මික උපකරණ කෙරෙහි විශේෂ අවධානයක් දක්වමින්, ණය දීමේ සැලකිය යුතු අඩුවීමක් ඇති වී තිබේ. නියඟය හේතු කොටගෙන වගා ණය දීමත් පොහොර ණයට දීමත් අඩු මට්ටමක පැවතුනි.

**11. පශු සම්පත් සංවර්ධනය**

පශු වෛද්‍ය තනතුරු අවුරුද්ද පුරාම නොකඩවා ඇබෑර්තු වී පැවතීම හේතු කොටගෙන කුරුණෑගල දිස්ත්‍රික්කයේ පශු සම්පත් සංවර්ධනයට බාධා පැමිණියේය. දෙපාර්තමේන්තුව වෙත නැවත නැවතත් ඉල්ලීම් ඉදිරිපත් කරනු ලැබුවේ වී නමුදු ඇබෑර්තු පුරවනු නොලැබූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් සත්ත්ව සෞඛ්‍යය, එන්නත් කිරීම ආදී වැඩ කටයුතු නොසල

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## වයඹ පළාත වාර්ෂික වාර්තාව — 1987

කා හරින ලදී. ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබුනු මුදල්වලින් පශු වෛද්‍යවරුන් සඳහා නිවාස සහ කාර්ය ලබා දෙන ලදී.

**කුකුළු පාලනය**

බිත්තරවල සහ මස් කුකුළන්ගේ මිළ ගණන් තියුණු ලෙස අඩු වැඩිවීම හේතුකොටගෙන කුකුළන් ඇති කරන බොහෝ දෙනෙකුට තම කුකුළු ගොවිපළවල් වසා දැමීමට සිදුවිය. කුකුළන් ඇති කිරීමේ ව්‍යාපාරයෙහි නිතර නිතර අඩු වැඩි වීමේ ස්වභාවයක් පවතින බව පෙනෙන අතර මෙය වර්ෂය ආරම්භයේදී පැහැදිලිවම දක්නා ලදී. වර්ෂය ආරම්භයේ පැවති වැඩි මිළ ගණන් හේතුකොටගෙන ගොවීහු මෙම කර්මාන්තයට අවතීරණ වූ අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් වර්ෂයේ පසු භාගයේදී කුකුළු නිෂ්පාදනවල අතිරික්තයක් ඇතිවීම නිසා තම ගොවිපළවල් වසා දැමීමට ගොවීන්ට සිදුවිය. ඉල්ලුම සපුරාලීම සඳහා කුකුළු කර්මාන්තය නිසි පරිදි සකස් නොකළහොත් මෙම කර්මාන්තය අවුරුදු පතා මේ ආකාරයෙන්ම පවතිනවා ඇත. ගොවීන්ට අවශ්‍ය කුකුළු පැටවුන් රජයේ ගොවිපල වලින් සහ වෙනත් බලය ලත් නියෝජිතයන් විසින් සපයන ලදී. කුකුළන් බෝ කරන්නන් ගේ සමිති පිහිටවනු ලැබූ නමුදු මෙම කර්මාන්තය දියුණු කිරීමෙහිලා එම සමිතිවලින් ඇති වූ බලපෑම ඉතා අල්ප විය.

**එළුවන්/බැටළුවන්**

මේ සඳහා වූ ඉල්ලුමේ සැලකිය යුතු වැඩිවීමක් පෙනෙන්නට තිබුණු අතර පොල් වතු හිමියන් බොහෝ දෙනෙක් තම ඉඩම්වල එළුවන් හා බැටළුවන් බෝකිරීම ආරම්භ කර තිබේ. මැතිවරණ කොට්ඨාශ බොහොමයක සුළු ගොවීන්ට තම ගෙවතුවල සතුන් බෝ කිරීම සඳහා විමධ්‍යගත අයවැය යටතේ මුදල් ලබා දී තිබේ. මෙම ව්‍යාපෘති යටතේ මුදල් 302 ක් සපයන ලදී. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු වට අයත් කොට්ටුකච්චියේ එළු ගොවිපල සතුටුදායක ලෙස තවදුරටත් දියුණුවෙමින් පැවතුනි.

**කිරි පට්ටි සංවර්ධනය/කිරි එක්රැස් කිරීම**

නොකඩවා නියඟය පැවතියේ වී නමුදු පළාතේ කිරි එක්රැස් කිරීම, කලින් වර්ෂය හා සසඳා බැලීමේදී මෙම වර්ෂය තුළ ලීටර් 6,00,000 න් වැඩි වී තිබුණි. සීමා සහිත නෙස්ලේ ලංකා සමාගමෙන් ලැබුණු සහාය යටතේ ගොවීන්ට කිරි දෙනුන් ලබා දුන් අතර ගම් මට්ටමේ අතිරේක කිරි එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවන ලදී. පොල් ත්‍රිකෝණයේ කිරි සංගමය මගින් ද තම කිරි සැපයුම් කරුවන්ට අවශ්‍ය සහනාධාර සලසා දෙන ලදී. වයඹ පළාතේ ගවයන් විශාල වශයෙන් කුර හා මුඛ රෝගවලට භාජනය වූ අතර, එන්නත් හා පශු වෛද්‍ය කාර්ය මණ්ඩල හිඟවීම හේතුකොටගෙන එම රෝග වසංගත මට්ටමට වර්ධනය විය.

එක් රැස් කරනලද මුළු කිරි ප්‍රමාණය

| | | | |
|---|---|---|---|
| 1986 | ... | ලීටර් මිලියන | 7.8 |
| 1987 | ... | ලීටර් මිලියන | 8.4 |

බෙදා දෙන ලද මුළු සතුන් සංඛ්‍යාව:

| | | |
|---|---|---|
| වස්සන් | ... | 328 |
| දෙනුන්/වැස්සියන් | ... | 242 |

**ඌරන් ඇති කිරීම**

ඌරන් ඇති කිරීම පුත්තලම දිස්ත්‍රික්කයට සීමා වී තිබේ. ප්‍රමාණවත් අලෙවි මධ්‍යස්ථාන නොමැතිවීම හේතුකොට ගෙන අලෙවිය පිළිබඳ ප්‍රශ්නවලට මුහුණදීමට ගොවීන්ට සිදුවිය.

**මිරිදිය මසුන් බෝ කිරීම**

ගම්බද වැව්වල මසුන් බෝ කිරීමේ සැලකිය යුතු ප්‍රගතියක් පෙනෙන්නට තිබුණු අතර, ගොවීන්ගෙන් ලැබුණු වැඩි ඉල්ලුම සපුරාලීමට මිරිදිය ධීවර දෙපාර්තමේන්තුවට නොහැකි විය. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය වැව් තිහකට මත්ස්‍ය පැටවුන් 2,00,000 ක් මුදා හරින ලදී. පෞද්ගලික ගොවීන් ගේ මාර්ගයෙන් අතිරේක පොකුණු 136 ක් පිහිටුවන ලදී.

12. **කජු වගා කිරීම**

මෙම වර්ෂය තුළ පළාතේ කරන ලද ව්‍යාප්ත වැඩ සම්බන්ධ යෙන් කජු සංස්ථාවට ප්‍රශංසා කළ යුතුයි. දැනට කර ඇති වගාවන්ගෙන් ලැබෙන අධික අස්වැන්න ප්‍රමාණයන් හේතු කොටගෙන ගොවියන් විසින් විශාල උනන්දුවක් දක්වා ඇති සහනාධාර යෝජනා ක්‍රම යටතේ අක්කර 1,630 ක කජු වගා කරන ලදී. ගොවියන් විසින් ලබාගන්නා ලද අස්වැන්න දිරිමත් කරවන සුලු විය. අනාගතයේදී විශාල ප්‍රමාණ වශයෙන් නිෂ්පාදනය කරනු ලැබිය හැකි මෙම වගාව සඳහා නිසි අලෙවි මාර්ග සකස් කිරීම ප්‍රඥාගෝචර වන්නේය. ආන්තික කාල ගුණ තත්ත්වයන් හේතුකොටගෙන සෙසු වගාවන් නිශ්ඵල වුවත් කජු වගාවෙන් ස්ථිර ආදායමක් ලබාගත හැකිවන බැවින්, මෙම පළාතේ වියළි කලාපීය ප්‍රදේශවල ගොවීන් කජු වගාකිරීම කෙරෙහි තවදුරටත් උනන්දු කරවිය යුතු වන්නේය.

**සමාප්තිය**

මැතිවරණ කොට්ඨාශ තුළ කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය ක්‍රියාකාරිවීම මගින් ග්‍රාමීය ගොවියාගේ ජීවන තත්ත්වය නගා සිටුවීමෙහිලා ඵලදායී මෙහෙයක් ඉටුවී ඇති බැව් මෙහිලා සඳහන් කිරීමට හැකිවීම සතුටට කරුණකි. මේ සම්බන්ධ යෙන් සම්පූර්ණ ප්‍රශංසාව හිමි විය යුත්තේ කැපවීමකින්

යුක්තව තම ශ්‍රමය වැයකරමින් සේවය කළ කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලයටය. මා වෙත දක්වන ලද සම්පූර්ණ සහයෝගය හා අඛණ්ඩ සහාය සම්බන්ධයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටත්, අදාල දෙපාර්තමේන්තු වල නිලධාරීන්ටත්, සෙසු ආයතනවලටත් කෘතඥතාව පුදකරමි. අවසාන වශයෙන් මගේ වැඩ කටයුතු ඉටු කිරීමෙහි ලා මග පෙන්වන ආලෝකයක් මෙන් සහාය වෙමින් උපදෙස් දුන් මෙම අධිකාරියේ සභාපති තුමාටත්, මගේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වරුන්ටත්, කළමණාකාරවරුන්ටත් මගේ කෘතඥතාව පළකරමි.

ඒ. ජී. කුමාරගේ
පළාත් අධ්‍යක්ෂ - වයඹ පළාත

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## මධ්‍යම පළාත වාර්ෂික වාර්තාව — 1987

### 1. පරිපාලනය

මධ්‍යම පළාතේ සෙන්කඩගල හා මහනුවර මැතිවරණ කොට්ඨාශ හැර සෙසු සියලුම මැතිවරණ කොට්ඨාශ යෝජිත වැඩ සටහනට අනුකූලව, තවදුරටත් කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ සේවාවන්ට භාජනය කරන ලදී.

දිස්ත්‍රික්ක පරිපාලනය සඳහා, දිස්ත්‍රික්ක තුන භාර නියෝජ්‍ය පළාත් අධ්‍යක්ෂවරු තිදෙනෙක් පත් කරනු ලැබ සිටිති. වැඩ කටයුතු නිසි පරිදි පවත්වාගෙන යැම සඳහා අවශ්‍ය මැතිවරණ කොට්ඨාශ කාර්ය මණ්ඩල පත්කර තිබේ.

### 2. ගොවි ජන සේවා මධ්‍යස්ථානය

ග්‍රාමීය අංශයේ කෘෂිකාර්මික සංවර්ධනය උසස් තත්ත්වය කට නංවාලීමෙහිදී මුහුණ පෑමට සිදුවන අවශ්‍යතාවන්ට අනුව ගොවි ජන සේවා කාර්යයන් ක්‍රමයෙන් වැඩිදියුණු කර තිබේ. ගොවි ජන සේවා කමිටු තවදුරටත් කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක වෙමින් පැවතුනි. එය එසේවුවද, නොසලකා හැර ඇති කෘෂිකාර්මික ඉඩම් අදීක්ෂණය කිරීමෙහිලා තාක්ෂනික සේවා කමිටු මගින් සේවාවන් ඉටු නොවූ බව නැවත නැවතත් සඳහන් කළ යුතුවේ. අවශ්‍ය යෙදවුම් මෙම මධ්‍යස්ථාන මගින් සපයන ලදී.

### 3. වගා කටයුතු

**වී.** යල මහ දෙකන්නයේදීම පැවති අයහපත් කාලගුණය දිස්ත්‍රික්ක තුනේම වී වගාව කෙරෙහි බලපෑම හේතුකොට ගෙන මෙම අංශයේ වගා කටයුතුවලට මෙන්ම නිෂ්පාදන කටයුතුවලටද අහිතකර තත්ත්වයක් උදාවිය. එම අහිතකර තත්ත්වය අස්වැන්න කෙරෙහි එක එල්ලේම බලපෑවේය.

### 4. රුක් වගා අංශය (තේ, පොල් සහ සුළු අපනයන බෝග)

විවිධ බෝග සම්බන්ධයෙන් වගකිව යුතු අදාල දෙපාර්තමේන්තු මගින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන සහනාධාර වැඩ පිළිවෙලවල් යටතේ ලබා ඇති මෙම අංශයේ ප්‍රගතිය සතුටුදායක විය. නඩත්තු හා පරිපාලන වියදම් අධිකවීම හා ආදායම අඩුවීම හේතුකොටගෙන වර්ධන වේගය මන්දගාමී වුවද, මහනුවර හා මාතලේ යන දිස්ත්‍රික්කවල පැවති සාමාන්‍ය කාල ගුණ තත්ත්වය, මෙම අංශයේ වගා කටයුතු වලට හිතකර විය. කලින් වර්ෂයේ මිළ ගණන් හා සසඳා බැලීමේදී, මෙම වර්ෂයේ පසු භාගයේ නිෂ්පාදන මිළ ගණන් වල වර්ධනයක් පෙනෙන්නට තිබුණි. කුඩා වතු හිමියන්ට මෙය හිතකර, එමෙන්ම ලාභදායක අංශයක් බවට පත්වන පරිදි, මෙම මිළ ගණන් වැඩිවීම තවදුරටත් රඳා පවතිනු ඇතැයි අපේක්ෂා කරමි. මධ්‍යම පළාතේ වගා කටයුතු සඳහා යොදා ගත හැකි ඉඩම් ප්‍රමාණය සීමාසහිත වන නිසා, සහනාධාර ක්‍රම ව්‍යාප්ත කිරීමද, නියත වශයෙන්ම සීමා සහිත වන බැවින්, දැන් අවශ්‍යවන්නේ, වඩා වේගවත්වූත්, විද්‍යාත්මකවූත් වගා ක්‍රමයකි.

#### දුම්කොළ

වගාකරුවන් මෙන්ම නිෂ්පාදකයන් විසින්ද කර ඇති සහතිකවීම් පසෙක තිබියදී, කඳුබෑවුම්වල මෙන්ම ඇතැම්විට අංශක 60 වැඩි බෑවුම් සහිත කඳුවල තවදුරටත් දුම්කොළ වගා කිරීම කනගාටුවට කරුණකි. මයිලපිටිය, හුන්නස් ගිරිය, හඟුරන්කෙත හා වලපනේ යන ප්‍රදේශවල අනවසර යෙන් දුම්කොළ වගා කිරීම තවදුරටත් කරගෙන යනු ලැබේ. දුම්කොළ වගා කෙරෙන ඉඩම්වලින් විශාල ප්‍රමාණයක එක එල්ලේම නොහොත් අනියම් වශයෙන් මහවැලි ජලාශ්‍රිත ප්‍රදේශය ආසන්නයේ පිහිටා ඇති නමුදු පස සංරක්ෂනය කිරීමේ විධිමත් වැඩ පිළිවෙලක් යොදා ඇති බවක් නොපෙනේ. මෙම තත්ත්වය තවදුරටත් පවත්වාගෙන යැමට ඉඩ ඇරිය හොත් ඉඩම් පරිහරණය පිළිබඳ නිසි පාලනයක් නොමැති වීමට ඉඩ තිබේ. මෙම වගා අංශය ප්‍රතිඵලදායක ලෙස පාලනය කිරීමට නම් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පස සංරක්ෂණය කිරීමේ හා දුම්කොළ අංශවලට අතිරේක කාර්ය මණ්ඩල ලබාදිය යුතුවේ.

#### අතිරේක ආහාර බෝග

මහනුවර හා මාතලේ දිස්ත්‍රික්කවල යල කන්නයේ මෙන්ම මහ කන්නයේද අතිරේක ආහාර බෝග වගා කිරීමේ වර්ධන යක් පෙනෙන්ට තිබුණි. මෙම වැඩිවීම විශේෂයෙන්ම සිදුවී ඇත්තේ බඩ ඉරිඟු, සෝයා හා බොම්බයි ලූනු සම්බන්ධයෙනි. යල කන්නයේ පැවති අධික වියළි කාලගුණ තත්ත්වය හේතු කොටගෙන සමාලෝචනයට භාජනය වූ කාල සීමාව තුළ මිරිස් වගා කළ බිම් ප්‍රමාණයේ අඩුවීමක් පෙන්නුම් කළේය. අස්වනු නෙලා ගන්නා අවස්ථාවේදී එම නිෂ්පාදන සඳහා සතුටුදායක අලෙවි මිළක් ලබාගත හැකි නම්, විශේෂයෙන්ම සෝයා, බඩ ඉරිඟු, බොම්බයි ලූනු සහ මිරිස් වගාවන් ව්‍යාප්ත කිරීමට බෙහෙවින් ඉඩකඩ තිබේ.

### 5. පොහොර

වී වගා අංශයේ පොහොර භාවිතා කිරීම තවදුරටත් ජනප්‍රිය වෙමින් පවතින අතර, පොහොර යෙදීම සඳහා නිර්දේශ කර ඇති ක්‍රම පිළිබඳව මනා අවබෝධයක් ගොවීහු දැන් ලබා සිටින බව පෙනේ. එහෙත් මහ කන්නය සඳහා යූරියා සහ ටී.ඩී.එම්. සැපයුමේ අඩුවක් ඇති වූ බව කනගාටුවෙන් සඳහන් කළ යුතුවේ. මෙම අඩුව අස්වැන්න කෙරෙහි එක එල්ලේම බලපානවා ඇත. වගාකර ඇති ඉඩම් ප්‍රමාණය අනුව සලකා බලන කල සුළු අපනයන බෝග අංශය හා කුඩා තේ ඉඩම් අංශය මගින් පොහොර භාවිතා කිරීම සතුටු දායක වූයේ යැයි සඳහන් කළ නොහැක. පොහොර සංස්ථාව මගින් මෙන්ම පොහොර ලේකම් කාර්යාංශය මගින්ද ආදර්ශ ඉඩම් කට්ටි පිහිටුවීමෙන් මෙම වැදගත් අංශ දෙක සඳහා පොහොර භාවිතා කිරීම ජනප්‍රිය කිරීම කෙරෙහි වැඩි අවධානය යොමු කළ යුතුවේ.

**6. ග්‍රාමීය ණය**

මීට කලින් වර්ෂ හා සසඳා බලන කල මෙම වර්ෂය තුළ මෙම අංශයේ සැලකිය යුතු ප්‍රගතියක් පෙනෙන්නට තිබේ. සීමිත ණය ප්‍රතිපත්තිවල සාධාරණ ලිහිල් කිරීමක් ඇති කිරීමේ අරමුණ ඇතිව රාජ්‍ය බැංකු මගින් ග්‍රාමීය කෘෂිකාර්මික ණය පිළිබඳව ආකල්පයේ කිසියම් වෙනසක් ඇති කිරීම මෙම ප්‍රගතියට හේතු වී යැයි සැලකිය හැක.

මීට කලින් පැවති තත්ත්වය හා සසඳා බලන කල මෙම වර්ෂය තුළ ගොවියන් විසින් ණය ආපසු ගෙවීමේ ප්‍රගතියක් පෙනෙන්නට තිබුණි. ග්‍රාමීය ගොවියා උදාර එමෙන්ම ආත්ම ගෞරවයකින් යුත් සාඩම්බර පුද්ගලයකු වන අතර, ආයතනමය ණය ගනුදෙනු නිසි පරිදි පරිපාලනය කර ක්‍රියාත්මක කළහොත්, ඔහු එම ණය ආපසු ගෙවීම පැහැර හරින්නේ නම් එය කලාතුරකින් සිදුවිය හැක්කක් බව අමතක නොකළ යුතුයි. අවශ්‍ය වන්නේ රාජ්‍ය බැංකු දෙක මගින් පරිපාලනය හා ව්‍යාප්ති නිලධාරීන් වැඩි සංඛ්‍යාවක් සේවයෙහි යෙදවීම පමණි. ග්‍රාමීය අංශයේ මුදල් ඉතිරි කිරීමේ පුරුද්ද සම්බන්ධයෙන් සඳහන් කළ යුත්තේ සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ සතුටුදායක වර්ධන වේගයක් වාර්තා වී ඇති බවයි. මෙය සංවර්ධනයේ දර්ශකයක් වශයෙන් සැලකුව හොත්, මැතිවරණ කොට්ඨාශ තුළ මුදල් සංචයවීම හිතකර ලක්ෂණයක් වන්නේය.

**7. වාරිමාර්ග**

වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව විසින් මහ පරිමාණයේ හා සුළු පරිමාණයේ වාරි මාර්ග අංශ යටතේ ක්‍රියාත්මක කරන ලද පුනරුත්ථාපනය කිරීමේ, ඉදි කිරීමේ හා නඩත්තු කිරීමේ වැඩ පිළිවෙලවල් මගින් වඩා දියුණු වූ වාරිමාර්ග හා ජලාප්‍රවාහන පහසුකම් සලසා දෙන ලදී. වැව් අමුණු හා ඇළ මාර්ග පුනරුත්ථාපනය සඳහා ප්‍රමුඛතාව දෙන ලදී. වාරිමාර්ග ක්‍රම නඩත්තු කිරීමෙහිලා වැඩදායක ප්‍රගතියක් ලබා ඇති අතර, එය හේතුකොට ගෙන අමතර බිම් ප්‍රමාණයක් වගා කර එමගින් කෘෂි නිෂ්පාදන වල වර්ධනයක් ඇති කිරීමට හැකි වී තිබේ. පසුගිය අවුරුදු හත ඇතුළත සුළු වාරිමාර්ග වෙනුවෙන් වැය කරන ලද මුදල්, ගම් මට්ටමේ බලපෑමක් ඇති කර තිබෙන අතර ගම් මට්ටමේදී වාරිමාර්ග ප්‍රශ්න විසඳීම සඳහා ඵලදායක ක්‍රියා මාර්ගයක් අනුගමනය කර ඇති බව ගොවියන් විසින් අවබෝධ කර ගෙන තිබේ.

**8. පශු සම්පත් සංවර්ධනය**

**කිරිපට්ටි පාලනය**

කිරි ආහාර ආනයනය කිරීම සඳහා පිටරටවලට ඇදී යන විදේශ විනිමය ප්‍රමාණය අඩු කිරීමේ සහ ජනතාවගේ පෝෂණ තත්ත්වය වැඩි දියුණු කිරීමේ අරමුණ ඇතිව හැකි තරම් කෙටි කාල සීමාවක් තුළ කිරි නිෂ්පාදනය වැඩි කිරීමේ උත්සාහයක් වශයෙන්, කිරි පට්ටි වැඩි දියුණු කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින්, මෙම අංශයේ සංවර්ධනය කෙරෙහි තවදුරටත් ප්‍රමුඛතාව ලබා දෙන ලදී. බෝ කිරීම සඳහා සුදුසු වර්ගවලට අයත් ගවයන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ලබාගත නොහැකි වීම මෙම වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීමේදී මුහුණ පෑමට සිදුවූ ප්‍රධාන බාධකය විය. කිරි එක්රැස් කිරීමේ කාර්යය සඳහා නව සමාගමක් පිහිටුවන ලද්දේ වී නමුදු, පශු සම්පත් සංවර්ධනයෙහිලා අත්‍යාවශ්‍ය වන පවත්නා පශු වෛද්‍ය පහසුකම් වහාම වැඩි දියුණු කිරීමේ කාර්යය ඉටු කළ යුතුව තිබේ.

**9. කුකුළු පාලනය**

සභාපතිතුමාගේ උපදෙස් පරිදි සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ මධ්‍යම පළාතේ මැතිවරණ කොට්ඨාශවල කුකුළු පාලනය ආරම්භ කරන ලදී. ඒ ඒ පවුල්වලට අතිරේක ආදායම් මාර්ගයක් සලසා දීමේ අරමුණ ඇතිව, තෝරාගත් රැකියා විරහිත තරුණ තරුණියන් අතර ජනවාරි මාසයේදී ඥමුහුන් කුකුළු පැටවුන් බෙදා දෙන ලදී. මෙම යෝජනා ක්‍රමය සාර්ථක කිරීම සඳහා විමධ්‍යගත අයවැය යටතේ මුදල් වෙන්කර දීමෙන් ගරු.පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සහාය වූ අතර, සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ආසන්න වශයෙන් කුකුළු පැටවුන් 40,000 ක් පළාත තුළ බෙදා දෙන ලදී. ලබන වර්ෂය තුළ මෙම පැටවුන් සංඛ්‍යාව ලක්ෂය දක්වා වැඩි කිරීමට අපේක්ෂා කෙරේ. සියලුම ගොවියන් සඳහා පුහුණු කිරීමේ වැඩ සටහන් දේශීය පශු වෛද්‍යවරුන් සහ බලය ලත් නියෝජිතයන් විසින් පවත්වන ලදී. මෙම යෝජනා ක්‍රමය යටතේ පුද්ගලයන් 350 ට අධික සංඛ්‍යාවකට වාසි සැලසුන අතර, බිත්තර විකිණීමෙන් ඔවුහු අමතර ආදායමක් ලබා ගනිති.

**10. නැවත පදිංචි කරවීම**

කලින් වාර්තාවල සඳහන් කළ පරිදි, මෙම ගොවීන්ට තම මැතිවරණ කොට්ඨාශ තුළ මුහුණ පෑමට සිදුවී ඇති ආර්ථික දුෂ්කරතා හේතු කොටගෙන, සංවර්ධනය කළ මහවැලි ප්‍රදේශවලට ගෙන යන මෙන් ගොවියන් විසින් සාධාරණ ඉල්ලීමක් කර තිබේ.

දඹුල්ල සහ ලග්ගල හැර සෙසු සෑම මැතිවරණ කොට්ඨාශයක්ම පාහේ අතිශයින් ජනාකීර්ණය. මෙහිලා හාරිස්පත්තුව විශේෂයෙන් සඳහන් කළ හැකි අතර, එහි ජනගහනය උතුරා යන තරමට අධික වී තිබේ. ජනගහනය වර්ධනය හා ජනාකීර්ණවීම ජාතික ප්‍රශ්න වන අතර එම කරුණු සුපරීක්ෂාකාරී ලෙස අධ්‍යයනය කර ප්‍රශ්නය වඩාත්ම බරපතල ප්‍රදේශවල ජනාකීර්ණභාවය අඩු කිරීම කෙරෙහි ප්‍රමුඛතාව දිය යුතුයි. එසේ නොකළහොත්, ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීමට නොහැකිවනවා ඇත. එමනිසා ඔවුන් සතු ඉතා සුළු බිම් ප්‍රමාණයකින් දුකසේ දිවි රැක ගැනීමට ඔවුන්ට අනිවාර්යයෙන්ම සිදු වනවා ඇත.

## 11. සමාප්තිය

කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය මගින් සම්බන්ධීකරණය කරනු ලබන, කෘෂිකාර්මික යෙදවුම්, අලෙවිකරණය සහ පුහුණු කිරීමේ කාර්යයන් පිළිබඳ වැඩ කටයුතුවලට අදාල අංශවල ප්‍රගතිය හා විස්තර ඒ ඒ අංශ විසින් තම වාර්තා මගින් ඉදිරිපත් කරනවා ඇත.

අප සභාපතිතුමාගේ දිරිගැන්වීම හා මාර්ගෝපදේශකත්වය හේතුකොට ගෙන මූලාරම්භයේ සිටම කෘෂිකාර්මික අංශයේ වර්ධන වේගය නගා සිටුවීම හා පවත්වාගෙන යෑම පිළිබඳ සිය වගකීම් ඉටු කිරීමට කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියට හැකි විය. අපගේ උත්සාහයන් තව තවත් ශක්තිමත් කර වඩා හොඳ ජීවන තත්ත්වයක් සඳහා අප ජනතාව තුළ ඇති අපේක්ෂාවන් ඉදිරි වර්ෂයේදී සපුරාලීමට අපි බලාපොරොත්තු වෙමු.

තවද, මා වෙත දක්වන ලද සහයෝගය ගැන දිසා ඇමති වරුන් තිදෙනාටත්, ගරු.පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටත් දිසාපතිවරුන්ටත් සෙසු රජයේ නිලධාරීන්ටත් කෘතඥතාව පළකරමි.

මැතිවරණ කොට්ඨාශවල වැඩ කටයුතු සංවිධානය කිරීමෙහි හා යොමු කිරීමෙහිලා සභාපතිතුමාගෙන් ලත් දිරි ගැන්වීම, මග පෙන්වීම හා උපදෙස් සම්බන්ධයෙන් අපගේ කෘතඥතාව පළකර සිටිමි.

**පැට්රික් සී. අබේනායක**
**පළාත් අධ්‍යක්ෂ – මධ්‍යම පළාත**

1988 පෙබරවාරි 2 දින
කොළඹදීය.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## බටහිර පළාත වාර්ෂික වාර්තාව — 1987

1. සාමාන්‍ය තොරතුරු

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ කළුතර නියෝජ්‍ය පළාත් අධ්‍යක්ෂ තනතුර සඳහා ඇති වූ ඇබෑර්තුව, මාතර දිස්ත්‍රික්කයේ සේවයෙහි යෙදී සිටි ඒ. එල්. වී. ප්‍රනාන්දු මහතා මාරුකිරීමෙන් සම්පූර්ණ කරන ලදී.

සභාපතිතුමා විසින් කළුතර සහ බේරුවල මැතිවරණ කොට්ඨාශ තුළ කරන ලද චාරිකාවෙන් පසු, මැතිවරණ කොට්ඨාශ දෙකක් සඳහා එක් කළමණාකාරවරයෙකු පත් කිරීමේ දැන් පවත්නා ක්‍රමය වෙනුවට එක් එක් මැතිවරණ කොට්ඨාශයක් සඳහා වෙන වෙනම කළමණාකාරවරයකු පත් කළ යුතුයැයි තීරණය කරන ලදී. ඒ අනුව, වර්ෂයේ අවසාන භාගයේදී කළුතර මැතිවරණ කොට්ඨාශය සඳහා වෙනම කළමණාකාරවරයකු පත් කර දැනට සේවය කරන කළමණාකරු බේරුවල මැතිවරණ කොට්ඨාශයට පමණක් සීමා කරන ලදී.

වෙනත් දෙපාර්තමේන්තුවලින් කාර්ය මණ්ඩල පත් කිරීමෙහි දී, මෙම වර්ෂය තුළ සිරිත් පරිදි, කෙරෙන මාරුකිරීම් හා පත් කිරීම් සිදු කරන ලදී. එය එසේ වුවද, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර කෘෂි ව්‍යාප්ති සේවා නිලධාරීන්ගේ හිඟයක් පවතින බව පෙනේ. මෙම ප්‍රශ්ණය ප්‍රධාන වශයෙන් උග්‍රවී ඇත්තේ, අනුප්‍රාප්තිකයන් නොමැතිව මාරුකිරීම් සිදු කෙරෙන බටහිර පළාත තුළය. මෙම ප්‍රශ්ණය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති නමුදු ඵලදායී ප්‍රතිචාරයක් ලැබී නොමැත.

සුළු අපනයන බෝග ව්‍යාප්ති නිලධාරීන්ගේ හිඟය, අළුතෙන් නිලධාරීන් පත් කිරීමත් සමග බොහෝ දුර විසඳී තිබේ. එය එසේ වුවද, ඇබෑර්තු කීපයක් තවදුරටත් පිරවිය යුතුව ඇති අතර එම කරුණ දෙපාර්තමේන්තුවේ අවධානයට යොමුකර තිබේ.

තවත් පශු වෛද්‍ය කොට්ඨාශ කීපයක් පිහිටුවිය යුතුව ඇති නමුදු දෙපාර්තමේන්තුව තුළ පශු වෛද්‍යවරුන්ගේ හිඟයක් පවතින බැවින්, දැනට මෙය ඉටුකළ නොහැකි බව පෙනේ.

2. වී වගාව

වර්ෂය තුළ පැවති කාලගුණ තත්ත්වයේ වෙනස්වීම් වී වගා කටයුතු කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කළේය. යල කන්නය දැඩි නියඟයකින් ආරම්භවූ අතර, අස්වනු නෙලන සමය ලඟාවෙත්ම අධික වර්ෂාපතනයක් ඇතිවිය. ඊට කලින් වර්ෂයේ යල කන්නය හා සසඳා බලන කල කොළඹ හා කළුතර යන දිස්ත්‍රික්ක දෙකේම අස්වනු ප්‍රමාණ සැලකිය යුතු අඩුවීමක් පෙන්නුම් කළේය. එය එසේ වුවද අස්වනු වැඩිවීමක් පෙන්නුම් කළේ ගම්පහ දිස්ත්‍රික්කයෙන් පමණි.

මහ කන්නයේදී ද අස්ථිර කාලගුණ තත්ත්වයන් පැවතුනි. මහ කන්නය ආරම්භවීමට ආසන්න සමයේ අධික වර්ෂාපතනයක් පැවති අතර ඇතැම් පළාත්වල දෙවරක් නොහොත් සමහර විට තුන් වරක් පවා වී වැපිරීමට සිදුවිය. එතකුදු වුවත්, සමස්ථයක් වශයෙන් සලකා බලන විට එම තත්ත්වය සතුටු දායක මෙන් පෙනී යන අතර, මේ වර්ෂයේදී ද යටත් පිරිසෙයින් පසුගිය වර්ෂයේ මහ කන්නයේදී ලබාගත් අස්වනු ප්‍රමාණයවත් ලබාගත හැකිවනු ඇතැයි අපේක්ෂා කෙරේ. පසුගිය මහ කන්නයේ බටහිර පළාතේ අස්වැන්න, මෙතෙක් ලබා ඇති වැඩිම අස්වනු ප්‍රමාණවලින් එකක් වූ අතර, කළුතර දිස්ත්‍රික්කයෙන් ලැබුණු අස්වැන්න ඉතාම උසස් අස්වනු ප්‍රමාණවලින් එකක් විය. එම අස්වනු ප්‍රමාණයන් පහත දැක්වේ.

| | දිස්ත්‍රික්කය | වපුරන ලද දළ කුඹුරු ප්‍රමාණය අක්කර | ලබාගත් අස්වැන්න බුසල් |
|---|---|---|---|
| 1986/87 මහ කන්නය | කොළඹ ... ... | 16,121 | 64.51 |
| | ගම්පහ ... ... | 37,285 | 64.31 |
| | කළුතර ... ... | 46,869 | 54.35 |

සෑම දිස්ත්‍රික්කයකම මුහුණ පෑමට සිදුවූ පොදු ප්‍රශ්ණය වූයේ බිත්තර වී හිඟයයි. දෙපාර්තමේන්තුව විසින් තම බිත්තර වී නිෂ්පාදන වැඩ පිළිවෙල ගොවියාගේ කුඹුරුවලදී ක්‍රියාත්මක කරනු ලබන අතර, බටහිර පළාතේ එම වැඩ පිළිවෙල අසාර්ථක වී ඇති බව පෙනී ගොස් තිබේ. තෙත් කලාපය තුළ බිත්තර වී නිෂ්පාදන වැඩ පිළිවෙල අසාර්ථක වීමේ මූලික හේතුව කාලගුණ තත්ත්වයේ අස්ථිර භාවයයි. තෙත් කලාපයට අවශ්‍ය මුළු බිත්තර වී ප්‍රමාණය එම කලාපය තුළ නිෂ්පාදනය කළ නොහැකි බව සභාපතිතුමා විසින් තම චාරිකා වාර්තාවල නැවත නැවතත් සඳහන් කර තිබේ. එබැවින්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් මෙම වැඩ පිළිවෙල සුපරීක්ෂාකාරී ලෙස සලකා බලා තෙත් කලාපයේ ගොවියන්ට අවශ්‍ය ප්‍රමාණ බිත්තර වී වියළි කලාපය තුළ නිෂ්පාදනය කරන බවට වග බලා ගැනීම අවශ්‍ය වන්නේය.

### 3. පොල් වගාව

පොල් මිළ ගණන් පහත වැටීම පොල් වගාව කෙරෙහි බලපා ඇති බව පසුගිය වාර්තාවෙන් මම පෙන්වා දුනිමි. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ පොල් මිළ ගණන් වල වැඩිවීමක් සිදුවුයේ වී නමුදු, කලින් වර්ෂය තුළ වූ නියඟය පොල් නිෂ්පාදනය කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කළේය. පලදාව අඩුවූ අතර නිෂ්පාදකයාට තරමක සහනයක් සලසමින් මිළ ගණන්වල වැඩිවීමක් ඇති විය. බොහෝ අවස්ථාවල පොහොර යෙදීම අවශ්‍ය පරිදි සිදු නොකරන ලදි.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ පොල් පැළ හිඟයක් පැවතුනි. ඉල්ලුම සපුරා ලීම සඳහා සැපයුම ප්‍රමාණවත් නොවූ අතර මෙම හිඟය 1988 වර්ෂය තුළද පැවතීමට ඉඩ තිබේ.

### 4. රබර් වගාව

සුළු ඉඩම් හිමියන්ගේ රබර් ඉඩම් මෙන්ම රාජ්‍ය සංවිධාන සතු රබර් වගාවන්ද කොරිනෙස්පෝරා නමැති භයානක රෝගයට ගොදුරුවිය. සුළු ඉඩම්හිමියන් සතු ඉඩම් ප්‍රමාණය රාජ්‍ය සංවිධාන දෙකට අයත් ඉඩම් ප්‍රමාණය තරම් විශාල නොවූ අතර, රබර් ව්‍යාප්ති අංශයේ උපදෙස් යටතේ බොහෝ දෙනෙක් කොරිනෙස්පෝරා රෝගයට ඔරොත්තු දෙන ක්ලෝන වගා කිරීම ආරම්භ කළහ.

තම අළුත් වගාවන් ඉවත් කර එම ඉඩම් නැවත වගා කිරීමට සුළු ඉඩම් හිමියන්ට නියම කරන්නේ නම් එම ඉඩම් හිමියන්ට වන්දි ගෙවිය යුතු බවට කොරිනෙස්පෝරා පාලනය කිරීමේ කමිටුවේ සේවය කළ කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ නිලධාරීහු අදාල නිලධාරීන්ට උපදෙස් දුන්හ. මෙම කරුණ රජය වෙත ඉදිරිපත් කර රජය විසින් එය පිළිගන්නා ලදුව, සුළු ඉඩම් හිමියන්ට මෙන්ම රාජ්‍ය සංවිධාන දෙකටද නියමිත වන්දි ගෙවීම දැන් සිදු කරනු ලැබේ.

ක්‍රේප් රබර් මිළ පහත වැටීම හේතු කොට ගෙන සුළු ඉඩම් හිමියන්ගේ රබර් කිරි එක් රැස් කර රාජ්‍ය කර්මාන්ත ශාලාවල එම රබර් සකස් කිරීමේ වැඩ පිළිවෙල 1987 මැද භාගයේදී තාවකාලිකව අත්හිටුවන ලදී. ෂීට් රබර් මිළ හා ක්‍රේප් රබර් මිළ සම මට්ටමක පැවති අතර එක්තරා කාල සීමාවක් තුළ ෂීට් රබර් මිළ ක්‍රේප් රබර් මිළට වඩා වැඩි විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් සුළු ඉඩම් හිමියෝ ෂීට් රබර් නිෂ්පාදනය කිරීමට වැඩි කැමැත්තක් දැක්වූහ.

### 5. සුළු අපනයන බෝග

1987 වර්ෂයේ පළමු තෙමස තුළ පැවති නියඟ සුළු අපනයන බෝග නව වගා කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කළේය. විනාශ වී ගිය පැළ වෙනුවට අළුතෙන් පැළ සැපයීමේ වැඩ පිළිවෙලක් දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කරන ලදී. ගම්මිරිස් මිළ ඉහල යෑම නිසා ගම්මිරිස් පැළ සඳහා ඇති ඉල්ලුම අධික විය. එහෙත් එම ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් වන පරිදි, පැළ තවාන් සකස් වී නොතිබුණි. කරාබු නැටි මිළ පහත වැටීමත් සමග එය සහනාධාර යෝජනා ක්‍රමයෙන් ඉවත් කරන ලදී.

### 6. පළතුරු සහනාධාර යෝජනා ක්‍රමය

මෙම සහනාධාර යෝජනා ක්‍රමය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ආරම්භ කර ඇති අතර, ගොවියන් විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම් පත්‍ර සඳහා ඉල්ලුම සපුරාලීමට දෙපාර්තමේන්තුව අපොහොසත්වීම නිසා, බටහිර පළාතේ ගොවීන් අතර, විශාල ව්‍යාකූලත්වයක් ඇති වී තිබේ. ලබා දී ඇති මුදල් ප්‍රමාණය සීමා සහිත වනු බැවින්, බොහෝ ගොවීන්ට මෙම යෝජනා ක්‍රමයෙන් ප්‍රයෝජන ගැනීමට නොහැකි වී තිබේ. මෙවැනි යෝජනා ක්‍රමයක් දියත් කිරීමේදී එම වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් මුදල් වෙන් කිරීම වැදගත් වන්නේය. කිසියම් බෝගයක් සඳහා දැනට අවසර දී ඇති ඉඩම් ප්‍රමාණය, පළාත කෙසේ වෙතත් අදාල දිස්ත්‍රික්කයේ ගොවීන්ට සේවය කිරීමට කිසිසේත් ප්‍රමාණවත් නොවන්නේය.

### 7. එළවළු වගාව

බටහිර පළාතේ ඇතැම් ප්‍රදේශවල මෙම වගාව අතිශයින් ජනප්‍රිය බව ඔප්පු වී තිබේ. ප්‍රධාන වශයෙන් පහත රට එළවළු වර්ග වගා කරනු ලබන අතර, බේරුවල හා හෝමාගම වැනි ඇතැම් ප්‍රදේශවල රාබු හා බෝංචි වැනි බෝග වගා කරනු ලැබේ. අළුතෙන් රබර් වගා කළ ඉඩම්වල බහුල වශයෙන් එළවළු වගා කරනු ලබන අතර, එමගින් සුළු ඉඩම් හිමියන්ට තම රබර් පැළ වැඩෙන තුරු අතිරේක ආදායමක් ලැබේ. නිලධාරීන් විසින් තව තවත් ප්‍රචාරය ලබාදෙන අතර, අනාගතයේදී එළවළු වගා කරන බිම් ප්‍රමාණය වැඩි කිරීමට අපේක්ෂා කෙරේ.

### 8. සත්ව පාලනය

ගොවියන්ගේ ඉල්ලුම සපුරාලීම සඳහා අවශ්‍ය දවසක් වයසැති කුකුළු පැටවුන්ගේ හිඟයක් පැවති බව මගේ පසුගිය වාර්තාවෙහි සඳහන් කළෙමි. බලය ලත් නියෝජිතයන් විසින් තම නිපැයුම වැඩිකර ගොවියන්ගේ අවශ්‍යතා සපුරාලන ලදී. එහෙත්, එහි ප්‍රතිඵලයක් වශයෙන් බිත්තර මිළ ගණන් පහත වැටීමක් සිදුවූ නමුදු, වර්ෂයේ අග භාගයේදී බිත්තර වෙළඳ පොලේ ස්ථාවරත්වයක් ඇති විය. මස් පිණිස ඇති කරන කුකුළු පැටවුන් සඳහා ඇති ඉල්ලුම වැඩිවිය. මෙහිදී, වර්ෂයේ මැද භාගයේදී වෙළඳ පොලේ මිළ ගණන්වල අඩුවීමක් සිදුවූ අතර වර්ෂයේ පසු භාගයේදී මිළ ගණන් යහපත් තත්ත්වයකට පත් විය.

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සහාය ඇතිව, කෘෂිකාර්මික කළමණාකාරවරු, යුහුසුලුව ක්‍රියාත්මක වෙමින්, කිරිපට්ටි පාලනය, කුකුළු පාලනය හා ඌරන් ඇති කිරීම පිළිබඳ සමුපකාර සමිති නිසි පරිදි පවත්වා

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## බටහිර පළාත වාර්ෂික වාර්තාව — 1987

ගෙන යන බවට වග බලා ගත්හ. ඇතැම් සමිති තම තමන්ගේ නිෂ්පාදන අලෙවි කිරීමේ කාර්යයෙහිද නියුක්ත වූ අතර, එම වැඩ කටයුතු විශේෂයෙන්ම කුකුළු මස් හා ඌරු මස් අලෙවි කිරීමේ වැඩ කටයුතු සාර්ථක වූ බවත් පෙන්නුම් කළේය.

කිරි මිළ ගණන් සතුටුදායක තත්ත්වයක නොපැවතීම හේතුකොටගෙන, කිරි පට්ටි හිමියන්ගේ සමුපකාර සමිති සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් නොකළේය. පාරිභෝගිකයා විසින් ගෙවිය යුතු මිළ ගණන්වල වැඩිවීමක් ඇති වූ අතර, ගොවියාට ලැබෙන මිළ ගණන්වල වැඩිවීමක් සිදු නොවීය. ඉදිරි වර්ෂය තුළ කිරි නිෂ්පාදනය වැඩි කිරීමට හැකිවනු පිණිස ගොවියාට තම නිෂ්පාදන සඳහා වැඩි මිළක් ලැබෙන්ට සැලැස්වීම වැදගත් වන්නේය.

උතුරු මැද පළාතේ එන්සෙපලයිටිස් රෝගය පැතිර යෑම නිසා පාරිභෝගිකයන් තුළ භීතියක් ඇතිවීම හේතුකොටගෙන 1987 වර්ෂයේ පසු භාගය තුළ ඌරුමස් මිළ පහත වැටීමෙන් ඌරන් ඇති කරන ගොවියෝ භීතියට පත් වූහ. මෙම මිළ ගණන් මෙතෙක් යථා තත්ත්වයට පත් වී නොමැති අතර ඌරන් ඇති කරන ගොවියන් බොහෝ දෙනෙකුට තම ඌරු කොටු වසා දැමීමට සිදු විය. 1988 වර්ෂයේදී මෙම මිළ ගණන් යහපත් තත්ත්වයකට පත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

දිස්ත්‍රික්ක තුන තුළ බිත්තර කුකුළු පැටවුන් සහ මස් කුකුළු පැටවුන් බෙදා හැරීම පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

| | බිත්තර කුකුළු පැටවුන් | | මස් කුකුළු පැටවුන් | |
|---|---|---|---|---|
| | කෘ.සං.අ. | ස.නි. හා සෞ.දෙ. | කෘ.සං.අ. | ස.නි. හා සෞ.දෙ. |
| කොළඹ ... | 18,989 | 10,297 | 28,100 | 4,771 |
| ගම්පහ ... | 38,425 | 58,344 | 12,075 | 23,653 |
| කළුතර ... | 14,525 | 30,212 | 30,850 | 15,251 |
| මුළු ගණන | 71,939 | 98,853 | 71,025 | 43,675 |

**9. වාරිමාර්ග**

දිස්ත්‍රික්ක තුන සඳහා ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් වෙන් කරන ලදී. ඇතැම් අවස්ථාවලදී, ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ මුදල් විවිධ මැතිවරණ කොට්ඨාශ තුළ වැඩ කටයුතු සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවට මාරු කරන ලදී. ඒ අතර, වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් වෙන් කරන ලද මුදල් ප්‍රමාණයන් අතිශයින් අල්ප විය. මැතිවරණ කොට්ඨාශ කීපයක් හැර, මැතිවරණ කොට්ඨාශ වැඩි සංඛ්‍යාවකට වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් කිසිම මුදල් ප්‍රමාණයක් නොලැබුනි. එහි ප්‍රතිඵලයක් වශයෙන් වැඩ රාශියක්ම අසම්පූර්ණ තත්ත්වයක නතර කර ඇති අතර, එම මැතිවරණ කොට්ඨාශවල ප්‍රශ්ණ තව දුරටත් එලෙසම පවතී. විමධ්‍යගත අයවැය යටතේ මෙන්ම දිස්ත්‍රික් සංවර්ධන මණ්ඩල මගින් වෙන් කරන ලද මුදල්ද බෙහෙවින් අල්ප විය.

කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා විසින් කරුණු ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, ප්‍රථමවරට බටහිර පළාතේ ග්‍රාමීය වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතියේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී. එහෙත් මුදල් ලබා දීම සිදු කරන ලද්දේ 1987 වර්ෂයේ අවසාන කොටසේදී බැවින් වැඩ පටන් ගැනීමට නොහැකි වූ අතර ඇස්තමේන්තු සකස් කර ඇති වැඩ 1988 වර්ෂයේ මුල් භාගයේදී ආරම්භ කරනවා ඇත. වැය කළ යුතු මුදල අතිශයින් අධික වන නිසා ආරම්භ කළ නොහැකිව වැඩ ගණනාවක්ම නතර කර තිබුණු අතර, මෙම මුදල් යෙදවීමේ මාර්ගය බටහිර පළාතට විශාල සෙතක් වනවා ඇත.

සභාපතිතුමා වත්තල මැතිවරණ කොට්ඨාශ තුළ කරන ලද සංචාරයකින් පසු එතුමා විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශයක් අනුව, වත්තල පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා විසින්, මහර මුදුන් ඇලේ මඩ ඉවත් කිරීම ආරම්භ කිරීම සඳහා මුදල් වෙන් කරන මෙන් ඉඩම් හා ඉඩම් සංවර්ධන ඇමතිතුමා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරන ලදී. අවුරුදු ගණනාවක් තුළ නිසි පරිදි නඩත්තු නොකරන ලද මෙම ඇළ මාර්ගය රොන්මඩවලින් ගොඩවී යෑමේ ප්‍රතිඵලයක් වශයෙන් අක්කර දහස් ගණනක් ජලයෙන් යටවීම නිසා ගොවීන්ට තම කුඹුරු වගා කිරීමට නොහැකි තත්ත්වයක් උදාවී තිබුණි. 1987 මැද භාගයේදී මෙහි වැඩ කටයුතු ආරම්භ කරන ලදුව වර්ෂය අවසානයේදී රොන්මඩ ඉවත් කිරීමේ වැඩ කටයුතු සඳහා රුපියල් 4,00,000 ට ආසන්න මුදලක් වැය කර තිබුණි. 1988 වර්ෂය තුළද මෙම වැඩ කටයුතු තව දුරටත් කරගෙන යනවා ඇත.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## බටහිර පළාත වාර්ෂික වාර්තාව — 1987

බෙරුවල මැතිවරණ කොට්ඨාශයේ කළුවාමෝදර ඇළ මාර්ගයේ රොන්මඩ ඉවත් කිරීම ආරම්භ කිරීම තවත් ප්‍රධාන යෝජනා ක්‍රමයක් විය. මෙහිදී ද සභාපතිතුමාගේ චාරිකාවෙන් පසු එතුමා විසින් මුදල් වෙන් කරන ලෙස ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කරන ලදුව 1987 වර්ෂයේ අවසාන භාගයේදී වැඩ කටයුතු ආරම්භ කරන ලදී. මෙම කාර්යයද, වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් ලබාදෙන මුදල් මෙන්ම විමධ්‍යගත අයවැය යටතේ වෙන්කරනු ලබන මුදල් යොදා තව දුරටත් ක්‍රියාත්මක කරනු ලැබේ.

1987 වර්ෂය තුළ වාරිමාර්ග වැඩ කටයුතු සඳහා වැය කරන ලද මුදල් ප්‍රමාණයන් පහත දැක්වේ.

| | ගොවි ජන සේවා | වාරිමාර්ග දෙපා. | විමධ්‍යගත අයවැය | දිස්ත්‍රික් සං.සභා | ග්‍රා.වා.පු.ව්‍යා. |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| කොළඹ | 1,920,998.05 | 394,339.34 | 514,720.00 | — | — |
| ගම්පහ | 2,932,911.25 | 946,500.00 | 859,779.47 | 755,026.18 | 62,121.00 |
| කළුතර | 1,392,826.83 | 1,839,225.38 | 613,380.00 | — | 735,757.35 |
| මුළු එකතුව | 6,246,736.13 | 3,180,064.72 | 1,987,879.47 | 755,026.18 | 797,878.35 |

10. සමාප්තිය

මෙම වාර්තාව සමාප්ත කිරීමට පෙර, මගේ නියෝජ්‍ය පළාත් අධ්‍යක්ෂවරුන් සහ කෘෂිකාර්මික කළමණාකාරවරුන් විසින් ඉටු කරන ලද සේවය ම විසින් අගය කරන බැව් මෙහිලා සඳහන් කරමි. ක්ෂේත්‍ර මට්ටමේ කාර්ය මණ්ඩලය විසින් මෙම වර්ෂය තුළ දෙන ලද සහාය මෙන්ම දක්වන ලද සහයෝගය ගැන මගේ කෘතඥතාව පළ කරමි. තවද බටහිර පළාතේ සේවයෙහි නියුක්ත නිලධාරීන් කෙරෙහි දක්වන ලද සහයෝගය ගැන ප්‍රධාන කාර්යාලයේ විධායක මණ්ඩලයේ සියලු දෙනාටම මාගේ ස්තුතිය පුද කරමි.

මගේ වැඩ කටයුතු සංවිධානය කිරීමෙහිලා සභාපතිතුමා ගෙන් ලැබුනු සහාය හා මාර්ගෝපදේශකත්වය සම්බන්ධයෙන් මගේ කෘතඥතාව පූර්ව ස්තුතිය එතුමා වෙත පුද කරමි. තවද, සමාලෝචනයට භාජනය වූ කාල පරිච්ඡේදය තුළ මා වෙත දක්වන ලද සහයෝගය ගැන ගරු. පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් ටත්, අපගේ එදිනෙදා වැඩ කටයුතු වලදී සහයෝගයෙන් කටයුතු කළ විවිධ සංවිධානවල කාර්ය මණ්ඩලවලටත් මගේ අවංක ස්තුතිය පුද කරමි.

පී. එල්. ඩී. මෙල්
පළාත් අධ්‍යක්ෂ – බටහිර පළාත

1988 මාර්තු 10

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## උතුරු පළාත වාර්ෂික වාර්තාව — 1987

### 1. ගොඩනැගිලි, මංමාවත් ආදිය

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ කෘෂිකර්මයට අදාල පොදු මෙන්ම පෞද්ගලික අංශයේ ආධාරක සේවාවන් බරපතල ලෙස අඩාල වූ අතර, නඩත්තු නොකිරීම නොහොත් විනාශ කරනු ලැබීම හේතුකොට ගෙන ගොඩනැගිලි, මංමාවත් ආදී භෞතික දේපල පරිහානියට පත්විය. කෘෂිකාර්මික යෙදවුම් සපයන පොදු අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේ සිල්ලර අළෙවි හල් වලට සිදු වූ අලාභ හානි අති විශාලය. රජයේ ගොවිපලවල ගොඩනැගිලි ඇතුළු පොදු ගොඩනැගිලි විනාශ කර තිබේ. සිදුකර ඇති අලාභහානි ඇගයීම නිමකර ඇති අතර එම ඇස්තමේන්තු පුනරුත්ථාපනය අමාත්‍යාංශය හා මුදල් සපයන වෙනත් ජාත්‍යන්තර ආයතන වෙත ඉදිරි පත්කර තිබේ. ඉතා වැදගත්වන ගොඩනැගිලි, මංමාවත් ආදිය අළුත්වැඩියා කිරීම මුළු පළාත තුළම හැකි පමණ ඉක්මනින් කළ යුතුවේ. ප්‍රධාන මංමාවත් හා පාලම් ද ප්‍රමුඛතා පදනමක් මත ඉදිකළ යුතුයි.

පුනරුත්ථාපන අමාත්‍යාංශය මගින් වෙන්කර දෙන ලද මුදල්වලින් මන්නාරම දිස්ත්‍රික්කයේ සියලුම ගොවි ජන සේවා මධ්‍යස්ථාන අළුත්වැඩියා කරනු ලැබූ අතර, ඒ සඳහා රු. 352,682/- ක මුදලක් වැය කරන ලදී. මෙම කාර්යය සඳහා ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවෙන් රුපියල් 108,690/- ක් ලැබුනි. පුනරුත්ථාපන අමාත්‍යාංශය මගින් වෙන් කර දෙන ලද මුදල් වලින් රු. 100,491/- ක් වැය කර ගම් මට්ටමේ පොහොර ගබඩා නවයක් අළුත් වැඩියා කරන ලදී. උතුරු පළාතේ සෙසු දිස්ත්‍රික්ක සඳහා ද පුනරුත්ථාපන අමාත්‍යාංශය විසින් මුදල් වෙන් කර දෙනු ලැබූ අතර, අළුත් වැඩියා කිරීමේ වැඩ හැකි පමණ ඉක්මණින් සිදු කරනවාඇත.

### 2. ආහාර බෝග අංශය

#### (අ) වී වගාව

පසුගිය මහ කන්නයේදී වී වගා අංශය මගින් ලැබූ ප්‍රගතිය අස්ථිර විය. 1985/86 මහ කන්නයේදී උතුරු පළාතෙන් වී බුසල් මිලියන 6.3 ක් ලබා ගත හැකි වූ අතර 1986/87 මහ කන්නයේදී ලබාගත හැකි වූයේ වී බුසල් මිලියන 4.16 ක් පමණි. 1982/83 මහ කන්නයේදී බුසල් මිලියන 9.3 ක වාර්තාගත අස්වැන්න ප්‍රමාණයක් ලබා ගත හැකි වූ නමුදු ඉන්පසු වී නිෂ්පාදන ක්‍රමයෙන් අඩුවීමක් පෙන්නුම් කළේය.

1987/88 මහ කන්නයේදී කුඹුරු අක්කර 205,129 ක් වගා කිරීමට ඉලක්ක කරගෙන ඇති අතර මෙම වාර්තාව සකස් කරන අවස්ථාව වන විට වගා කර තිබුණු කුඹුරු ප්‍රමාණය අක්කර 122,821 ක් විය. අස්වද්දා ඇති කුඹුරු ප්‍රමාණයෙන් කිලිනොච්චියේ 97% ක්ද මන්නාරමේ 73% ක් ද, වව්නියාවේ 38% ක් ද, මුලතිව්හි 20% ක් ද වගා කරන ලදී. කිලිනොච්චි හා මන්නාරම යන දිස්ත්‍රික්කවල ඉලක්ක සපුරාලීමට හැකි වූයේ 1987/88 මහ කන්නය තුළ එම ප්‍රදේශවල බරපතල කලබලකාරී තත්ත්වයක් නොපැවති නිසාත්, එම ප්‍රදේශ ස්ථිර ජල සැපයුමක් සහතික කරන යෝධ වැව හා ඉරනමඩු වැනි මහා පරිමාණයේ වාරිමාර්ග යෝජනා ක්‍රම යටතේ පිහිටා ඇති නිසාත්ය. මුලතිව් හා වව්නියා දිස්ත්‍රික්කවල ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වූ හේතු වශයෙන් පහත සඳහන් කරුණු දැක්විය හැක.

(i) ඔක්තෝබර්, නොවැම්බර් සහ දෙසැම්බර් යන මාස වලදී සිදුවූ හිංසාකාරී ක්‍රියා මුලතිව් දිස්ත්‍රික්කයේ පුතුකුඩිරිප්පු, මුලියවලායි, අලම්පිල් යන ගොවි ජන සේවා මධ්‍යස්ථානවලට අයත් ප්‍රදේශවල සහ වව්නියා දිස්ත්‍රික්කයේ නෙඩුන්කර්නි ප්‍රදේශයේ පදිංචි වී සිටි ගොවියන්ට එම ප්‍රදේශ අතහැර යෑමට සිදුවිය.

(ii) බැංකුවල ණය හා බඩු උගස් කිරීමේ පහසුකම් නොමැතිවීම. අවුරුද්දකට 36% සිට 60% දක්වා වූ පොළී ප්‍රමාණයන් යටතේ පෞද්ගලික ණය දෙන්නන්ගෙන් මුදල් ලබා ගැනීමට ගොවීන්ට සිදුවීම.

(iii) වගා කටයුතු සඳහා වන වියදම අධිකවීම. කෘෂිකාර්මික යෙදවුම්වල මිළ ට්‍රැක්ටර් කුළිය සහ කම්කරු වේතන 1983 න් පසු බෙහෙවින් අධික වී තිබේ. උදාහරණයක් වශයෙන් 1983/84 මහ කන්නයේදී මඩ කුඹුරු වගා කිරීම සඳහා වැය කළ යුතු මුදල අක්කරයකට රු. 4100-/ ක් වූ අතර 1987/88 මහ කන්නයේදී එම මුදල අක්කරයකට රු. 5200/- දක්වා වැඩි විය.

(iv) වව්නියා හා මුලතිව් දිස්ත්‍රික්කවල කුඹුරු ඉඩම් වැඩි ප්‍රමාණයක් පිහිටා ඇත්තේ සුලු වාරිමාර්ග යෝජනා ක්‍රම යටතේය. නොවැම්බර් හා දෙසැම්බර් මාසවල ඇතිවූ සුළු වර්ෂාපතනයෙන් සුළු පරිමාණයේ වැව් වලට ප්‍රමාණවත් ජලය නොලැබුනි. අනෙක් අතට, ඔක්තෝබර් මාසයේදී ඇතිවූ අධික වර්ෂා පතනය (මි.මි. 344) නිසා ගොවීන්ට කැකුලං වැපිරීමට අවස්ථාවක් නොලැබුණි.

මීට කලින් කන්න දෙක හා සසඳා බැලීමේදී, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් බිත්තර වී බෙදාදීම බෙහෙවින් සතුටුදායක විය. මෙම කාර්යය සතුටුදායක ලෙස ඉටුකළ හැකි වූයේ ඉන්දු - ලංකා සාම සම්මුතිය අත්සන් කිරීමත් සමග අගෝස්තු හා සැප්තැම්බර් යන කාල සීමාව තුළ එම ප්‍රදේශ වල තත්ත්වය සාමාන්‍ය බවට පත්වීමයි. පරන්තන්, වව්නියා සහ මුරුක්කන් හි පිහිටි රජයේ ගොවිපලවල්වලට බිත්තර වී දුම්රියෙන් ප්‍රවාහනය කරන ලදී.

උතුරු පළාතේ දිස්ත්‍රික්ක හතර තුළ බෙදා දෙන ලද මුළු බිත්තර වී ප්‍රමාණය බුසල් 13,800 ක් විය. අක්කරයකට බුසල් දෙක ගණනේ ගණන් බැලූ විට මෙය මුළු අවශ්‍යතාව යෙන් 5.6% ක් පමණි. තම තමුන්ට අවශ්‍ය බිත්තර වී තම තමන් ලඟ රඳවා ගන්නා මෙන් ගොවියන් ගෙන් ඉල්ලමින්,

කෘෂිකාර්මික සංවර්ධන හා සම්බන්ධ කාර්ය මණ්ඩලය විසින් 1983 සිට කරණ ලද ප්‍රචාරය ඵලදායක වී තිබේ.

ගොවිජන සේවා මධ්‍යස්ථාන වලට බිත්තර වී බෙදාදීම සැප්තැම්බර් මස අවසානයේදී නිම කරන ලදී. එතකුදු වුවත්, වව්නියා සහ මුලතිව් දිස්ත්‍රික්ක වලට වගා කටයුතු ප්‍රමාදවීම හේතු කොට ගෙන අඩු මාස් බිත්තර වී වර්ග සඳහා වූ ඉල්ලුම සපුරාලිය නොහැකි විය.

### (ආ) වෙනත් ආහාර බෝග

මෙම අංශයේ බෙහෙවින් බලාපොරොත්තු වූ ඉලක්කය සපුරා ගැනීම අසාර්ථකවීමට 1983 න් පසු ඇති වූ ජාතිවාදී කලබල හේතුවීම අවාසනාවන්ත සිද්ධියකි. සාමාන්‍ය තත්ත්වයන් යටතේ අතිරේක ආහාර බෝග වගා කිරීමෙහිලා වැඩි වශයෙන් දායකවන්නේ උතුරු පළාතය. වව්නියා දිස්ත්‍රික්කයේ 1986/87 මහ කන්නයේදී උඳු වගා කළ බිම් ප්‍රමාණය අක්කර 10,982 ක් වූ අතර 1987/88 මහ කන්නයේදී එය අක්කර 16,219 දක්වා වැඩිවිය. වියළි මිරිස්, රතුළූනු සහ රටකජු වගාවල එතරම් ප්‍රගතියක් දක්නට නොලැබුනි. ගොවිජන සේවා මධ්‍යස්ථාන මගින් මෙන්ම පෞද්ගලික වෙළෙන්දන් විසින් ද බීජ බෙදා දෙන ලදී. පෞද්ගලික වෙළෙන්දන් විසින් පමණක් අළෙවි කරනු ලැබූ පිටරට එළවළු බීජවල අධික මිළ ගණන් පිළිබඳ නිරීක්ෂණ පවත්වන ලදී. එය එසේවුවද, පසුගිය වර්ෂයේදී කිලෝවක මිළ රුපියල් 20/- සිට රුපියල් 24/- දක්වා පැවති උඳු බීජ රුපියල් 12/- දක්වා පහත වැටී තිබුණි.

### 3. වාරිමාර්ග

පොදුවේ ගත් කල එක එල්ලේම බලපෑමක් ඇති නොකරන්නේ වී නමුදු, වාරිමාර්ග ක්‍රම නඩත්තුකර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් එම වාරිමාර්ග ක්‍රම බොහොසෙයින් හානි වී තිබුණු අතර ඒවා නිසි පරිදි සකස් කළ යුතුවේ. උතුරු පළාතේ දිස්ත්‍රික්ක හතර තුළ සුළු සුළු පරිමානයේ වාරිමාර්ග වැඩ සඳහා රුපියල් 11,068,471/- වැය කරන ලදී. ඒ සඳහා මුදල් ඒ ඒ දෙපාර්තමේන්තු මගින්, පුනරුත්ථාපන අමාත්‍යාංශය මගින්, මහ පරිමාණයේ වාරිමාර්ග පිළිබඳ ඒකාබද්ධ කළ කළමනාකරන ව්‍යාපෘතිය මගින් සහ විමධ්‍යගත අයවැය වලින් ලබා දෙන ලදී. විශාල වැඩ කොටසක් ඉටුකරගත හැකිව තිබුණු ඒකාබද්ධ කළ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය, ග්‍රාමීය වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය සහ මහ පරිමාණයේ වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය වැනි සියලුම මහ පරිමානයේ ව්‍යාපෘති, ප්‍රදේශය තුළ දැනට පවත්නා තත්ත්ව නිසා අත්හිටවා ඇත.

නළ ළිං මගින් හා කණින ලද විවෘත ළිං මගින් භූගත ජලය ලබා ගැනීමේ ව්‍යාපෘති, ඒ සඳහා මුදල් වෙන්කර ඇතත්, දැනට පවත්නා තත්ත්වය නිසා අතහැර දැමීමට සිදුවී තිබේ.

### 4. කෘෂිකර්ම ණය

ගොවියන් විසින් ණය මුදල් ආපසු ගෙවීම විශාල වශයෙන් පැහැර හැරීම ආර්ථික ක්‍රියාකාරිත්වය කඩාකප්පල් කිරීමෙහිලා එක එල්ලේම හේතු නොවුවත් එය අහිත කර බලපෑමක් ඇති කළේය. ණය ආපසු ගෙවීම පැහැර හැරීම හේතුකොට ගෙන එම පුද්ගලයන් තව දුරටත් විධිමත් ණය ලබා ගැනීම සඳහා නුසුදුසු තත්ත්වයකට පත්වෙයි. එමනිසා නිෂ්පාදන යෙදවුම් හා මූල ධන උපකරණ ලබා ගැනීම සඳහා ඔවුන්ට ඇති ඉඩකඩ ඇහිරී යන අතර ආර්ථික වශයෙන් ඔවුන් පුනරුත්ථාපනය කිරීම අවුල් සහගත තත්ත්වයකට පත්වෙයි.

හිඟ ණය පිළිබඳ ඇගයීමක් වහාම කළ යුතු වන අතර ණය පිළි සැකසීමේ හා නැවත උපලේඛන ගත කිරීමේ පුළුල් වැඩ පිළිවෙලක් සකස් කළ යුතුවේ. නව ප්‍රාග්ධන නිකුත් කිරීමේ පහසුවනු පිණිස බැංකු මගින් පොදු ප්‍රතිපත්තියක් සකස් කළ යුතුයි. දෙවර්ගයේම ගොවීන්ට ඉඩ කඩ සැලසෙන පරිදි ණය නැවත උපලේඛනගත කිරීමක් සකස් කළ යුතුයි. ඉන් එකක්, හිංසාකාරී ක්‍රියාවන් නිසා උන්හිටි තැන් මුළුමනින්ම අහිමි වී ගිය ගොවියන් සඳහා වියයුතු අතර අනෙක, හිංසාකාරී ක්‍රියාවන් නිසා තම ලාභ පහත වැටීම නොහොත් පාඩු සිදුවීම හේතුකොටගෙන 1983 න් පසු ණය මුදල් ආපසු ගෙවීම පැහැර හරින ලද ගොවියන් සඳහා විය යුතුයි.

මහජන බැංකුව විසින් උගසට ගන්නා ලද ස්වර්ණාභරණ නිදහස් නොකිරීම සම්බන්ධයෙන් ගොවියන්ගෙන් පැමිණිළි රාශියක් ලැබුණි. අප විසින් බැංකුව වෙත කරුණු ඉදිරිපත් කිරීමෙන් සහ ඉන්දු-ලංකා සාම සම්මුතිය අත්සන් කිරීමෙන් පසු, උගස් කර ඇති භාණ්ඩ මෙම දිස්ත්‍රික්කවලට ගෙන ඒම සඳහා අවශ්‍ය රක්ෂණ ආවරණ ලබා ගැනීමට බැංකු මගින් කටයුතු පිළියෙල කළ නමුදු, බලධාරීන්ගෙන් අවශ්‍ය ආරක්ෂාව පිළිබඳ අනුමැතිය අපට ලබාගත නොහැකිවිය. එබැවින්, මෙම භාණ්ඩ මුදා හැරීමට බැංකුවට නොහැකි වී තිබේ. තත්ත්වය එසේ වුවද, තම උගස් අත්තිකාරම් ගෙවා නිම කරන, සුදුසුකම් ලත් ගොවීන්ට, වගා කටයුතු සඳහා, තැන්පත් කර ඇති ප්‍රාග්ධන මුදලෙන් 90% දක්වා වූ අත්තිකාරම් මුදලක් ගෙවීමට මහජන බැංකුව එකඟ වී ඇත.

### 5. පුනරුත්ථාපනය

හානියට පත් ප්‍රදේශවල ගොවි පවුල් විශාල සංඛ්‍යාවකට, ආයුධ, උපකරණ, වාරිමාර්ග පොම්ප, බෙහෙත් ඉසීමේ උපකරණ හා පශු සම්පත් මෙන්ම තම පෞද්ගලික බඩු බාහිරාදිය ද අහිමි විය. රෝද හතරේ ට්‍රැක්ටර් සැලකිය යුතු සංඛ්‍යාවක්ද නැති විය.

වහාම කළ යුතුව ඇත්තේ ගොවියන් ආපසු වැඩට කැඳවීමයි. ගොවි පවුල් බොහොමයක් දැන් දැන් තම ඉඩම්වලට ආපසු පැමිණෙන බැවින්, ඔවුන් තුළ ආර්ථික වශයෙන් ආත්ම

විශ්වාසයක් ඇති කරනු පිණිස ඔවුන්ට වහාම ක්‍රියාකාරී වන සහනාධාර ලබා දිය යුතුයි. උතුරු පළාතේ සියලුම දිස්ත්‍රික්ක සඳහා වඩාත් අවශ්‍ය වී ඇත්තේ සී සැමේ උපකරණ, බිත්තර වී සහ අතින් ක්‍රියාකරවන සරල උපකරණය.

**6. අලෙවිකරණය**

විවෘත වෙළඳ පොළේ මිළ, සහතික මිළට වඩා වැඩි වීමෙන් පසු වී අලෙවි මණ්ඩලය විසින් එක වී බුසලක් හෝ මිළට නොගන්නා ලදි. උඳු කිලෝ ග්‍රෑම් එකක මිළ වර්ෂය පුරාම රුපියල් 10 හා රුපියල් 15 අතර පැවතුනි. රතු ලූනු මිළ අඩුවැඩි වූ අතර, වියළි මිරිස් මිළ ක්‍රමයෙන් වැඩි වී දෙසැම්බර් මාසයේදී කිලෝ ග්‍රෑම් එකක් රුපියල් 80.00 දක්වා වැඩිවිය.

**7. සාමාන්‍ය කරුණු**

කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ නිලධාරීහු, ලබාගත හැකි සම්පත් උපයෝගී කර ගනිමින්, තම තමන්ට හැකි ප්‍රමාණවලින් වගා කටයුතු කරගෙන යෑමට ගම්බද ගොවීන්ට සෑම ආකාරයකින්ම සහාය වූහ. උතුරු පළාතේ ගොවියන් සම්බන්ධයෙන් සලකා බලන විට සමාලෝචනයට භාජනය වූ වර්ෂය දුක් පීඩාවලින් යුත් තවත් වර්ෂයක් විය.

අවසාන වශයෙන්, මගේ යුතුකම් නොපිරිහෙලා ඉටු කිරීමෙහිලා සභාපතිතුමාගෙන් ලැබුණු අගනා උපදෙස් හා දිරි ගැන්වීම අවංකව අගය කොට සලකමි.

**අයි. එම්. වේදනායගම්**
**පළාත් අධ්‍යක්ෂ – උතුරු පළාත**

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## සබරගමුව පළාත වාර්ෂික වාර්තාව — 1987

### 1. සාමාන්‍ය කරුණු

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ රත්නපුරය සහ කෑගල්ල යන දිස්ත්‍රික්ක දෙක සඳහා අවශ්‍ය මුළු සේවක සංඛ්‍යාව කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය විසින් පත්කර තිබුණි. මෙම කාල පරිච්ඡේදය තුළ කිසිම විධායක තනතුරක් ඇබෑර්තු වී නොතිබුන අතර කෘෂිකාර්මික වැඩ කටයුතු සතුටු දායක ලෙස සම්බන්ධීකරණය කරන ලදී.

### 2. ගොවි ජන සේවා මධ්‍යස්ථාන/ව්‍යාප්ත සහ කෘෂිකාර්මික යෙදවුම් නිලධාරීන්

කොළොන්නේ නව ගොවිජන සේවා මධ්‍යස්ථානයක් පිහිටුවීමත් සමග රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටුවා ඇති මුළු ගොවිජන සේවා මධ්‍යස්ථාන සංඛ්‍යාව එකකින් වැඩිවිය. විමධ්‍යගත අයවැය යටතේ හා කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශයෙන් ලැබුණු මුදල් යොදවා රක්වාන මැතිවරණ කොට්ඨාශයේ තවත් ගොවිජන සේවා මධ්‍යස්ථානයක් දැනට ඉදිවෙමින් පවතී. වර්ෂය පුරාම ප්‍රාදේශීය නිලධාරී තනතුරු හයක් ඇබෑර්තු වී තිබීම හේතුකොට ගෙන රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවි ජන සේවා මධ්‍යස්ථානවල පරිපාලනයට බාධා ඇති විය. මේ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කර ඇති නමුදු මෙම ඇබෑර්තු සඳහා නිලධාරීන් මෙතෙක් පත්කර නොමැත. කෑගල්ල දිස්ත්‍රික්කයේ ගොවි ජන සේවා මධ්‍යස්ථාන සංඛ්‍යාව (14) නොවෙනස්ව පැවති අතර එම මධ්‍යස්ථාන සංඛ්‍යාව වැඩි කිරීමට අවශ්‍යතාවක් ඇති නොවිය. ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ලැබුණු මුදල් වලින් ගොඩනැගිලි හතරක් අළුත් වැඩියා කරන ලදී.

ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියේ අනුග්‍රහය යටතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ සුළු අපනයන බෝග සහ සුළු තේ වතු සංවර්ධන අධිකාරියේ ව්‍යාප්ත නිලධාරීන්ගේ සංඛ්‍යාව වැඩි කරන ලදී. පොල් සංවර්ධන නිලධාරීන්ගේ සහ කෘෂිකර්ම උපදේශකවරුන්ගේ සේවක සංඛ්‍යාවද වැඩි කර තිබේ. දිස්ත්‍රික්ක දෙකේම වගා නිලධාරීන් සඳහා ඇබෑර්තු කිපයක් තිබුනි.

### 3. ආහාර බෝග

(අ) වී අස්වැන්න (අක්කරයකින් බුසල්)

| | මුළු දිවයිනේ | කෑගල්ල | රත්නපුර | උඩවලවේ |
|---|---|---|---|---|
| 1985 යල ... ... | 64.83 | 67.37 | 55.11 | 74.84 |
| 85/86 මහ ... ... | 69.54 | 68.62 | 64.01 | 98.77 |
| 1986 යල ... ... | 63.76 | 55.45 | 55.95 | 80.72 |
| 86/87 මහ ... ... | 71.33 | 66.83 | 58.74 | 115.84 |
| 1987 යල ... ... | 65.23 | 60.45 | 59.24 | 87.89 |

1987 යල කන්නයේදී කාලගුණ තත්ත්වයේ ඇති වූ හදිසි වෙනස්වීම් හේතුකොට ගෙන රත්නපුර දිස්ත්‍රික්කයේ ආසන්න වශයෙන් කුඹුරු අක්කර 2,500 කට මුළුමනින්ම නොහොත් අඩ වශයෙන් හානි සිදුවිය. නියඟය හේතු කොට ගෙන කුඹුරු අක්කර 800 පමණ මුළු මනින්ම පාහේ විනාශ වූ බව ගණන් බලා තිබේ. සුළු කුඹුරු ප්‍රමාණයකට පලිබෝධ මගින් හා රෝග වලින් හානි සිදු වූ නමුදු එම පලිබෝධ හා රෝග මර්ධනය කරන ලදී. එය එසේ වුවද, එම කන්නය තුළ පැවති දීප්තිමත් සූර්යාලෝකය හේතුකොටගෙන, අස්වනු ප්‍රමාණයේ වැඩි වීමක් ඇති වී තිබෙන බව ඉහත දක්වා ඇති ඊට කලින් කන්නවල ලැබූ අස්වනු ප්‍රමාණ හා සංසන්දනය කිරීමේ සටහනෙන් පෙනී යයි. 1987 යල කන්නයේදී කෑගල්ල දිස්ත්‍රික්කයේ කුඹුරු අක්කර 1,500 ට පමණ හානි සිදුවූ නමුදු, අස්වැන්න ප්‍රමාණයේ වාර්තාගත වැඩිවීමක් පෙනෙන්න තිබුණි. 1987/88 මහ කන්නයේදී කෑගල්ල දිස්ත්‍රික්කයේ හා රත්නපුර දිස්ත්‍රික්කයේ පිළිවෙලින් කුඹුරු අක්කර 22,126 ක් හා කුඹුරු අක්කර 39,720 ක් වගා කරන ලදී.

බිත්තර වී නිකුත් කිරීම සම්බන්ධයෙන්, රත්නපුර දිස්ත්‍රික්කයේ යල කන්නයේදී බුසල් එක් දහසකට ආසන්න බිත්තර වී ප්‍රමාණයක් නිකුත් කරනු ලැබූ අතර, 1987/88 මහ කන්නයේදී එම ප්‍රමාණය මෙන් පස් ගුණයක් නිකුත්කර තිබේ. කෑගල්ල දිස්ත්‍රික්කයේ යල කන්නයේදී මෙන්ම මහ කන්නයේදී ද බිත්තර වී බුසල් 2,000 ක් පමණ නිකුත් කරනු ලැබූ අතර, ඒ හා සමාන ප්‍රමාණයන් ද්විතීයික බිත්තර වී ගොවිපලවල් මගින් නිකුත් කරන ලදී. බිත්තර වී අවශ්‍යතා දෙපාර්තමේන්තුවෙන්ම සපුරා ගැනීමේ බලාපොරොත්තුව ලිහිල් කිරීමේ අරමුණ ඇතුව, තමන්ට අවශ්‍ය බිත්තර වී තමන් විසින්ම නිෂ්පාදනය කර ගන්නා ලෙස ගොවීන් උනන්දු කරවන ලදී. පැළ සිටුවීමේ යන්ත්‍රය ජනප්‍රිය කරවනු ලැබූ අතර එම යන්ත්‍ර 35 ක් රත්නපුර දිස්ත්‍රික්කය තුළ බෙදා හරින ලදී. කලින් වර්ෂය හා සසඳා බැලීමේදී රත්නපුර දිස්ත්‍රික්කයේ පැළ සිටුවන ලද කුඹුරු ප්‍රමාණයේ සියයට පහක් පමණ වැඩිවීමක් පෙනෙන්න තිබුණි.

(ආ) වෙනත් ක්ෂේත්‍ර බෝග

මෙම වර්ෂයේදී ද 1987/88 මහ කන්නය තුළ කොළොන්න හා රක්වාන යන මැතිවරණ කොට්ඨාශ තුළ විශාල බිම් ප්‍රමාණ යක රතුලූනු හා මුං ඇට වගා කරන ලදී. පෞද්ගලික අංශය සමග ස.තො.ස. හා අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් නිෂ්පාදන මිළට ගැනීම සඳහා උනන්දු කරවනු ලැබුවෙන් හිතකර තරඟකාරී බවක් ඇති වීමෙන් වගාකරුවන්ට සතුටු දායක මිළක් ලැබුණි. ගොවීහු රතුලූනු කිලෝවක් සඳහා රු. 6 සිට රු. 10 දක්වා මිළක් ලබාගත් අතර මුං ඇට සඳහා රු. 10 ක් හෝ ඊට වැඩි මිළක් ලබා ගත්හ. අහිතකර කාල ගුණ තත්ත්වයන් හේතු කොට ගෙන යල කන්නයේ අතිරේක ආහාර බෝග වගා කරන ලද බිම් ප්‍රමාණයේ සුළු අඩුවීමක් පෙනෙන්න තිබුණි. බැංකු මගින් ගොවීන්ට ආධාර ලබා දුන් අතර අවශ්‍ය කෘෂිකාර්මික යෙදවුම් කල් වේලා ඇතිව ලබා ගැනීමට කටයුතු සලස්වන ලදී. විශේෂයෙන් ජල හිඟයක් පවතින කුඹුරු ඉඩම් වල අතිරේක ආහාර බෝග වගා කරන ලෙස කෑගල්ල දිස්ත්‍රික්කයේ ගොවීන් උනන්දු කරවන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් කුඹුරු ඉඩම් අක්කර 140 පමණ මුං ඇට ද, අක්කර 500 කට වැඩි ප්‍රමාණයක එළවළු හා බතලද වගා කරන ලදී. යටියන්තොට ප්‍රදේශයේ අර්තාපල් වගා කිරීම සාර්ථක ලෙස අත්හදා බැලූ අතර, ඉදිරි වර්ෂ තුළ එම ව්‍යාපෘතිය තවදුරටත් ව්‍යාප්ත කිරීම දැන් අවධාන යට ලක් වී තිබේ.

4. රුක් වගා
රබර් වගා

| | නැවත වගා | අළුත් වගා |
|---|---|---|
| කෑගල්ල දිස්ත්‍රික්කය ... | 2,552 | 727 |
| රත්නපුර දිස්ත්‍රික්කය ... | 2,169 | 1,079 |

මෙම වර්ෂයේදී ද අවධානය යොමු කරවන ලද්දේ පැරණි රබර් ඉඩම් නැවත වගා කිරීම කෙරෙහිය. විශේෂයෙන්ම රෝපණ ද්‍රව්‍ය හිඟයක් පවතින කෑගල්ල දිස්ත්‍රික්කයේ තෝරා ගත් කුඩා රබර් වතු හිමියන්ට පැළ තවාන් තාක්ෂණය පිළිබඳ පුහුණුවක් ලබාදී, තවාන් පිහිටුවීම සඳහා රාජ්‍ය බැංකු මගින් ආධාර ලබා දෙන ලදී. එසේ කරන ලද්දේ පැළ හිඟයක් මගහරවා ගැනීමේ පියරවක් වශයෙනි.

ආර්.ආර්.අයි. 103 වගා කර ඇති පෞද්ගලික රබර් ඉඩම් අක්කර 1000 ක් පමණ කොරිනෙස්පෝරා කොළ රෝගයට භාජනය වී තිබුනු අතර, එම ගස් උදුරා දමන ලෙස ඉඩම් හිමියන්ට උපදෙස් දී, ඉක්මනින් එම ඉඩම් නැවත වගා කිරීම සඳහා ආධාර සපයා දෙන ලදී. රෝපණ ද්‍රව්‍ය නිකුත් කිරීමේදී මෙම ප්‍රදේශවලට ප්‍රමුඛතාව දෙනු ලැබේ. කරපිංච හී පිහිටා ඇති ආර්.ආර්.බී. පැළ තවාන්වල වර්ෂ 1988 දී පැළ 2,00,000 ක් පමණ නිපදවීමට කටයුතු යොදා තිබේ. කලින් වර්ෂ වලදී මෙන් මෙම වර්ෂයේදීද, උපදේස සේවා දෙපාර්තමේන් තුව කුඩා වතු හිමියන්ට සතුටුදායක සේවාවන් තවදුරටත් සලසා දෙන ලදී. ගොවීන්ගේ දැනුම වර්ධනය කිරීමේ අරමුණෙන්, ආදර්ශ, පුහුණු කිරීමේ පන්ති හා අත්හදා බැලීම් පවත්වන ලදී.

තේ

රත්නපුර දිස්ත්‍රික්කයේ අක්කර 850 ආසන්න බිම් ප්‍රමාණයක නැවත/අළුතෙන් තේ වගා කරනු ලැබූ අතර, පරණ රබර් ඉඩම් අක්කර 100 ක තේ වගා කරන ලදී. කෑගල්ල දිස්ත්‍රික්ක යේ ඊට අඩු බිම් ප්‍රමාණයක එනම් අක්කර 200 පමණ නැවත අළුතෙන් තේ වගා කරනු ලැබූ අතර, නැවත සැපයුම් වශයෙන් පැළ 1,70,000 ක් නිකුත් කරන ලදී.

තේ වැඩි වශයෙන් වගා කරනු ලබන පළාත්වලට සීමා කරන ලද ක්ෂේත්‍ර දිනයන් පැවැත්වීමෙහිලා කෘෂිකාර්මික කළමණාකරුවෝ සුළු තේ වතු සංවර්ධන අධිකාරියට සහාය විය. සහනාධාර සඳහා හිමිකම් ලබා දෙනු වස් කුඩා තේ වතු නියමානුකූල කිරීම පිණිස පියවර ගන්නා ලදී. රජයට අයත් වතු වලින් උසස් තත්ත්වයේ රෝපණ ද්‍රව්‍ය ලබා ගැනීම සඳහාද කෘෂි කළමණාකරුවන් විසින් කුඩා වතු හිමියන්ට හැකිතරම් දුරට ආධාර කරන ලදී.

පොල් / සුළු අපනයන බෝග

අතුරු වගා වශයෙන් පොල් ඉඩම් වල සුළු අපනයන බෝග, කෙසෙල් හා එළවළු වගා කිරීම ප්‍රධාන වශයෙන් උනන්දු කරවනු ලැබූ අතර, කෑගල්ල දිස්ත්‍රිකක්ය තුළ පමණක් අක්කර 300 ට අධික බිම් ප්‍රමාණයක මෙම බෝග වගා කරන ලදී. මේ සඳහා ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති යටතේද ආධාර ලබා දෙන ලදී. 1986 දී ඇති වූ දරුණු නියඟයේ අහිතකර විපාක වශයෙන් මෙම වර්ෂයේ පලදාව අඩු වූ නමුදු මිළ ගණන් සැලකිය යුතු තරම් යහපත් තත්ත්වයක පැවතුනි. තම පොල් ඉඩම් වලට පොහොර යොදන ලෙස ගොවියන් උනන්දු කරවනු ලැබූ අතර ගොවිජන සේවා මධ්‍යස්ථානවලින් පොහොර ලබාගැනීමට පහසුකම් සලස්වන ලදී. කෑගල්ල දිස්ත්‍රික්කයේ නව ප්‍රාදේශීය කාර්යාලයක් සහ පොහොර සංකීර්ණයක් පිහිටුවන ලදී. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ආසියානු සංවර්ධන බැංකුවේ මුදල් යොදවන ලද විශේෂ ව්‍යාපෘතියක් යටතේ රඹුක්කන ප්‍රදේශ යේ අක්කර 55 වැඩි පලදාවක් ලබාදෙන උසස් වර්ගයේ පොල් පැල වගා කරනු ලැබූ අතර, එම අක්කර ප්‍රමාණයත් සමග, මෙම ව්‍යාපෘතිය යටතේ වගා කරන ලද මුළු අක්කර ප්‍රමාණය 156 ක් විය. තුන්කම පිහිටා ඇති පැල තවානෙන් රත්නපුර දිස්ත්‍රික්කයට අවශ්‍ය තරම් පැල නිපදවනු ලැබූ අතර, වැඩි පුර නිපදවන ලද පැල වෙනත් දිස්ත්‍රික්කවල අවශ්‍යතා සපුරා ලීම සඳහා යොදා ගන්නා ලදී. මෙම බෝග කෙරෙහි තව තවත් ගොවීන් උනන්දු කරවීමේ අදහසින් සුළු අපනයන බෝග ආදර්ශ වගාවන් පිහිටුවනු ලැබූ අතර, පැල ලක්ෂ 12 ට අධික සංඛ්‍යාවක් බෙදා දෙන ලදී.

එන්නත් කිරීමේ වැඩ සටහන්වලදී කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට සහාය වූහ.

තත්ත්වය සතුටුදායක වෙත්ම, මෙම අංශය සංවර්ධනය කිරීම සඳහා කාර්ය මණ්ඩල පත්කිරීම හා කාර්යක්ෂම පශු වෛද්‍ය සේවයක් ලබාදීම වැදගත් වන්නේය.

7. වාරිමාර්ග

මහ පරිමානයේ හා සුළු පරිමානයේ වාරිමාර්ග යෝජනා ක්‍රම නඩත්තු කිරීම හා පුනරුත්ථාපනය කිරීම වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව මගින් තවදුරටත් ඉටුකළ නමුදු සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ලැබූ ප්‍රගතිය සීමාසහිත විය. ජාතිවාදී වියවුල් හේතුකොටගෙන ග්‍රාමීය වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය සඳහා වෙන්කර ඇති මුදල් අත්හිටුවීම අවාසනාවන්ත සිද්ධියකි.

කන්තලේ ජලාශය පුනරුත්ථාපනය කිරීමෙහිලා සතුටුදායක ප්‍රගතියක් ලබා තිබුණි. වේල්ල සහ වම් සොරොව්ව ඉදිකිරීම ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය භාරගත් අතර එහි වැඩ සීමා සහිත 'ස්කන්ස්කා' සමාගම විසින් නිමකරන ලදී. දකුණු සොරොව්ව අළුත්වැඩියා කිරීම සහ ක්ෂේත්‍රයේ හා බෙදා හැරීමේ ඇළ මාර්ග මට්ටම් කිරීම වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් කරන ලදී. වේල්ල පිරවීම සඳහා මෙම වර්ෂය තුළ වැයවූ මුදල රු. 58,951,951/- (දේශීය මුදල් සහ රු. 80,152,586/-) (සැප්තැම්බර් දක්වා විදේශ ආධාර) විය. වාරිමාර්ග ඇළ සහ ඉදිකිරීම් අළුත් වැඩියා කිරීම සඳහා රු. 27,183,450/- ක් වැය කරන ලදී. 1987/88 මහ කන්නය සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ජලය මුදා හැරීම සාර්ථක විය.

ගල්ඔය පුනරුත්ථාපන වැඩ කටයුතු, අම්පාර දිස්ත්‍රික්කය තුළ රු. 13,880,957/- ක් වැය කරමින් හා මඩකලපුව දිස්ත්‍රික්කය තුළ රු. 10,196,169/- ක් වැය කරමින් නිම කරන ලදී. වෙනත් මහ පරිමානයේ වාරිමාර්ග වැඩ සඳහා වැය කළ මුදල්, අම්පාර රු. 18,465,634/- මඩකලපුව රු. 10,248,640/-, ත්‍රිකුණාමලය රු. 1,992,892/- විය. සුළු පරිමානයේ වාරිමාර්ග වැඩ සඳහා වැය කරන ලද මුළු මුදල රු. 1,871,104/- ක් විය. ගල්ඔය ජල පාලන වැඩ සටහන තවදුරටත් ක්‍රියාත්මක වූ අතර ගොවීන්ට වැඩදායක ප්‍රතිඵල ලැබුණි. පළාතේ දැන් පවත්නා තත්ත්වය හේතුකොටගෙන, මහ පරිමානයේ යෝජනා ක්‍රමවල පුනරුත්ථාපන වැඩ නෙලුඔය ව්‍යාපෘතිය සහ පෙරියකලපු ජලාපවහන ව්‍යාපෘතිය ප්‍රමාද වී තිබේ.

8. ගොවිපල බලය.

දිස්ත්‍රික්කතුල දැනට පවත්නා තත්ත්වය හේතුකොට ගෙන රාජ්‍ය බැංකු මගින් කෘෂිකාර්මික උපකරණ නිකුත් කිරීම සම්බන්ධයෙන් කිසිදු ප්‍රගතියක් ලබා නොමැත.

මූතූර් හා සේරුවිල මැතිවරණ කොට්ඨාශවල රෝද දෙකේ ට්‍රැක්ටර් හිමියන් සඳහා පුහුණු කිරීමේ වැඩ සටහන් දෙකක් කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ යෙදවුම් අංශය විසින් අනුරාධපුර ගොවි යන්ත්‍රෝපකරණ පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේදී පවත්වන ලදී.

9. බැංකු කටයුතු / ණය යෝජනා ක්‍රම

රාජ්‍ය බැංකු ප්‍රධාන නගරවල පමණක් ක්‍රියාත්මක විය. මෙම පළාතේ දැනට පවත්නා තත්ත්වය හේතුකොටගෙන බැංකු කටයුතු හා ණය පහසුකම් ගොවි ජන සේවා මධ්‍යස්ථාන මගින් ලබාගත නොහැකි විය.

කන්තලේ වී වගා කිරීමේ විශේෂ ණය යෝජනා ක්‍රමය වෙළඳ හා නාවික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් හා කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා විසින් නිර්දේශ කර දැඩි ලෙස දිරි ගන්වන ලදී. කන්තලේ ව්‍යාපෘති ප්‍රදේශයේ ගොවියන් සඳහා 1987/88 මහ කන්නය වෙනුවෙන් රජය විසින් විශේෂ ණය යෝජනා ක්‍රමයක් අනුමත කරන ලදී.

අක්කරයක් සඳහා මුළු මුදල රු. 1,500/- කි. (බිත්තර වී පොහොර සහ සී සෑමේ වියදම්) ණය යෝජනා ක්‍රමය මහජන බැංකුව තුලින් ක්‍රියාත්මක කරනු ලැබූ අතර අනුමත කරන ලද මුදල රුපියල් මිලියන 27 ක් විය. අක්කර 19,600 ක් වන කුඹුරු ප්‍රමාණයම වගා කිරීමට බලාපොරොත්තු වූ අතර, දෙසැම්බරයේදී අක්කර 6,000 ක් පමණක් වගා කිරීමටත් තවත් අක්කර 3,500 ක් පෙබරවාරි මුල් භාගයේදී වගා කිරීමටත් පසුව තීරණය කරන ලදී. මෙම යෝජනා ක්‍රමය කන්තලේ ගොවියන් නැවත පදිංචි කරවීමෙහිලා යහපත් ප්‍රතිඵල ලබා දී ඇති අතර කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් මෙම වැඩ පිළිවෙල සම්බන්ධීකරණය කරන ලදී. පළමුවන අධියර අවසානයේදී කුඹුරු අක්කර 7,861 ක් වගා කර තිබූ අතර, දෙන ලද ණය සංඛ්‍යාව 1,572 ක් විය. ණයට දුන් මුළු මුදල රුපියල් මිලියන 7 කි.

සමාප්තිය

විශේෂයෙන්ම කන්තලේ ගොවියෝ, තත්ත්වය කුමක් වියහැකි දෝයි නොදැන, බියෙන් හා සන්ත්‍රාසයෙන් ජීවත් වූහ. බොහෝ දෙනෙක් ප්‍රදේශය හැර ගොස් වර්ෂය අවසාන යේදී ක්‍රමයෙන් ආපසු පැමිණියහ. ජනවාර්ගික ප්‍රශ්නය හේතුකොටගෙන සමාලෝචනයට භාජනය වූ වර්ෂය

තුළ පළාතේ නිෂ්පාදන අංශ ගණනාවක වැඩ කටයුතුවලට සැලකිය යුතු ප්‍රමාණයක අඩාලවීමක් සිදු වී තිබේ.

කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ සභාපති තුමාගෙන් ලැබුනු මාර්ගෝපදේශ අගය කරන අතර ඒ සම්බන්ධයෙන් කෘතඥතාවය සහ ස්තුතිය පුද කරමි. ගරු දිසා ඇමතිවරුන්ටත්, අදාල පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටත්, දිසාපතිවරුන්ටත් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ටත් කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලයටත් මගේ අවංක ස්තුතිය පුද කරමි. ඉදිරි වර්ෂය තුළ ජාතිවාදී කලබලකාරී තත්ත්වය සමථයකට පත් වී, කෘෂිකාර්මික අංශයේ වඩා යහපත් ප්‍රගතියක් ඇති වේවායි ප්‍රාර්ථනා කරමි.

**ඩී. එච්. එස්. ඩබ්ලිව්. තිලකරත්න**
පළාත් අධ්‍යක්ෂ – නැගෙනහිර පළාත

| | | |
|---|---|---|
| 8. රබර් පිළිබඳ එක් දින වැඩ මුළුවක් | ගොවීන් පිරිසකට | කෘෂි කළමනාකරු, කෑගල්ල රබර් පර්යේෂණායතනයේ සහාය ඇතිව. |
| 9. නුවරඑළිය දිස්ත්‍රික්කයේ ඒකාබද්ධ ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ ආදර්ශන පැවැත්වීම | ගොවීන් පිරිසකට | කෘෂි කළමනාකරු, නුවරඑළිය |
| 10. ගව පාලනය | ගොවීන් 259 | කෘෂි කළමනාකරු - නාවලපිටිය ජාතික පශු සම්පත් මණ්ඩලයේ සහාය ඇතිව. |
| 11. තේ තවාන් පාලනය | ගොවීන් 69 | කෘෂි කළමනාකරු, නාවලපිටිය |
| 12. තේ තවාන්කරුවන් පුහුණු කිරීම | කුඩා තේවතු හිමියන්ගෙන් තෝරා ගන්නා ලද ගොවීන් 20. වගා නිලධාරී 04 | කෘෂි කළමනාකරු, මස්කෙළිය |
| 13. ගොයම් පැල සිටුවීමේ යන්ත්‍ර භාවිතය | ගොවීන් 15 | කෘෂි කළමනාකරු, නාවලපිටිය |
| 14. නවීන තාක්ෂණය භාවිතාකොට සහල් කෙටීම, තැම්බීම, වියළීම, ගබඩා කිරීම හා ප්‍රමිතයන් අනුව සහල් සැකසීම පිළිබඳ දින 3 පුහුණුවක් | වී මෝල් හිමියන් 105 දෙනෙකුට | කෘෂි කළමනාකරු, පඩුවස්නුවර |
| 15. මී මැසි පාලනය | ගොවීන් 27 | කෘෂි කළමනාකරු - නාවලපිටිය |
| 16. බිම මල් වගාව | ගොවීන් 21 | කෘෂි කළමනාකරු - නාවලපිටිය |
| 17. කිරි නිෂ්පාදන කටයුතු පිළිබඳ | කිරි නිෂ්පාදන සාමාජිකයන් 85 | කෘෂි කළමනාකරු - කුලියාපිටිය |
| 18. දඹල වගාව | ගොවීන් 05 | නි. පළාත් අධ්‍යක්ෂ - පුත්තලම |

### උක් වගා ව්‍යාප්ත කටයුතු පිළිබඳ පුහුණු

පැල්වත්ත සීනි සමාගම අවට මැතිවරණ කොට්ඨාශවල වගා නිලධාරීන් සහ කෘෂිකර්ම ව්‍යාප්ත සේවක මහත්මා/ මහත්මීන්ට උක් වගා ව්‍යාප්ත කටයුතු පිළිබඳ දින 3 ක පුහුණු වක් ආරම්භ කර තිබේ. මෙය පැල්වත්ත සීනි සමාගමේ යලබෝව ගොවිපලේදී පවත්වා ගෙන යනු ලබන්නේය. පුහුණුව මෙහෙයවන්නේ පැල්වත්ත සීනි සමාගමේ කාර්මික නිලධාරීන් වන අතර සංවිධානය කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය මගිනි. දැනටමත් අවස්ථා 3 කදී නිලධාරීන් 50 කට මෙම පුහුණුව ලබා දී ඇත. 1988 වර්ෂයතුල ඉතිරි පුහුණු සංවිධානය කිරීමට බලාපොරොත්තුවේ.

### බැංකු කළමනාකාර මහතුන්ගේ කෘෂිකාර්මික පුහුණු

රත්නපුර දිස්ත්‍රික්කයේ, මහජන බැංකු කළමනාකාර මහතුන්ට සහ ලංකා බැංකු කළමනාකාර මහතුන්ට කෘෂි කාර්මික පුහුණුවක් පහත සඳහන් අයුරින් පවත්වන ලදී.

1. රත්නපුර දිස්ත්‍රික්කයේ මහජන බැංකු කළමනාකාර මහතුන් 19 දෙනෙකුට බිදිණුවැව සේ.සං. අභ්‍යාස මධ්‍යස්ථානයේදී ද,
2. රත්නපුර දිස්ත්‍රික්කයේ, ලංකා බැංකු කළමනාකාර මහතුන් 25 දෙනෙකුට බිදිණුවැව සේ. සං. අභ්‍යාස මධ්‍යස්ථානයේදී ද ලබා දෙන ලදී.

### ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය

කෘෂි සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂවරුන්ට ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ හඳුන්වා දීමට දේශන සහ සාකච්ඡා ඇතුලුව එක් දින සම්මේලනයක් කොළඹ, විජේරාම මාවතේ ගොවි පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වන ලදී.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## පුහුණු හා ප්‍රචාරක වාර්ෂික වාර්තාව — 1987

**ප්‍රශංසා සහතික පත්**

1987 වර්ෂය තුළදී මින්නේරිය, නිකවැරටිය සහ යටිනුවර මැතිවරණ කොට්ඨාශවල ගොවීන්ට ප්‍රශංසා සහතික පත් නිකුත් කරන ලදී.

**ප්‍රචාරක කටයුතු**

(අ) සභාපතිතුමාගේ නිකවැරටිය මැතිවරණ කොට්ඨාශයේ නිල සංචාරය පිළිබඳ විශේෂ ගුවන් විදුලි වැඩ සටහනක් ශ්‍රී ලංකා ගුවන් විදුලි සේවයේ, ස්වදේශීය සහ රජරට සේවා ඔස්සේ ප්‍රචාරය කරන ලදී.

(ආ) පැල්වත්ත සීනි කම්හලේ විවිධ සංවර්ධන අවස්ථා පිළිබිඹු කරන ගුවන් විදුලි වැඩ සටහනක් ප්‍රචාරය කරන ලදී.

පැල්වත්ත සීනි කම්හලේ විවිධ සංවර්ධන අවස්ථා අලලා රූ ගැන්වූ රූපවාහිනී චිත්‍රපටිය ශ්‍රී ලංකා රූපවාහිනියෙන් පෙන්විය.

(ඇ) පුවත් පත් වාර්තාකරුවන්ට 1986 කෘ.සං.අයේ වාර්ෂික වාර්තාව බෙදා, රටේ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය විසින් කරන ලද අගනා සේවය පිළිබඳ පුළුල් ප්‍රචාරයක් පුවත් පත්, ගුවන් විදුලිය සහ රූපවාහිනිය මගින් ලබා දී ඇත.

**එන්. යූ. අයි. පෙරේරා**
අධ්‍යක්ෂ පුහුණු හා ප්‍රචාරක

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## කෘෂිකාර්මික යෙදවුම් අංශය—වාර්ෂික වාර්තාව—1987

උචිත අවස්ථාවේදී අවශ්‍ය කෘෂිකාර්මික යෙදවුම් ක්ෂේත්‍ර මට්ටමෙන් ලබාගත හැකිවීම උපරිම කෘෂිකාර්මික නිෂ්පාදනයක් අත්පත් කර ගැනීමෙහිලා මූලික අවශ්‍යතාවයක් වන්නේය. ගොවීන්ට අවශ්‍ය කෘෂිකාර්මික යෙදවුම් සම්බන්ධ දැනුම හා සැපයුම් ලබාදීමේ ක්‍රියාවලියේදී, රජයේ හා පෞද්ගලික අංශයේ විවිධ ආයතන අතර ඒකාබද්ධ ක්‍රියාකාරිත්වයක් සහතික කිරීමෙහිලා අවශ්‍ය සම්බන්ධීකරණය ඇති කිරීම පිණිස යෙදවුම් අංශය සාර්ථක ලෙස ක්‍රියා කරන ලදී.

### කාර්ය මණ්ඩලය

එස්.ජී. ගුණතිලක මහතා, යෙදවුම් පිළිබඳ නියෝජ්‍ය අධ්‍යක්ෂණය සහ රක්ෂණ තනතුරට 1987 මැයි මාසයේදී පත් කරන ලදී. යෙදවුම් පිළිබඳ නියෝජ්‍ය අධ්‍යක්ෂ පොහොර හා කෘෂි රසායන, තනතුරේ සේවය කල බී.බී.ඒ.ඊ. මැදිවක මහතා 1987 ජුනි මාසයේදී කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ සේවයෙන් ඉවත්ව ගියේය.

යෙදවුම් අංශය යටතේ ඇති එක් එක් කාර්ය භාරයන් මගින් කරන ලද වැඩ කොටස පහත දක්වා ඇත.

### බීජ හා රෝපණ ද්‍රව්‍ය

පෙර දක්වා සිදුවූ සියලු පාඩු දරා සිටිමින් රජය විසින් බීජ නිෂ්පාදනය කෙරෙහි සහනාධාර සලසා දෙනු ලැබූ අතර, මෙම තත්ත්වය තවදුරටත් පවත්වා ගෙන යා යුතුද එසේ නැතහොත් නිදහස් තීරන මගින් ආර්ථික එලදායි බව ලබා ගත හැකි පුද්ගලික අංශය මේ කාර්ය සඳහා සහභාගී කරවා ගත යුතුද යන්න දැඩි අවධානයට යොමු වී තිබේ.

මෙතෙක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිෂ්පාදනය කරනු ලැබූ ලියා පදිංචි කල බිත්තර වී නිෂ්පාදන ක්‍රියාවලියෙහි වෙනසක් ඇති වී තිබේ. ලියා පදිංචි කල බිත්තර වී නිෂ්පාදනයෙහිලා කොන්ත්‍රාත් වගා කරුවන්ගේ සහභාගීත්වය ලබා ගැනීමට හැකි වන පරිදි ලිහිල් කිරීම පෞද්ගලික-කරණය කෙරෙහි නැඹුරුවීමක් වශයෙන් නිරීක්ෂකයෝ කල්පනා කරති. ලියා පදිංචි කල බිත්තර වී වගාවක් නිෂ්පාදනය කිරීමේදී අනුගමනය කලයුතු අමතර ක්ෂේත්‍ර කටයුතු හේතු වෙන් අමතර දිරිගැන්වීමක් නොලබන එම බිත්තර වී කොන්ත්‍රාත්කරුවන් අවාසිදායි තත්ත්වයකට මුහුණදීමට සිදුවී ඇත. කොන්ත්‍රාත්කරුවන් විසින් වගා මිලට ගනු ලබන ලියා පදිංචි කල බිත්තර වී සහ සහතික කල බිත්තර වී සඳහාත් දැනට ගෙවනු ලබන්නේ එකම මිළකි.

සමාලෝචනයට භාජනය වූ වර්ෂයේ මුල් භාගයේදී දිවයින පුරා පැවැති නියඟය හේතුකොට ගෙන 1987/88 මහ කන්නයේ දී ඇති වීමට ඉඩ තිබුණු විශාල බිත්තර වී හිඟයක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ අංශයෙහි දැඩි සැලකිල්ල හේතුවෙන් වලක්වා ගත හැකි විය. එමගින් බිත්තර වී ඉල්ලුම් කල අයට අවශ්‍ය තරම් බිත්තර වී ලබා ගැනීමට කටයුතු සැලසුනි.

බිත්තර වී ඉල්ලුම් කරන අවධියේදී වැඩි සුපරීක්ෂාකාරී වීම හේතුවෙන් සත්‍ය අවශ්‍යතාවයට වඩා අඩුවෙන් බිත්තර වී ඉල්ලුම් කර සැපයීම සමහර අවස්ථාවන්හි දී බිත්තර වී හිඟයක් ඇති කිරීමට තුඩුදුනි. බිත්තර වී අළුත් කිරීම 10% සීමාව දැඩි ලෙස අනුගමනය නොකර, ගොවීන්ට වඩා හොඳ ව්‍යාප්ති සේවාවක් සලසාදීමෙන් තත්ත්වය නිවැරදි වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### එලවළු බීජ

උඩරට එළවළු බීජ තවදුරටත් පෞද්ගලික අංශය මගින් ආනයනය කරන ලදී. දෙපාර්තමේන්තුවේ නිසි නිර්දේශයක් නොමැතිව වෙළඳ පලට ඉදිරිපත් කර ඇති අළුත් එළවළු වර්ග ගණනාවක් තිබේ. එළවළු නිෂ්පාදකයින්ට තම කැමැත්ත පරිදි තෝරා ගැනීම පිණිස එළවළු ඇට වර්ග රාශියක් වෙළඳ පොලේ තිබුනද ඉහතින් සඳහන් කල කරුණ අනුව අප දේශගුණික තත්ත්වයට සැබවින්ම ගැලපෙන්නේද යන්න සැකයකින් යුතුව එම නව එළවළු බීජ වර්ග වගා කිරීමට සිදුවනු ඇත.

### බීජ අර්තාපල්.

සාමාන්‍ය ව්‍යාප්ත කිරීමේ කාර්යය සඳහා බීජ අර්තාපල් ආනයනය කිරීම නතර කිරීමේ යෝජනාවක් කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශය විසින් අනුමත කර තිබේ. රජයේ ගොවිපල වල බෝ කර එයින් ලැබෙන අර්තාපල්, බීජ අර්තාපල් වශයෙන් වගා කරුවන් අතර බෙදාදීම සඳහා බීජ අර්තාපල් සීමා සහිත ප්‍රමාණයක් ආනයනය කරනු ලැබේ. විදේශ විනිමය ඉතිරි කිරීම අනුව සලකා බලන විට මෙය සතුටුදායක යෝජනාවක් වන්නේය. කරුණු කෙසේ වුවත්, යථා තත්වය අනුව සලකා බලන විට සම්පූර්ණ බීජ අර්තාපල් අවශ්‍යතාවය සපුරාලීමට රජයේ ගොවිපල වලට හැකියාවක් තිබේද? වඩාත්ම සුදුසු වන්නේ ආනයනය කරන බීජ ප්‍රමාණය අධියරයෙන් අධියර අඩු කිරීමයි. අධියර යෙන් අධියර අඩු කිරීමේ කාල සීමාව නිෂ්පාදන හැකියාව පිළිබඳ මිම්මක් නොහොත් පරීක්ෂා කිරීමක් වශයෙන් උපයෝගී කරගත හැකි අතරම එය බීජ අර්තාපල් සඳහා වන දේශීය ඉල්ලුම සැපයීම සඳහා අවශ්‍ය වන නිෂ්පාදන ඉලක්ක සපුරාලීමෙහිලා ඇති විය හැකි අඩුපාඩු පිරිමසාලීමට ද ආධාර වනවා ඇත.

### වෙනත් ආහාර බෝග.

සමාලෝචනයට භාජනය වූ වර්ෂයේ යල සහ මහ යන දෙකන්නයේම අතිරේක ආහාර බෝග සඳහා බීජ සැපයුම්

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

**කෘෂිකාර්මික යෙදවුම් අංශය — වාර්ෂික වාර්තාව — 1987**

මෙන්ම බෙදා හැරීම ද සතුටුදායක විය. 1987/88 මහ කන්න යේදී ඉරිඟු බීජ සඳහා වෙනත් වර්ගවල බීජ වලට වඩා වැඩි ඉල්ලුමක් පැවැති අතර, එම ඉල්ලුම සපුරාලීමට දෙපාර්ත මේන්තුවට හැකි විය.

### වන වගාව.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහභාගිත්වය ඇතිව කෘෂිකර්ම සංවර්ධන අධිකාරිය විසින් කළුතර දිස්ත්‍රික්කයේ වන වගා ව්‍යාප්ත කිරීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩ පිළිවෙල යටතේ මංමාවත් දෙපස, පාසැල් භූමිවල හා වෙනත් රජයේ ආයතන වල රුක් රෝපනය කිරීම සහ දර ලබා ගැනීමේ අරමුණ ඇතිව ප්‍රජා වන සංවර්ධනය කිරීම සිදු කරන ලදී.

## ගොවිපල බලය සහ උපකරණ

අස්වැන්න නිෂ්පාදනය කිරීමේ වියදම ඉහලයාම හේතු කොට ගෙන කෘෂිකාර්මික යාන්ත්‍රිකරණය එන්ට එන්ටම වඩ වඩා වැදගත් වන්නේය. සැපයීම් කරන සියළුම ආයතන සම්බන්ධීකරණය කිරීම මගින් පිට පිටම අටවැනි වසරටත් ගොවීන්ට සහනදායක මිළ ගණන් වලට කෘෂිකාර්මික යන්ත්‍ර සහ උපකරණ ලබාදීමට යෙදවුම් අංශයට හැකි වී තිබේ.

### උදළු තල.

අවශ්‍ය මුළු උදළු තල ප්‍රමාණයම ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව මගින් නිපදවනු ලැබූ අතර සම්පූර්ණ නිෂ්පාදනය 3,33,335 ක් විය. මෙය පසුගිය වර්ෂයේ නිෂ්පාදන ප්‍රමාණයට වඩා 37% කින් පමණ අඩු වී ඇති බව පෙනේ. මෙම අඩු වීමට හේතුව වශයෙන් දක්වා ඇත්තේ අමුද්‍රව්‍ය ලබා ගැනීමේ දුෂ්කරතාවයයි.

### රෝද දෙකේ සහ රෝද හතරේ ට්‍රැක්ටර්.

ප්‍රධාන වශයෙන් උතුරු හා නැගෙනහිර පළාත් වල පැවති කලබලකාරී තත්වය නිසාත්, මිළ ගණන් වැඩි වීම නිසාත් රෝද 2 සහ රෝද 4 ට්‍රැක්ටර් අලෙවියේ පසුබෑමක් පෙනෙන්නට තිබුණි. මීට කලින් වර්ෂය හා සසඳා බලන කල මෙම වර්ෂය තුළ අලෙවි කරන ලද රෝද දෙකේ ට්‍රැක්ටර් සම්පූර්ණ ප්‍රමාණය 45% කින් පමණ අඩුවී තිබුණි. නොකඩවා ඇති වූ මිළ වැඩිවීම හේතුකොට ගෙන ණය යෝජනා ක්‍රම යටතේ ට්‍රැක්ටර් ලබාගන්නා ගොවීන්ට දුෂ්කරතාවලට මුහුණපෑමට සිදු විය. ණය දීමේදී ගොවියන් තුළ ඇති එම ණය ආපසු ගෙවීමේ හැකියාව ගැනද බැංකු සැලකිලිමත් විය. මිළ ගණන් ස්ථාවරව හා තුලනාත්මක වශයෙන් පහත් මට්ටමක පැවැති බැවින් කොරියානු ට්‍රැක්ටර් එන්ට එන්ටම ජනප්‍රිය වෙමින් තිබුණි.

### පැල සිටුවීමේ හා වල් නෙලීමේ යන්ත්‍ර

1986 දී ප්‍රථමවරට ඉදිරිපත් කරන ලද පැල සිටුවීමේ යන්ත්‍රයේ ක්‍රියාකාරිත්වය බොහෝ ප්‍රදේශවල සාර්ථක විය. ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් පදනම් කරගෙන ගොවිපල යාන්ත්‍රික පර්යේෂණ මධ්‍යස්ථානය විසින් මෙම යන්ත්‍රයේ වෙනස්කම් ඇති කරන ලදී. අවශ්‍ය වල් නෙලීමේ යන්ත්‍ර සම්පූර්ණ සංඛ්‍යාව වැලිසර පිහිටි කෘෂිකර්ම යන්ත්‍රෝපකරණ කර්මාන්තශාලා වේදී නිෂ්පාදනය කරනු ලැබූ අතර, ප්‍රවාහනය කිරීමේ පහසුව තකා එම යන්ත්‍ර මීටක් සවි නොකර බෙදා හරින ලදී.

### කෘෂිකාර්මික වතුර පොම්ප හා ඉසින යන්ත්‍ර

කනිනලද ලිංවල ජලය උපයෝගී කර ගනිමින් වෙනත් ක්ෂේත්‍ර බෝග වගා කිරීමට ගොවියන් වැඩි වැඩියෙන් පෙළඹී ඇති බැවින් වතුර පොම්ප සඳහා ඇති ඉල්ලුම එන්ට එන්ටම වැඩි විය. එය එසේ වුවද, කුඩා බිම් ප්‍රමාණයක් (අක්කරයක් හෝ ඊට අඩු ප්‍රමාණයක්) හිමි ගොවීන්ට අඟල් 2 පෙට්රල්/භූමිතෙල් වතුර පොම්පයක් අත්පත් කර ගැනීම ආර්ථික වශයෙන් ලාභදායක ආයෝජනයක් නොවන බැව් පෙනී ගියේය. මෙම ප්‍රශ්ණය ගොවිපල් යාන්ත්‍රික පර්යේෂණ මධ්‍යස්ථානය වෙත ඉදිරිපත් කරන ලදී. චීන නළ දම්වැල් ජල රෝද ක්‍රමය පදනම්කරගත් ජලය එසවීමේ සුදුසු යන්ත්‍ර යක් නිපදවා ගොවිපල් යාන්ත්‍රික පර්යේෂණ මධ්‍යස්ථානය වෙත භාර දෙන ලදී.

''මරුනකා'' ඉසීමේ යන්ත්‍ර සේවයෙහි යෙදවීම සඳහා ජංගම ඉසීමේ සේවා වැඩ සටහනක් ගාල්ල සහ පුත්තලම දිස්ත්‍රික්ක තුළ ක්‍රියාත්මක කරන ලදී.

### කොළ මඩින යන්ත්‍ර

ගොයම් කොළ මඩින යන්ත්‍ර උපයෝගී කර ගැනීම ක්‍රම යෙන් වැඩිවූ අතර ඇතැම් ප්‍රදේශවල කොළ මැඩීම සියයට සියයක්ම සිදු කරන ලද්දේ යාන්ත්‍රික කොළ මඩින යන්ත්‍ර උපයෝගී කර ගනිමිනි. මෙම යන්ත්‍ර මගින් අත්වලට සිදුවන තුවාලවීම් වැලැක්වීමේ අවශ්‍ය ආරක්ෂා විධි මෙම යන්ත්‍රවල ඇතුලත් කරන ලෙස ප්‍රධාන කොළ මඩින යන්ත්‍ර සැපයුම් කරුවන්ට නියම කරන ලදී. යන්ත්‍රවල ඇතිකරන ලද වැඩි දියුණු කිරීම් සහ ගොවීන් වෙත ලබාදෙනු ලැබූ ප්‍රචාරක හා පුහුණු කිරීමේ වැඩ කටයුතු හේතුකොටගෙන මෙම තුවාලවීම් බොහෝදුර අඩු වී තිබේ.

### අස්වනු නෙලීමේ උපකරණ

මීට කලින් වර්ෂයේදී ප්‍රථම වරට සේවයේ යොදාගත් අස්වනු නෙලීමේ උපකරණය ගොවීන් අතර බෙහෙවින් ජනප්‍රිය වී තිබේ. 1987/88 මහ කන්නය සඳහා අස්වනු නෙලීමේ ඒකක 80 ක් පමණ සැපයීමට එය සාදන එකම නිෂ්පාදකයන් විසින් කටයුතු යොදා තිබේ. මෙම උපකරණ සඳහා එන්ට

එන්ටම වැඩිවන ඉල්ලුමක් ඇත්තේ වී නමුදු එය භාවිත කිරීමේදී සමීප අධීක්ෂණයක්, පුහුණු කිරීමක් සහ අලෙවියෙන් පසු සේවාවන් අවශ්‍යවන බැවින්, මෙම උපකරණ සැපයුම සීමා කිරිමට තීරණය කර තිබේ.

### පුහුණු කිරීමේ වැඩ පිළිවෙල

දැනට ගොවියන්ට ලබාගත හැකිව ඇති විවිධාකාර නවීන කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ වයඹ පළාතේ සහ උතුරු මැද පළාතේ කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ට හඳුන්වාදී එම යන්ත්‍රෝපකරණ ව්‍යාප්ත කිරීමේ විවිධ අංශ පිළිබඳව සාකච්ඡා කිරීම පිණිස එම නිලධාරීන් සඳහා ගොවිපල් යාන්ත්‍රික මධ්‍යස්ථානයේ සේවාස්ථ පුහුණු මධ්‍යස්ථානයේදී දින 3 ක පුහුණු කිරීමේ වැඩ සටහනක් සංවිධානය කරන ලදී.

යන්ත්‍රෝපකරන නඩත්තු කිරීමේ හා පාලනය කිරීමේ වැඩ සටහන සඳහා අධික ඉල්ලුමක් තිබුන බැවින් අප විසින්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යාපන අංශයේද සහාය ඇතිව, හම්බන්තොට, ගාල්ල, මොණරාගල, රත්නපුර, කළුතර, ගම්පහ, කෑගල්ල, මහනුවර, පොළොන්නරුව, අනුරාධපුරය සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල රෝද 2 ට්‍රැක්ටර් හිමි ගොවීන් සඳහා එවැනි වැඩ සටහන් දහයක් පවත්වන ලදී.

ගොවිපල යන්ත්‍රෝපකරණ පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේ නිලධාරීන්ගේ සහයෝගය ඇතිව වතුර පොම්ප යාන්ත්‍රික පුහුණු කිරීමේ සතියේ වැඩ සටහන් තුනක් පුලියන්කුලම පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේදී සංවිධානය කරන ලදී. නාරහේන්පිට ට්‍රැක්ටර් පුහුණු කිරීමේ පාසැලේදී ට්‍රැක්ටර් හිමියන් පුහුණු කිරීමේ වැඩ සටහන් 5 හක් සමාලෝචනයට භාජනය වූ කාලය තුළ තවදුරටත් පවත්වාගෙන යන ලදී.

### ආදර්ශන

රෝද 2 ට්‍රැක්ටර් ආදර්ශන ගලිගමුව හා යටියන්තොට මැතිවරණ කොට්ඨාශ තුළ පවත්වනු ලැබූ අතර නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවි ජන සේවා මධ්‍යස්ථානවලදී පැළෑටි සංරක්ෂණ උපකරණ ආදර්ශන 5 ක් පවත්වන ලදී.

### ජාතික ගොවිපල යන්ත්‍රෝපකරණ කමිටුවේ වැඩ කටයුතු හා රැස්වීම්

ජාතික ගොවිපල යන්ත්‍රෝපකරණ කමිටුවේ සියලුම රැස්වීම්වලට සහභාගී වී සියලුම දේශීය කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ නිෂ්පාදකයන්ගේ ජාත්‍යන්තර නාමාවලියක් ප්‍රකාශයට පත් කිරීම සඳහා තොරතුරු රැස් කළෙමි.

## වාරිමාර්ග

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ සුළු පරිමාණයේ මෙන්ම මහ පරිමාණයේ වාරිමාර්ග යෝජනා ක්‍රමවල කළමනාකරණයේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම කෙරෙහි උපරිම ප්‍රමුඛතාව ලබා දෙන ලදී. නොසැලකිල්ල, කන්න රැස්වීම් වලදී ගනු ලබන තීරණ නොපිළිපැදීම සහ ගොවියන්ගේ සහභාගිත්වය ප්‍රමාණවත් නොවීම කළමනාකරණය පිරිහී යෑමට හේතුවූ අතර එම ඌනතා මුල් අවස්ථාවලදීම මගහරවා ගත යුතුවේ. මෙම අරමුණ ඇතිව, ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතනයේ සහභාගීත්වය ඇතිව මහ පරිමාණයේ වාරිමාර්ග ක්‍රම හා ජල කළමනාකරණය පිළිබඳ ඒකාබද්ධ කළමනාකරණ වැඩ පිළිවෙලවල් මගින් කළමනාකරණ ශ්‍රේණි සඳහා අධ්‍යයන, සම්මන්ත්‍රණ හා සංස්කරණ පාඨමාලා පවත්වන ලද අතර එම කරුණු ක්ෂේත්‍ර මට්ටමේදී ක්‍රියාත්මක කරන බවට වගබලා ගන්නා ලදී.

කලින් වර්ෂය තුළ පැවති වියළි කාලගුණ තත්ත්වයන් 1987 මුල් භාගය තුළද පැවතුනි. එය හේතුකොට ගෙන, වැව් විශාල සංඛ්‍යාවක් පුනරුත්ථාපනය කිරීමෙන් බලාපොරොත්තු වූ පල ප්‍රයෝජන ලබාගත නොහැකි විය.

දැනට පවත්නා කලබලකාරී තත්ත්වයන් හේතුකොටගෙන උතුරු හා නැගෙණහිර පළාත්වල ග්‍රාමීය වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය හා ඒකාබද්ධ ග්‍රාමසංවර්ධන ව්‍යාපෘතිය යන වැඩ පිළිවෙලවල් තවදුරටත් නතර කර තැබීමට සිදුවිය. කුරුණෑගල ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ශේෂව තිබුණු වැඩ තවදුරටත් කරගෙන යන ලදී.

### සුළු වාරිමාර්ග

සුළු වාරිමාර්ග වැඩ පුනරුත්ථාපනය සඳහා රුපියල් මිලියන 50 ක් ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවට වෙන් කරන ලදී. එම මුදලෙන් රුපියල් මිලියන 42.5 ක් ගොවි ජන සේවා සහකාර කොමසාරිස්වරුන්ට ගෙවනු ලැබූ අතර රුපියල් මිලියන 2.35 ක් නියම කරන ලද වැඩ ගණනාවක් ක්‍රියාත්මක කිරීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත මුදා හරින ලදී. එහෙත් ආරක්ෂක වියදම් වෙනුවෙන් මෙම මුදල් ප්‍රමාණයෙන් 10% ක් කපා හැරීම හේතුකොට ගෙන වැඩ ප්‍රමාණය අඩු කිරීමට සිදුවිය.

වර්ෂය අවසානයේදී වැඩ අංක 1300 ක් පමණ දිස්ත්‍රික්ක මට්ටමේ ආරම්භ කර තිබුණු අතර වෙන් කරන ලද මුළු මුදලම වැය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ග්‍රාමීය වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය යටතේ වූ ජල කළමනාකරණ මගින් ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව විසින් සුළු පරිමාණයේ වාරිමාර්ග යෝජනා ක්‍රම ගණනාවක කාර්යක්ෂමතාව වැඩි දියුණු කරන ලදී.

බුල්ඩෝසර යන්ත්‍ර ගණනාවක් යොදා ග්‍රාමීය වැව්වල රොන්මඩ ඉවත්කිරීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කරන ලදී. මැතිවරණ කොට්ඨාශ ගණනාවක් තුළ මෙම කාර්යය ඉටු කරන ලද්දේ විමධ්‍යගත අයවැය යටතේ ලැබුණු මුදල්

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

**කෘෂිකාර්මික යෙදවුම් අංශය — වාර්ෂික වාර්තාව — 1987**

වලිනි. මුදල් නොමැතිවීම හේතුකොට ගෙන යන්ත්‍රෝප කරණ ප්‍රයෝජනයට නොගෙන ඇති අවස්ථා පෙනෙන්ට තිබුණු බැවින්, වැඩ සටහන අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා එක් එක් මැතිවරණ කොට්ඨාශයක් වෙනුවෙන් විමධ්‍ය ගත අයවැය යටතේ අවම වශයෙන් රු. 2,50,000/- ලබා ගැනීමට යෝජනා කර තිබේ.

වාරිමාර්ග වැඩ හැර වෙනත් කාර්යයන් සඳහා බුල්ඩෝසර් යන්ත්‍ර යොදා ගැනීමේ අවස්ථා පෙනෙන්ට තිබුණු අතර එම ක්‍රියාව දිරි නොදිය යුතුය.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් කිසියම් කාර්යයක් නිම කරනු ලැබූ වහාම එය ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව විසින් භාර ගැනීම දිස්ත්‍රික්ක කීපයක ක්‍රියාත්මක වේ. පසු ගිය අවුරුදු කීපය තුළ එකතු වී තිබුණු වැඩ කොටස දැන් නිම කෙරෙමින් පවතී.

**මහපරිමාණයේ වාරිමාර්ග**

සමාලෝචනයට භාජනය වූ වසර තුළ පහත සඳහන් මහ පරිමාණයේ වැඩ වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් තව දුරටත් කරගෙන යන ලදී.

කිරිඳි ඔය ජලාශ ව්‍යාපෘතිය
නිල්වලා ගඟ ගංවතුර ආරක්ෂක යෝජනා ක්‍රමය – 11 අදියර

වර්ෂ 1987 දී කිරිඳි ඔයේ අළුත් ඉඩම් අක්කර 683 ට හා පවත්නා ඉඩම් අක්කර 3577 ට සෙත සැලසුන අතර, නිල්වලා ගඟේ එම ප්‍රමාණයෙන් පිළිවෙලින් අක්කර 500 ක් හා අක්කර 3000 ක් විය.

කොළඹ, ගම්පහ සහ කළුතර දිස්ත්‍රික් ග්‍රාමීය වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය යටතට ගැනීමට ලෝක බැංකුව එකඟ වී තිබේ. වර්ෂ 1987 දී වැඩ අංක 15 ක් පමණ සෝදිසි කිරීමේ කටයුතු කෙරෙමින් පැවතුනි. ග්‍රාමීය වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය යටතේ 1987 දී මහනුවර, ගාල්ල, මාතර, අනුරාධපුරය, මොණරාගල, රත්නපුරය සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල වැඩ අංක 210 ක් නිම කිරීමට වැඩ සටහන් සකස් කර තිබුනි.

ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ 1987 මාතලේ, නුවරඑළිය, පුත්තලම, මොණරාගල සහ රත්නපුර දිස්ත්‍රික්කවල වැඩ අංක 58 ක් නිම කිරීමට වැඩ සටහන් සකස් කර තිබුනි.

පරාක්‍රම සමුද්‍රය, ගිරිතලේ, මින්නේරිය සහ කවුඩුල්ල යෝජනා ක්‍රමවල ජලය බෙදා හැරීමේ ඇළ මාර්ග පුනරුත්ථාපනය කිරීම, වාරිමාර්ග ක්‍රම කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ 1987 දී ආරම්භ කරන ලදී. ඒකාබද්ධ මහා පරිමාණ වාරි මාර්ග කළමනාකරණය යටතේ මේ දක්වා ව්‍යාපෘති 32 ක වැඩ කටයුතු ආරම්භ කර තිබේ.

**සාමාන්‍ය කරුණු**

පළමුවැනි සාර්ථක කෘෂිකාර්මික නළ ළිඳ වැල්ලවාය මැතිවරණ කොට්ඨාශයේ හොරබොක්කගමදී ගොවියන් 9 දෙනෙකුගේ ක්‍රියාකාරී සහභාගීත්වය ඇතිව ක්‍රියාත්මක කරන ලදී. එහෙත්, මොණරාගල දිස්ත්‍රික්කයේ විශාල කොටසකද හානිකර බලපෑමක් ඇති කරමින් පැතිරී ගිය බැක්ටීරියා රෝගයක් හේතුකොට ගෙන පළමුවැනි බොම්බයි ලූනු වගාව සාර්ථක නොවීය.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ පහළ ඌවේ කනින ලද විවෘත ළිං යෝජනා ක්‍රමය යටතේ එළවළු වගා කිරීම විශාල උද්‍යෝගයකින් සිදු කරන ලදී.

පසුගිය අවුරුදු කීපය තුළ ජපාන ආහාර නිෂ්පාදන ප්‍රදානය යටත් පිරිසෙයින් ග්‍රැබ් ඩ්‍රෙජර් යන්ත්‍ර යක් ලබා ගැනීමට උත්සාහ කළ නමුදු එය සාර්ථක නොවීය. මේ සඳහා ඉදිරි වර්ෂයේදී උත්සාහ දරනවා ඇත.

**කෘෂිකාර්මික ණය හා රක්ෂණය**

ගොවි පවුල්වලින් වැඩි සංඛ්‍යාවක් ඉතා අඩු ආදායම් ලබන ග්‍රාමීය අංශයට අයත්වන බැවින්, කෘෂිකාර්මික අංශයේ ඵලදායක සංවර්ධනයක් අත්පත් කර ගැනීම සඳහා ණය පහසුකම් අතිශයින් වැදගත් යෙදවුමක් වන්නේය.

**අනුරාධපුර වියළි කලාපීය කෘෂිකාර්මික ව්‍යාපෘතිය**

රාජ්‍ය බැංකු දෙකේ, මහා බැංකුවේ සහ අනුරාධපුර වියළි කලාප කෘෂිකාර්මික ව්‍යාපෘතියේ නිලධාරීන්ගේ එකඟත්වය ඇතිව, අනුරාධපුර දිස්ත්‍රික්කයේ තෝරාගත් වැව්වල ණය කඳවුරු දහයක් සාර්ථක ලෙස පවත්වන ලදී.

කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ ඉල්ලීමක් අනුව, කරත්තයක් සඳහා වන අනුරාධපුර වියළි කලාප කෘෂිකාර්මික ව්‍යාපෘතියේ ණයදීමනාව රු. 10,000/- දක්වා වැඩි කිරීමට මහ බැංකුව එකඟවී තිබේ.

**කන්තලේ ණය යෝජනා ක්‍රමය**

මහජන බැංකුවේ එකඟත්වය ඇතිව කන්තලේ ප්‍රදේශයේ ජීවත්වන ගොවියන් සඳහා රුපියල් මිලියන 29 ණය යෝජනා ක්‍රමයක් ආරම්භ කරන ලදී. ගොවිතැන් කිරීමට කුඹුරු සකස් කිරීම සඳහාත්, මූලික අවශ්‍යතා වන පොහොර සහ බිත්තර වී ලබා ගැනීම සඳහාත් එක් එක් ගොවියෙකුට රු. 1500/- ක ණය මුදලක් දෙන ලදී. 1987 අවසානයේ දී ගොවි යන් 1572 අතර රුපියල් මිලියන 7ක් බෙදා දී තිබුනි.

**කන්තලේ උක් වගා රක්ෂණ ක්‍රමය**

කන්තලේ උක් වගා කෙරෙන ප්‍රදේශයෙන් පිටත වාසය කරන ගොවියන්ගේ යහපත පිණිස කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය විසින් කෘෂි රක්ෂණ මණ්ඩලයේ සහාය ඇතිව රක්ෂණ යෝජනා ක්‍රමයක් ආරම්භ කරන ලදී.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## කෘෂිකාර්මික යෙදවුම් අංශය — වාර්ෂික වාර්තාව — 1987

**ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

සැලකිල්ලට භාජනය වී ඇති වර්ෂය තුළ රටේ ගොවි ජනතාව ගේ යහපත සඳහා කෘෂි රක්ෂණ මණ්ඩලය විසින් ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් සකස් කරන ලදී. මෙම යෝජනා ක්‍රමය ගොවියන් අතර ජනප්‍රිය කර තව තවත් ගොවියන් ඊට බඳවා ගැනීම සඳහා කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය, ප්‍රධාන කාර්යාලය මගින් මෙන්ම කෘෂිකාර්මික කළමනාකරුවන් මගින් ක්ෂේත්‍ර මට්ටමෙන්ද සම්පූර්ණ සහයෝගය ලබා දෙන ලදී.

**පැල්වත්ත සීනි සංකීර්ණයේ ණය යෝජනා ක්‍රමය**

වර්ෂ 1987 දී කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය, ලංකා බැංකුව විසින් බාහිර උක් වගාකරුවන් සඳහා දියත් කරන ලද පැල්වත්ත සීනි සංකීර්ණයේ ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ වැඩ කටයුතුවලට ක්‍රියාකාරී ලෙස සහභාගී විය.

### පොහොර හා කෘෂි රසායන

**පොහොර**

1986 වර්ෂයේ පොහොර භාවිතය හා සසඳා බලන කල 1987 වර්ෂය තුළ සියලුම බෝග සඳහා යොදාගත් මුළු පොහොර ප්‍රමාණයේ 4% ක පමණ සුළු අඩුවීමක් පෙනෙන්ට තිබුනි. වී වගා ක්ෂේත්‍රයේ පොහොර භාවිතයේ අඩුවීම 14% කි.

වර්ෂයේ අවසාන කාර්තුව තුළ රටේ යූරියා හා යූරියා පදනම් කරගත් පොහොර මිශ්‍රණ වල බරපතල හිඟයක් ඇති විය. ඈත පළාත්වල පොහොර බෙදා හැරීම වඩා කාර්යක්ෂම කිරීම සඳහා ලංකා පොහොර සංස්ථාව වෙත යෝජනා ගණනාවක් ඉදිරිපත් කර තිබේ.

**කෘෂි රසායන**

වර්ෂය පුරාම කෘෂි රසායන ද්‍රව්‍ය විවිධ වර්ග වශයෙන් ඉතා සුලභව ලබාගත හැකි විය.

කෘෂි රසායන විෂවීම හේතුකොට ගෙන මරණ සංඛ්‍යාව බිය ගන්වන සුලු මට්ටමකට වැඩි වී ඇති අතර මේ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

### සත්ත්ව පාලනය

පශු සම්පත් අංශය, ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය පදනම් කරගත් ආර්ථිකයේ උප අංශයක් වන නමුදු එය, ජනතාවගේ පෝෂණ තත්ත්වය නංවාලීම පිණිස සක්‍රිය ලෙස දායකවන අතරම සැලකිය යුතු ආදායම් මාර්ගයක්ද වන්නේය. කෘෂිකාර්මික සංවර්ධන වැඩ කටයුතු සෑම මට්ටමකදීම සම්බන්ධීකරණය කරන කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය, පශු සම්පත් අංශයේ නිෂ්පාදනය නංවාලීමට බැඳී සිටී.

**සත්ත්ව ආහාර**

පශු සම්පත් අංශයේ වැඩිවෙමින් පවතින ඉල්ලුම සපුරාලීම පිණිස ලංකා තෙල් හා මේද සංයුක්ත මණ්ඩලය මෙන්ම සීමා සහිත ග්‍රෙන් එලිවේටස් සමාගම තම නිෂ්පාදනවල ප්‍රමාණය මෙන්ම තත්ත්වයද වැඩි දියුණු කර තිබේ. සත්ත්ව ආහාර මිළ ගණන්වල යටත් පිරිසයින් 15%ක වැඩිවීමකට මුහුණ පෑමට ගොවියන්ට සිදුවීම සැලකිය යුතු කරුණකි. බිංගිරියේ සුළු පරිමාණයේ සත්ත්වාහාර නිෂ්පාදනය කරන කර්මාන්ත කරුවකු විසින් මිළ අඩු උසස් තත්ත්වයේ සත්ත්වාහාර නිපදවා ඇති අතර, ඔහු දැන් තම නිෂ්පාදන උතුරු මැද පළාත තරම් ඈත ප්‍රදේශවල පවා බෙදා හරී.

**රෝමන්ත නොවන සතුන් බෝකිරීම**

කුකුළු කර්මාන්තයේ, බලය ලත් බෝ කරන්නන් විසින් තම බිත්තර රකින යන්ත්‍ර වල ධාරිතාව 1986 වර්ෂය තුළ සියයට සියයක්ම වැඩි කරන ලදී.

මෙය හේතුකොට ගෙන කුකුළන් ඇති කිරීමේ අංශයේ ආදායම අඩු වූයෙන්, ගම්බදව මෙම කර්මාන්තයෙහි නියැලී සිටි බොහෝ දෙනෙකුට මෙම වර්ෂයේදී එය අත හැර දැමීමට සිදු විය. කුකුළු නිෂ්පාදනවල මිළ ගණන් පහත වැටීම වැළැක්වීමේ පියවරක් වශයෙන්, කුකුළු නිෂ්පාදන, විශේෂයෙන්ම බිත්තර පරිභෝජනය වැඩි කිරීමේ ජාතික වැඩ පිළිවෙලකට යෙදවුම් අංශය සක්‍රිය ලෙස සහභාගී විය.

1987 වර්ෂයේ අවසාන භාගයේදී ජපාන එන්සෙපලයිටිස් රෝගය පැතිර යෑම හේතුකොට ගෙන ඌරන් බෝ කිරීමේ කර්මාන්තයට අපල කාලයක් උදාවිය. එහෙත් මෙය සතුන් ගෙන් බෝවන රෝගයක් නොවේ. ප්‍රමාණවත් තොරතුරු නොලැබීම හේතුකොට ගෙන පාරිභෝගිකයන් බොහෝ දෙනෙක් ඌරු මස් වලින් සකස් කළ ආහාර ප්‍රතික්ෂේප කළහ.

**රෝමාන්තික සත්ත්ව කර්මාන්තය**

මෙම කර්මාන්තයට ප්‍රධාන වශයෙන් දායකවන කිරි පට්ටි අංශය, බෝ කිරීම සඳහා දෙනුන් ලබා ගැනීමේ හැකියාව අතින් අක්‍රියව පැවතුනි. පට්ටි දෙනුන් සඳහා ඇති ඉල්ලුම සපුරාලීමට රජයේ මෙන්ම රජයෙන් ආධාර ලබන ගොවිපල සංවිධානවලට මෙතෙක් නොහැකි වී ඇති අතර එය හේතුකොටගෙන ග්‍රාමීය ගොවියාට ආධාර කරන ණය යෝජනා ක්‍රම පවා අවහිර වී තිබේ.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## කෘෂිකාර්මික යෙදවුම් අංශය — වාර්ෂික වාර්තාව — 1987

පට්ටි දැමීම මගින් හා කෘත්‍රිම සිංචන වැඩ සටහන් මගින් ප්‍රධාන වශයෙන් ස්වාභාවිකව කෙරෙන බෝ කිරීමේ වැඩ සටහන් ආරම්භ කර සම්බන්ධීකරණය කරන ලදී.

කෘෂිකර්ම සංවර්ධන අධිකාරිය මගින් සම්බන්ධීකරණය කරනු ලබන, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ එළුවන් බෝ කිරීමේ වැඩ සටහන යටතේ මිහින්තලේ හා මැදවච්චියේ මැතිවරණ කොට්ඨාශවල, වැඩි දියුණු කළ ජනක උපයෝගී කර ගෙන දේශීය එළුවන්ගේ තත්ත්වය උසස් කිරීමේ දැනට ක්‍රියාත්මක වන වැඩ සටහන් ප්‍රවර්තන වර්ෂය තුළ යහපත් ප්‍රතිඵල ලබා දී ඇත. මෙම වැඩ සටහන් වලට ඇතුළත් ගොවියන් හා රජයේ ආයතන වල නිලධාරීන් සඳහා ඉහත සඳහන් ප්‍රදේශ තුළ ක්ෂේත්‍ර දිනයන් හා පුහුණු කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී.

ඒකාබද්ධ ගොවි පද්ධතිය තුළ ජීව වායු ඒකක කීපයක් පිහිටුවීමේ කටයුතු සම්බන්ධීකරණය කරන ලදී.

**පශු වෛද්‍ය සේවා**

පශු වෛද්‍ය මට්ටමේ පශු වෛද්‍ය කාර්ය මණ්ඩල හා අර්ධ පශු වෛද්‍ය කාර්ය මණ්ඩල හිඟවීම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කෙරෙන ව්‍යාප්ති හා ශායනික වැඩසටහන් වලට අවහිරයක් වී ඇත. විශ්ව විද්‍යාල තුල දැනට පවතින අසහනකාරී තත්ත්වය හා මුදල් නොමැතිකම මෙම තත්ත්වය ඇතිවීමට හේතු වූ කරුණු දෙකකි.

ප්‍රවර්තන වර්ෂයේ පසු භාගයේදී දීපව්‍යාප්ත කුර හා මුඛ රෝගය පැතිර යෑම හේතු කොට ගෙන සත්ත්ව නිෂ්පාදනය පහත වැටුනු අතර එම තත්ත්වය, නැගෙනහිර පලාතේ රින්ඩර්පෙස්ට් ගව වසංගතය හට ගැනීම නිසා තව තවත් උග්‍රවීම සැලකිය යුතු කරුණකි. එය එසේ වුවත් එම තත්ත්වය සාර්ථක ලෙස පාලනය කිරීමට සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අවශ්‍ය පියවර ගෙන ඇත.

**සමාප්තිය**

මෙම අංශය සඳහා සභාපති තුමා ගෙන්, ලැබුණු මග පෙන්වීම හා අගනා සහාය ගැන අප අතිශයින් ණය ගැති වෙමු. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ අපට ලැබුණු නොමසුරු සහයෝගය ගැන විවිධ අමාත්‍යාංශවල, දෙපාර්තමේන්තුවල, සංස්ථාවල, රාජ්‍ය බැංකුවල සහ පෞද්ගලික අංශවල නිලධාරීන්ට ස්තූති කරමු.

කොළඹ
1988.02.29

**ආර්. ටී. සී. පීරිස්**
අධ්‍යක්ෂ – යෙදවුම්

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## අලෙවි අංශය — වාර්ෂික වාර්තාව — 1987

**කෘෂිකාර්මික සංවර්ධනයෙහිලා අලෙවිය**

ජාතිවාදී අර්බුදයේ හා යෞවන යෞවනියන්ගේ ව්‍යාපාරයේ ප්‍රතිඵලයක් වශයෙන් මෙම වර්ෂයේ රට තුළ පැවති අසහනකාරී තත්ත්වය ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අලෙවිය හා වෙළඳපොල ක්‍රියා විරහිත නොවූ තත්ත්වයෙන් පැවතී සිටීමට අපහසු විය. එසේ වුවත් අප දේශීය පුද්ගලික වෙළෙන්දෝ, නිර්භීතව, ක්‍රියාශූරව හා උපායශීලීව ප්‍රතිචාරී වූහ. කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවියේ දී ඔවුනට මුහුණ පෑමට සිදුවූ දහසකුත් එකක් අවදානම් හා අස්ථිර තත්ත්වයන් මධ්‍යයේ වුව ද පුද්ගලික වෙළෙන්දෝ රටේ විවිධ පළාත් තුලට හා පිටතට සැපයුම් ගෙන යාම සතුටුදායක ලෙස පවත්වාගෙන ගියේය.

2. අස්ථිර නිෂ්පාදන තත්ත්වයන් හේතු කොට ගෙන මෙම වර්ෂය තුල දේශීය ආහාර නිෂ්පාදන මට්ටමේ සාමාන්‍ය පසුබෑමක් පෙනෙන්නට තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් මිල මට්ටමේ පොදු වැඩිවීමක් ඇති විය. (ලාභ ලබා දීමට කල්ගත වන ව්‍යාපෘති සඳහා මහජන මුදල් අධික ලෙස ආයෝජනය කිරීම හේතු කොට ගෙන පැවතුනු උද්ධමනකාරී තත්ත්වය එය වඩාත් උග්‍ර අතට හරවන ලදී.)

3. එය කෙසේ වුවත්, වර්ෂය තුළ සිදුවූ සාපේක්ෂක වෙළඳපල කාර්යයන් සෑහෙන තරම් සතුටුදායක තත්ත්වයකින් පැවතුනි. පොදුවේ ගත් කළ පාරිභෝගිකයාට අවශ්‍ය තරම් ආහාර ප්‍රමාණයන් නිකුත් වී තිබේ. ශ්‍රී ලංකාව තුල සමාජීය හා දේශපාලනමය අස්ථිර තත්ත්වයක් තිබියදීත් මෙම වර්ෂය තුල අප රටේ අලෙවි ක්‍රියාදාමය මෙතරම් කාර්යක්ෂම හා නිරුත්සාහි ලෙස පැවතුනා පමණක් නොව ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික නිෂ්පාදන අපනයනය කිරීම පවා අඛණ්ඩව පැවැති ගෙන යෑම සමහරුනට පුදුමයක් ලෙස සැලකීමට ද පුළුවන. 1980 සිට 1987 දක්වා කාලය තුල ශ්‍රී ලංකාවේ පරිභෝජනයට තිබුණු සහල් හා පිටි ප්‍රමාණයන් පිළිබඳ දත්ත සඳහා I වන සටහන බලන්න.

I සටහන : ලබාගත හැකි වූ සහල් හා පිටි ප්‍රමාණය.
1980 – 87 (මෙ.ටො. '000)

| | සහල් | | | පිටි | එකතුව |
|---|---|---|---|---|---|
| | වී නිෂ්පාදනයට සමාන සහල් | ආ.කො. විසින් ආනයනය කළ | (2+3) | ආ.කො. ගෙන් නිකුත් කළ | (4+5) |
| 1 | 2 | 3 | 4 | 5 | 6 |
| 1980 | 1,419 | 189 | 1,608 | 378 | 1,986 |
| 1981 | 1,485 | 157 | 1,642 | 441 | 2,083 |
| 1982 | 1,431 | 161 | 1,592 | 423 | 2,015 |
| 1983 | 1,654 | 123 | 1,777 | 432 | 2,209 |
| 1984 | 1,611 | 28 | 1,639 | 416 | 2,055 |
| 1985 | 1,771 | 172 | 1,943 | 402 | 2,345 |
| 1986 | 1,699 | 220 | 1,919, | 451 | 2,370 |
| 1987 | 1,403* | 100 | 1,503 | 485 | 1,988 |

1. *අනුමාන
2. 1987 වී නිෂ්පාදනය (බුසල් මිලියන)
   =66.7 (මහ) + 34.3 (යල*)
   =බුසල් මිලියන 101.0
3. සමාන සහල් (මෙ.ටො.) = **මුළු සහල් නිෂ්පාදනය (බුසල්)** / 72

වී බුසල් මිලියන 101 = සහල් මෙ.ටො. මිලියන 1.4

4. **වෙළඳපොල කාර්යක්ෂම ලෙස ක්‍රියා කිරීම සම්බන්ධයෙන් ප්‍රශංසාව හිමිවිය යුත්තේ පලතුරු හා එළවළු, ධාන්‍ය හා මාෂ ශෛලයමය බීජ හා කුළු බඩු ආදිය අලෙවි කරන කිසිවිටකත්** හොඳක් නොඅසන, බොහෝවිට දෝෂ දර්ශනයටම ලක්වන, මෙම ආහාර බෙදා හැරීමේ, අලෙවි ක්‍රියා පද්ධතියේ වීරයන් වන පෞද්ගලික වෙළඳුන්ටය. මෙම ආර්ථිකයේ කල්තබා ගත නොහැකි නිෂ්පාදන වලින් 95% කට වැඩි ප්‍රමාණයක් වෙළඳාම් කරන ලද්දේ එළවළු හා පලතුරු අලෙවි කරන පෞද්ගලික වෙළෙඳුන් විසිනි. ඉදිරිපත් කර ඇති දත්ත අනුව 1987 වර්ෂය තුල සහල් අලෙවි වැඩ කටයුතුවලින් සියයට සියයක්ම පාහේ සිදුකර ඇත්තේ පෞද්ගලික අංශයයි. II සටහන බලන්න.

5. වී අලෙවි මණ්ඩලය ශ්‍රී ලංකාවෙ වී–සහල් අනු අංශයට ඉටුකර ඇති මෙහෙය ඉතා සුළු බව පෙනේ. II සටහන අනුව ජාතික මිල සුරැකීමේ ආයතනය වූ මෙම වී. අ. ම. ය 1987 වර්ෂයේ මිලියන 101 ක් වූ ජාතික වී නිෂ්පාදනයෙන් මිලදී ගෙන ඇත්තේ බුසල් මිලියන 3.1 කි. මෙම ප්‍රමාණය ජාතික වී නිෂ්පාදනයෙන් 3.07% ක ප්‍රමාණයක් පමණි. නමුත් එම මිලදී ගත් ප්‍රමාණයෙන් සහල් බවට කොටා ඇත්තේ ඊටත් වඩා අඩු ප්‍රමාණයකි. එනම් වී බුසල් මිලියන 0.1 කි. ජාතික අස්වැන්නේ ප්‍රතිශතයක් වශයෙන් 1987 දී වි අ.ම. ය කොටා ඇත්තේ 1% ත් වඩා අඩු ප්‍රමාණයකි. (නියත වශයෙන් 0.1 ක ප්‍රතිශතයක් පමණි).

II සටහන: 1987 වර්ෂය තුල රාජ්‍ය හා පෞද්ගලික අංශ මගින් මිලට ගන්නා ලද හා සහල් බවට පරිවර්තනය කරන ලද සාපේක්ෂ වී ප්‍රමාණයන්.

| | | බුසල් මිලි | බුසල් මිලි |
|---|---|---|---|
| 1. | වී නිෂ්පාදනය | | |
| | මහ | | 66.7 |
| | යල | | 34.3* |
| | ජාතික වී නිෂ්පාදනය | | 101.0 |
| 2. | වී.අ.ම. මිලට ගත් ප්‍රමාණය 3.1 | | |
| (අ) | වී.අ.ම. අලෙවිකළ (වී) 0.1 | | |
| (ආ) | වී.අ.ම. කොටන ලද වී 0.1* | | |
| (ඇ) | වී.අ.ම. වෙනුවෙන් පෞද්ගලික මෝල්වල කෙටූ වී | 4.4** | |

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## අලෙවි අංශය — වාර්ෂික වාර්තාව — 1987

3. ජාතික වී නිෂ්පාදනයේ ප්‍රතිශතයක් වශයෙන්

| | |
|---|---|
| (අ) වී.අ.ම. මිලට ගත් | 3.07% |
| (ආ) වී.අ.ම. විසින් කෙටූ | 0.10% |
| (ඇ) පෞ.වී.මෝල් හිමියන් විසින් කෙටූ | 99.90% |

*අනුමාන

**ඉදිරියට ගෙනා තොග ඇතුළුව

6. එතකුදු වුවත් මෙම ආයතනයේ වැඩ කටයුතු පවත්වාගෙන යන ලද්දේ ඉතා අධික ''සමාජ වියදමක්'' දැරීමෙන්ය. වී සහල් අනු අංශයේ ඉතා අල්ප වූ කාර්යභාරයක් ඉටු කිරීමෙහිලා වී අලෙවි මණ්ඩලයට 1986 දැරීමට සිදු වූ පාඩුව රුපියල් මිලියන 13.608 ක් විය. 1987 වර්ෂය සඳහා දත්ත මෙතෙක් ලැබී නොමැත. 1986 අවසානය වනවිට තොග අඩුවීම මගින් සිදු වූ සංචිත පාඩුව රුපියල් මිලියන 194.0 කි!! තවද මහ බැංකුව මගින් සහනදායී කොන්දේසි මත ප්‍රතිමූල්‍ය පහසුකම් (පළමු සය මාසය සඳහා වර්ෂයකට 3% ක් පමණ සලසා තිබියදීත් ප්‍රතිමූල්‍ය ගිණුම් යටතේ 1986 වර්ෂය තුල මහ බැංකුවට ගෙවිය යුතුව තිබුණු වී අලෙවි මණ්ඩලයේ බැරකම් රුපියල් මිලියන 328.72 ක් විය.!!!

**මෙතරම් විශාල සම්පත් ප්‍රමාණයක් මෙතරම් සුළු ප්‍රමාණයක අස්වැන්නක් වී. අ. ම. ය විසින් පරිහරණය කරන බව පැහැදිලිය. නමුත් ප්‍රතිපත්ති පාලකයන්ට පැහැදිලි වී නැත්තේ මෙතරම් සුළු අස්වැන්නේ ප්‍රතිශතයක් පරිහරණය කොට ගොවියාට ලැබෙන ආදයමට හෝ පාරිභෝගිකයා ගෙවන මිලට හෝ කිසිදු බලපෑමක් කිරීමට නොහැකිය යන ප්‍රතිපත්තියයි. විශාල වියදමක් දරමින් වී.අ.ම.ය. මගින් වෙළඳපොලට කරන මෙවැනි බලපෑම් ගොවි ආදායමට හෝ පාරිභෝගික මිළට බලපෑමක් වනවා ඇතැයි යන මිත්‍යා මතය සමාජයට තවමත් පැහැදිලි නැත. අධික වියදමින් පවත්වාගෙන යනු ලබන මෙම ආයතනය තවදුර වත් කවර හෝ වැඩදයක මෙහෙයක් ඉටු කරන්නේ යැයි අපට ඇත්ත වශයෙන් පිළිගත හැකිද? ලෝක ආහාර හා කෘෂිකාර්මික සංවිධානය මගින් මුදල් යොදවා ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද වී සැකසීම පිළිබඳ ජාතික පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ නායකත්වය වී.අ.ම. ය යටතේ තැබීමෙන් 99% ක් වී සහල් බවට පත් කරන පෞද්ගලික වී මෝල් කරුවන්ට, පර්යේෂණයන්ට සහ තාක්ෂණික දියුණුවට සහාය ලබා ගැනීමට තවදුරටත් දුෂ්කර වී තිබේ.**

7. මෙරටෙහි වී අස්වැන්න කෙටීම පුද්ගලික අංශය විසින් ඉටු කරන ලද්දේ,

(අ) මහ බැංකුවේ ප්‍රති මූල්‍යාධාර යෝජනා ක්‍රමයෙන් ණය පහසුකම් නොමැතිවීම සහ

(ආ) වී කෙටීම ආදී වැඩ කටයුතු සඳහා ජාතික පර්යේෂණ හා සංවර්ධන ආධාර නොමැතිවයි. එනමුත් 1987 ජාතික වී නිෂ්පාදනයෙන් 99.9% පෞද්ගලික අංශය විසින් කොටා ඇත.!!

8. වී මිලට ගැනීම හා වී කෙටීම යන කාර්‍යයන් පිළිබඳ පුද්ගලික අංශයෙන් හා වී.අ.ම. විසින් ඉටු කරන ලද වැඩ කොටස ඉහත දක්වා ඇති II සටහනෙන් පැහැදිලිව පෙනේ. සහල් බෙදා හැරීමේ අදාල කාර්යයන් මෙන්ම ශ්‍රී ලංකාවේ වී සහල් අනු අංශයේ හමුවන සියලු අවදානම් හා අස්ථිරතාව යන් මධ්‍යයේ ආර්ථික කටයුතු සියල්ලක්ම ,1987 වර්ෂය තුල පෞද්ගලික වෙළඳුන් විසින්ම ඉටු කරන ලද බව සඳහන් කළ යුතුවේ.

9. පුහුණු කිරීම හා උපදෙස් දීම මගින් අප විසින් උසස් තත්ත්වය කට නංවාලීමට උත්සාහ දරන ලද්දේ මෙම පෞද්ගලික අංශයේ වෙළෙන්දාගේ පලදායීතාවයයි. අපගේ ''තරුසවෙපු'' කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවිය සඳහා ග්‍රාමීය තරුණ තරුණියන් පුහුණු කිරීමේ) වැඩ පිළිවෙල මගින් මේ දක්වා දිවයින පුරා තරුණ තරුණියන් 324 දෙනෙකුට කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවිය පිළිබඳ දැනුම හා දක්ෂතා ලබා දී තිබේ. මෙම වර්ෂය තුල මෙම පුහුණු වීමේ වැඩ පිළිවෙලට භාජනය වූ තරුණ තරුණියන් ගේ සංඛ්‍යාව 34 ක් විය. දකුණේ තරුණයන් 24 දෙනෙකුගෙන් යුතු අතිරේක කණ්ඩායමක් පුහුණුවෙන් අඩක් ලබා සිටියදී රටේ කලබලකාරී තත්ත්වයක් හට ගැනීම හේතු කොට ගෙන මෙම වැඩදායක අලෙවි පුහුණු කාර්යය නතර කිරීමට සිදුවිය.

10. තොරතුරු හුවමාරු කර ගැනීමේ වැඩ පිළිවෙලක් මගින් පෞද්ගලික අංශයේ වෙළෙන්දන්ට සහාය වීමට ද අප විසින් ප්‍රයත්නයක් දරන ලදී. තම අධීක්ෂණය යටතේ පවත්නා ප්‍රදේශවලින් විවිධ වර්ගයේ නිෂ්පාදන ප්‍රමාණයන් පිළිබඳව කෘෂිකාර්මික කළමනාකාරවරු මෙම අංශයට වාර්තා කරති. පෞද්ගලික වෙළඳ අංශය ක්‍රියාත්මක කළ හැකිවන පරිදි අලෙවි අංශය කල්වේලා ඇතිව වාණිජ මණ්ඩලවලට තොර තුරු සපයයි. තවදුරටත් තරඟකාරී තත්ත්වයක් ඇති කිරීමේ අරමුණෙන්, රාජ්‍ය වෙළඳ ආයතනවලට ද එම ක්ෂේත්‍රයට අවතීර්ණය වී නිෂ්පාදන මිලට ගැනීමට හැකිවනු පිණිසත්, ආහාර හිඟයක් අපේක්ෂා කරන්නේ නම්, අවශ්‍ය ප්‍රමාණයන් ආනයනය කිරීමට හැකිවනු පිණිසත්, එවැනි තොරතුරු රාජ්‍ය වෙළඳ ආයතනවලට ද සපයනු ලැබේ. කරුණු කෙසේ වෙතත්, වෙළඳපල ක්‍රියාකාරිත්වය මගින් වැඩි සේවයක් ලබා දෙන්නේ පෞද්ගලික වෙළෙඳුන්ගෙන් බව අපගේ අත් දැකීමයි.

11. තම වී සහල් සැකසීම වැඩි දියුණු කර ගැනීම සඳහා පෞද්ගලික සහල් මෝල් හිමියන්ට පර්යේෂණ සහාය අවශ්‍ය වන්නේය. 1987 ජාතික වී නිෂ්පාදනයෙන් 99.9% සහල් බවට පරිවර්තන කරන ලද්දේ පෞද්ගලික වී මෝල් හිමියන් විසින් බව දනට මත් පෙන්වා දී ඇත. තවද, පෞද්ගලික අංශයේ වී මෝල්, පාරිභෝගිකයාට ආසන්නව දැන් පිහිටුවාගෙන තිබේ. අද

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## අලෙවි අංශය—වාර්ෂික වාර්තාව — 1987

සිල්ලර වෙළෙන්දා වෙළඳපලේ නියමුවා වශයෙන් මූලිකත්වය ගෙන තිබේ. ඔහු විශේෂයෙන් ප්‍රතිචාරී වන්නේ මෝල් හිමියන්ගේ අවශ්‍යතා අනුව නොව, පාරිභෝගික අවශ්‍යතාවයන්ට අනුවයි; මෙම වී සහල් සැකසීම කර්මාන්තයේ වෙනස්වන ස්වරූපයේ හොඳ උදාහරණයක් නම් දිවුලපිටිය ආසනයේ මරදගහමුල පළාතේ මෑතකදී වැඩි දියුණු වී තිබෙන වී සහල් සැකසීමේ කර්මාන්තයයි. මෙම ස්ථානයේ කුඩා පරිමානයේ හාල් මෝල් බොහෝ සංඛ්‍යාවක් එක්තැන් වී කොළඹ නගරයේ සහල් පාරිභෝගික අවශ්‍යතාවයන් සපුරා ලනු ලැබේ.

12. මෙම පෞද්ගලික වී සහල් සැකසීමේ කර්මාන්තයේ යෙදී සිටින අයට ඔවුන් සකස් කරන සහල්වල තත්ත්වය උසස් කිරීම සඳහා නොපමාව තාක්ෂණික දැනුම හා ආර්ථික උපදෙස් අවශ්‍ය වේ. මෙම වී සහල් සැකසීමේ කර්මාන්තයේ ක්‍රියාකාරිත්වය දියුණු කිරීමට රජය විසින් ඉදිරිපත් විය යුත්තේ මෙම මෝල් කරුවන්ට දෝෂාරෝපණය කිරීමේ හෝ පාලනය කිරීමේ අදහසින් හෝ "වර්ග හා ප්‍රමිති" බල කිරීමට වෑයමක් දැරීමේ ආකල්පයෙන් හෝ වෙළඳ පොලෙන් බැහැරව රජයේ නිලධාරීන් මගින් මිල ගණන් නියම කිරීමේ පරමාර්ථයෙන් හෝ නොවේ. එවැනි ආකල්ප හාල් වෙළඳපලේ ක්‍රියාකාරී තත්ත්වය උසස් කිරීමට දරණ වෑයමට සුදුසු පදනම නොවේ. වැදගත් වන්නේ පර්යේෂණ හා සංවර්ධන ඥානය මෝල් කරුවණට ව්‍යාප්ත කිරීමයි. මෙම ඥානය ඇති කිරීමේ වගකීම අනිවාර්යයෙන්ම රජයට පැවරෙන කටයුත්තකි. වී සහල් සැකසීමේ කාර්යයන් සියල්ලක් පිළිබඳ සුදුසු පර්යේෂණ කොට ඒවායේ ප්‍රතිඵල මතුපිට පෞද්ගලික මෝල් කරුවන්ගේ කාර්යක්ෂමතාවය වැඩි කිරීම රජය සතු වගකීමකි. එනමුත් අපේ ආර්ථිකයේ වී සහල් කර්මාන්තයට සුදුසු කාර්මික ආර්ථික ඥානය වර්ධනය කිරීමටත්, ඒවා මෝල් කරුවන්ට ව්‍යාප්ත කිරීමටත්, එම කටයුතු වලින් වී සහල් සැකසීමේ කාර්යක්ෂමතාවය දියුණු කිරීමටත් මෙම ආර්ථිකය සුදුසු ලෙස හැඩ ගැසී නැත. මෙම වාතාවරණය ඇති කිරීමට නම් ගතයුතු වැදගත් පියවරවල් වන්නේ සහල් සැකසුම් පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය කෙලින්ම අමාත්‍යාංශයට වාර්තා කරන ස්වාධීන අධිකාරියක් වශයෙන් පිහිටුවීමත් එම පර්යේෂණ ආයතනය විසින් ඉටු කළ යුතු පර්යේෂණ සහ ව්‍යාප්ත කටයුතු පිළිබඳ ප්‍රතිපත්ති සැලසුම් කිරීමේදී පුද්ගලික අංශයට එක හා සමාන සහභාගීත්වයකට පහසුකම් සැලසීමත්ය. කෙසේ වෙතත් එවැනි ක්‍රියා පිළිවෙලක් අනුගමනය කිරීමට ගතයුතු ප්‍රථම පියවර නම් මෙරටෙහි වී මිල සඳහා ඇති ආධාර ආයතනයේ අනුගාමීත්වයෙන් එම පර්යේෂණ ආයතනය ලිහා දැමීමයි.

13. අතිරේක ආහාර බෝග මිල දත්ත මගින්, කාලීන ලෙස **සිදුවන මිල අධිකවීම හා සැලකිය යුතු නිෂ්පාදන අතිරික්ත** තවදුරටත් පෙන්නුම් කරයි. නිෂ්පාදන අතිරික්ත මගින් නිෂ්පාදකයා පීඩාවට පත් කරනු ලබන අතර, මිල අධිකවීම් මගින් පාරිභෝගිකයා අසහනයට පත් කරයි. **එවැනි ආන්තික තත්ත්වයන් තුනී කරලීමට නොහොත් සමනය කිරීමට දරන කවර හෝ උත්සාහයක් ආරම්භ කළ යුතුව ඇත්තේ මිල ගණන් හා නිෂ්පාදනය පිළිබඳ "අනාවැකි පළ කිරීමේ" හැකියාවක් තුලිනි. අපගේ අනාවැකි පල කිරීමේ හැකියාවන් තවමත් නොදියුණු තත්ත්වයක පවතී. මෙම විද්‍යාත්මක හැකියාවන් දියුණු කිරීමට නම් පළමුවෙන් කළ යුතුව ඇත්තේ මෙරටෙහි මානව සම්පත් වර්ධනය කිරීමයි.**


14. පසුගිය අවුරුදු කිපය තුල අලෙවි අංශය මගින් කොළඹ නගරය තුල කරන ලද සහල් මිළ පිළිබඳ සමීක්ෂණ වලින් අපට, බලාපොරොත්තු විය හැකි මිල වෙනස්වීමේ ස්වභාවය පිළිබඳ තොරතුරු සපයා ගැනීමට හැකිවී තිබේ. මෙම වර්ෂය තුල මෙවැනි මිල වෙනස්වීම් නිරතුරුවම අධ්‍යයනය කර පරිපාලනමය තීරණ ගැනීම සඳහා ඒවා වාර්තා කර ඇත. සම්බා, කැකුළු සහ තම්බාපු සහල්වල මිලෙහි වෙනස්වීම් සඳහා 1, 11 හා 111 ප්‍රස්ථාර බලන්න. සතිපතා කරනු ලබන වෙළඳපල සමීක්ෂණ පදනම් කරගෙන අර්තාපල්, ළූණු හා වියළි මිරිස් මෙන්ම, කිප වර්ගයක එළවළු, බිත්තර සහ බ්‍රොයිලර් කුකුළු මස් සඳහා ද මෙම අංශය මගින් මේ හා සමාන දත්ත සකස් කරනු ලැබේ.


15. අප විසින් රැස්කර ගන්නා ලද ක්ෂේත්‍ර තොරතුරු පදනම් කරගෙන "ජනතාව පදනම් කරගත් සංවර්ධනය තුලින් දිළිඳු බව නැති කිරීම" පිළිබඳ උසස් මට්ටමේ නිලධාරි කමිටුව වෙත **රැකියා ජනනය කිරීමේ හැකියාවක් ඇති ව්‍යාපෘති කීපයක්** මෙම අංශය විසින් ඉදිරිපත් කරන ලදී. "කෘෂිකාර්මික අලෙවි" ක්ෂේත්‍රයෙහි ආර්ථික කටයුතු ව්‍යාප්ත කිරීමේ ඉඩ පහසුකම් ගණනාවක් ඇති බව මෙම කමිටුවට අප විසින් පෙන්වා දෙන ලදී. අලෙවිය හා සම්බන්ධ ප්‍රශ්ණ මෙතෙක් නොසලකා හැර තිබේ. කෘෂිකාර්මික නිෂ්පාදන නාගරික මධ්‍යස්ථානවලට ගෙන යෑමත් සහ ජාත්‍යන්තර වෙළඳ පොලවල්වලට ගෙන යෑම හා අපනයනය කිරීම ආශ්‍රයෙන් අලෙවි කාර්යයන් කිහිපයක් තිබේ. මෙම කාර්යයන් ඉටු කිරීම සඳහා තරුණ තරුණියන්ට සහභාගී වීමට බොහෝ අවස්ථා ඇතිවනු ඇත.


16. වී කෙටීම හා සහල් සැකසීම් කටයුතු මෙම ආර්ථිකය තුල එන්ට එන්ටම වැදගත් බවෙන් වැඩි වනු ඇත. පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් තුලින් **වී කෙටීම හා වියළීම මෙන්ම වී සහල් සකස් කිරීමට අදල වෙනත් ක්‍රියාකාරිකම් වලට සම්බන්ධ වීමට ගම්බද තරුණ තරුණියන් වැඩි පිරිසක් උනන්දු කරවිය හැකිවනු** ඇත. නමුත් එම හැකියාව ඇතිවනු ඇත්තේ "යෝග්‍ය තාක්ෂණය" මනායේ අප දියුණු කරන්නේ නම් පමණි.

17. **දෙවනුව වර්ධනය වෙමින් පවත්නා** මෙම අලෙවි කාර්යයන් **ඉටු කිරීම සඳහා, ස්වයං රැකියා පදනමක් මත, ගම්බද තරුණ තරුණියන් පුහුණු කිරීම පිණිස කෘෂිකාර්මික සංවර්ධන**

# RICE PRICES: '86 & '87



අධිකාරියේ ''තරුසවෙපු''(තරුණයන් සඳහා වෙළඳ පුහුණුව) වැඩ පිළිවෙල ව්‍යාප්ත කළ හැක.

18. පිටකොටුවේ හා මහනුවර දැනට පිහිටා ඇති **කෘෂිකාර්මික නිෂ්පාදන තොග අලෙවි කිරීමේ වෙළඳ පොලවල්,** පිරී උතුරා යන තරමට ජනාකීර්ණ වූ මෙම නගරවල පර්යන්ත වලට ගෙනයාම මගින් වියදම් සාධාරණ තත්ත්වයකට පත් කිරීමේ, රැකියා ජනනය කිරීමේ සහ පාරිභෝගික මිල ගණන් අඩු කිරීමේ හැකියාවන් ගැනද කමිටුව වෙත කරුණු ඉදිරිපත් කරන ලදී.

19. නිතිපතා පවත්වනු ලබන **ග්‍රාමීය පොලවල්වල** වැඩ **කටයුතු නව තවත්වැඩි දියුණු** කිරීම මගින් රැකියා අවස්ථා ඇති කිරීමේ හැකියාවද, ඉස්මතු කර දක්වන ලදී. එසේ කිරීමට නම්, පළාත් පාලන ආයතන මගින් උපරිම මුදලකට ඉල්ලුම් කරන තැනැත්තාට පොළ භූමිය වාර්ෂිකව බදු දීමේ දැන් පවත්නා ක්‍රමය වෙනස් කළ යුතු වන්නේය. (අ) ග්‍රාමීය වශයෙන් ඇති වන්නාවූ අසහනකාරි තත්ත්වය අඩු කිරීමට නම්, සහ (ආ) ග්‍රාමීය රැකියා තත්ත්වය ව්‍යාප්ත කිරීමට නම පොල භූමිය බදු දීමේ ක්‍රමය නතර කළ යුතුයි. මේ සඳහා ගොවි ජන සේවා මධ්‍යස්ථානයන් ද පොල පවත්වන භූමියෙහිම පිහිටු විය යුතුයි. (එක් එක් ප්‍රශ්ණය අනුව, ප්‍රවීන අලෙවි විශ්ලේෂකයන් විසින් අධ්‍යයනය කිරීමෙන් පසු). මෙමගින් කෘෂිකාර්මික යෙදවුම් ළඟාකර ගැනීමේ කාර්යයන් හා කෘෂිකාර්මික නිපැයුම් පිට කිරීමේ කාර්යයන් එකම ස්ථානයක දී සම්බන්ධ කර එමගින් ගොවිපලවල ඵලදායීතාවය වැඩි කිරීමට හැකිවේ.

20. අවසාන වශයෙන් උපදෙස් මාර්ගෝපදේශකත්වය තුලින්, අලෙවි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පහසු කර, අලෙවි කටයුතු වලට සහභාගී වන අයට සහාය වීම සඳහා **කෘෂිකාර්මික අලෙවි ව්‍යාප්ත සේවයක ඇති අවශ්‍යතාව** මෙම කමිටුවේ අවධානයට ලක් කරන ලදී. අලෙවි ව්‍යාප්ත සේවයක් මගින් ලබාගත හැකි ප්‍රයෝජන 1986 වාර්ෂික වාර්තාවෙන් මවිසින් දැනටමත් පැහැදිලි කර තිබේ.


**ආචාර්ය උපාලි නානායක්කාර**

අධ්‍යක්ෂ – අලෙවි

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## ව්‍යාපෘති ඇගයීමේ අංශය — වාර්ෂික වාර්තාව — 1987

### 1. හැඳින්වීම

කෘෂිකාර්මික සහ කෘෂි ව්‍යාපාර පිළිබඳ ව්‍යාපෘති හඳුනා ගැනීම, සකස් කිරීම සහ ඇගයීම ව්‍යාපෘති ඇගයීමේ අංශය වෙත පැවරී ඇති කාර්යයන් වේ. තවද මෙම අංශය ව්‍යාපාරික යන්ට / මුදල් ආයෝජකයන්ට මුදල් ආයෝජනය කළ හැකි කෘෂි ව්‍යාපාරික අවස්ථා සහ පවත්නා අළෙවි තත්ත්වයන් පිළිබඳ සක්‍යතා අධ්‍යයන පිළියෙල කිරීම සඳහා උපදෙස් ලබා දෙයි. මෙම අංශය විසින්, ණය දෙන ආයතනවලින් මූල්‍ය ආධාර ලබාගැනීම සඳහා රාජ්‍ය අංශයේ ආයතනවලින්ද කරුණු විමසා බලා, මුදල් ආයෝජනය කිරීමේ සක්‍යතාවක් ඇති ආයෝජකයන්ට මාර්ගෝපදේශයද සලසා දෙනු ලැබේ.

### 2. ශ්‍රී ලංකා / විදේශීය ඒකාබද්ධ කෘෂිකාර්මික උපදේශක කමිටුව

එක්සත් ජනපදයේ පෞද්ගලික අංශයේ කොටස්කරුවන්ගේ සහභාගීත්වය ඇතිව ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය සහ කෘෂි ව්‍යාපාර නංවාලීමේ අරමුණෙන් 1983 දී ශ්‍රී ලංකා / එක්සත් ජනපද ඒකාබද්ධ කෘෂිකාර්මික උපදේශක කමිටුව පිහිටුවන ලදී. වොෂිංටනයේ ඒකාබද්ධ කෘෂිකාර්මික උපදේශක කමිටුව විසින් සලසා දෙන ලද සේවාවන් 1986 දී අවසන් කරන ලදී. එය එසේවුවද, වෙනත් රටවල්වල සේවාවන් ආවරණය කිරීම සඳහා ශ්‍රී ලංකා / එක්සත් ජනපද ඒකාබද්ධ කෘෂිකාර්මික උපදේශක කමිටුව ප්‍රතිසංවිධානය කර එය ශ්‍රී ලංකා / විදේශීය ඒකාබද්ධ කෘෂිකාර්මික උපදේශක කමිටුව වශයෙන් නැවත නම් කරන ලදී. කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය තවදුරටත් ඒකාබද්ධ කෘෂිකාර්මික උපදේශක කමිටුවේ ලේකම්වරුන් වශයෙන් සේවය කළ අතර කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති අංශය විසින් මෙම කමිටුවේ කෘෂි ව්‍යාපාරික ව්‍යාපෘති සම්බන්ධීකරණය කරමින් උපදෙස් දෙනු ලැබේ.

1987 දෙසැම්බරයේදී ව්‍යාපෘතිවල තත්ත්වය පහත දැක්වේ.

**මඤ්ඤොක්කා**

මෙය වූ කලී මඤ්ඤොක්කා වාණිජ මට්ටමකින් වගා කර එමගින් ලබා ගන්නාවූ අල වලින් ස්ටාච් ලබාගෙන එයින් මැලියම් ඩෙක්ස්ට්‍රින් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතිය සඳහා වන ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 6ක් වන අතර, සීමා සහිත ඉන්ඩස්ට්‍රියල් කෙමිකල්ස් මැනිපෙක්චරි සමාගම මෙම ව්‍යාපෘතියේ දේශීය භාරකරුවන් වන්නේය. ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩ නිමකර තිබේ. දේශීය භාර කරුවන්ගේ ප්‍රාග්ධන කොටස් මුදල ගොඩනැගිලි ඉදි කිරීම ආදී මූලික වැඩ සඳහා වැය වී ඇති අතර වගා කටයුතු ආරම්භ කිරීම සඳහා ජාතික සංවර්ධන බැංකුවෙන් ලැබෙන ණය මුදලක් කෙරෙහි සමාගම දැන් විශ්වාසය තබා ඇත. කාලයක් ගතවීමෙන් පසු මඤ්ඤොක්කා වගා කිරීම සඳහා රජයේ ඉඩම් අක්කර 50 අත්පත් කර ගැනීමෙහිලා සමාගමට සහායවීමට අපට හැකිවී තිබේ.

මෙම ව්‍යාපෘතිය සඳහා මුදල් යෙදවීමට ජාතික සංවර්ධන බැංකුව ප්‍රතිපත්තියක් වශයෙන් එකඟ වී ඇත. පුත්තලම දිස්ත්‍රික්කයේ වනාතවිල්ලු ප්‍රදේශයේ පහසුවෙන් මඤ්ඤොක්කා වගා කළ හැකි බැවින්, නිෂ්පාදන සඳහා සහතික මිළක් ඇතිව බාහිර වගාකරුවන් (පෞද්ගලික ගොවීන්) සඳහා වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරන ලෙස අප විසින් භාරකරුවන් ගෙන් ඉල්ලීමක් කර තිබේ.

**කිරි දෙනුන්**

මෙය වූ කලී මූලික ගව සමූහයක් මගින් දේශීය ගවයන්ගේ තත්ත්වය උසස් කිරීමේ කිරි පට්ටි සංවර්ධන ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතියේ දේශීය භාරකරුවන් ලංකා මිල්ක් ෆුඩ්ස් (ස.තො.ස.) වන අතර ඇමෙරිකාවේ කෘෂිකාර්මික තාක්ෂණික සමාගම එහි විදේශීය හවුල් කරුවන්වේ. ලංකා මිල්ක් ෆුඩ්ස් සමාගම සමග ක්‍රියා කරමින්, සක්‍යතා වාර්තාවට අනුකූලව සම්පූර්ණ ව්‍යාපෘතිය නිම කිරීම සඳහා අවශ්‍ය සියලු තාක්ෂණික සේවා සැපයීමට ඇමෙරිකාවේ කෘෂිකාර්මික තාක්ෂණික සමාගම කැමැත්ත පළකර තිබේ. එය එසේවුවද, මෙම ව්‍යාපෘතිය සඳහා මූල්‍ය ආධාර සැපයීමට ඇමෙරිකාවේ කෘෂි කාර්මික තාක්ෂණික සමාගම කැමති නැත. එක්සත් ජනපද ආධාර යෝජනා ක්‍රමය යටතේ මූල්‍ය ආධාර සපයන ලෙස ලංකා මිල්ක් ෆුඩ්ස් සමාගම යූ.එස්.ඒ.අයි.ඩී. සංවිධානය වෙත ලිපියක් ඉදිරිපත් කර ඇති අතර ඒ සම්බන්ධයෙන් එම සංවිධානයේ ප්‍රතිචාරය බලාපොරොත්තුවෙන් සිටී.

මධ්‍යස්ථාන ගොවිපලක් සහ ගොවි අභ්‍යාස මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා බෝපතලාවේ හා ඩයගම පශු සම්පත් ගොවි පලවල් අත්පත් කර ගැනීමේ යෝජනාවක් ලංකා මිල්ක් ෆුඩ්ස් සමාගම වෙත පැමිණි (1987 සැප්තැම්බර්) ජපන් නියෝජිත පිරිසක් වෙත ඉදිරිපත් කරන ලදී. තවද එම ජපන් නියෝජිතයන්ගේ ඉල්ලීම අනුව, ලංකා මිල්ක් ෆුඩ්ස් සමාගම විසින් මෙම යෝජිත ව්‍යාපෘතිය පිළිබඳ සක්‍යතා වාර්තාවක් සකස් කරන ලෙස ඉල්ලමින් විදේශීය සම්පත් දෙපාර්ත මේන්තුව මාර්ගයෙන් ජපාන ජාත්‍යන්තර සමුපකාර ආයතනය වෙත ලිපියක් ඉරිපත් කර තිබේ. ලංකා මිල්ක් ෆුඩ්ස් සමාගම ඒ සම්බන්ධයෙන් ජපාන ජාත්‍යන්තර සමුපකාර ආයතනයෙන් පිළිතුරක් බලාපොරොත්තුවෙන් සිටී.

යෝජිත හවුල් ව්‍යාපාර ව්‍යාපෘතිය පිහිටුවීම සඳහා ලංකා මිල්ක් ෆුඩ්ස් සමාගමට මූල්‍ය හා තාක්ෂණික ආධාර සැපයිය හැකි ඉන්දියානු හවුල් ව්‍යාපාර කොටස්කරුවකු ලබා ගැනීම සඳහා ලංකා මිල්ක් ෆුඩ්ස් සමාගම ජපන් තානාපති කාර්යාලයට සහ ඉන්දියාවේ ආනන්ද්හි ජාතික කිරි පට්ටි සංවර්ධන මණ්ඩල ඔට ලියා යවා තිබේ.

**සුදු ලූනු**

මෙය වූ කලී නිෂ්පාදනයෙන් 75% ක් අපනයන කිරීම සඳහා සුදු ලූනු වගා කිරීමේ යෝජනාවකි. සීමාසහිත පී. එන්.ජේ. කෘෂිකාර්මික නිෂ්පාදන (පෞද්ගලික) සමාගම

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## ව්‍යාපෘති ඇගයීමේ අංශය — වාර්ෂික වාර්තාව — 1987

මෙම ව්‍යාපෘතියේ දේශීය භාරකරුවන් වන අතර ඇමෙරිකා එක්සත් ජනපදයේ ජෙනුආඩ් ගොවිපල සමාගම එහි විදේශීය හවුල්කරුවෝ වෙත්. සමාගම පිහිටුවා ඇති අතර ඒ සඳහා විදේශීය ආයෝජන උපදේශක කමිටුවේ අනුමතිය ලබාගෙන තිබේ. මේ සඳහා රජය විසින් වැලිමඩ ප්‍රදේශයේ ඉඩම් අක්කර දහහතක් තෝරාගෙන මුදාහැර තිබේ. ජාතික සංවර්ධන බැංකුවේ ඉල්ලීම පරිදි නියත වර්ග පිළිබඳ මූලික අත්හදා බැලීම් පරීක්ෂාකර තිබේ. ආරම්භයේදී ලැබුනු ප්‍රතිඵල බලාපොරොත්තු කඩවනසුලු වූ බැවින් මෙම අත්හදා බැලීම් නැවතත් කළ යුතුවේ. එක්සත් ජනපදයේ කොටස් කරුවන් විසින් නිර්දේශ කරන ලද වෙනත් වර්ග යොදා අතිරේක අත්හදා බැලීම් පැවැත්වීමටද කටයුතු සලසා තිබේ. දේශීය තත්ත්වයන්ට ගැලපෙන සුදු ලූනු වර්ග නිර්දේශ කිරීම සඳහා වොෂිංටන් විශ්ව විද්‍යාලයෙන්ද උපදෙස් විමසා ඇත.

මෙම ව්‍යාපෘතියේ 1 වන අධියර සඳහා වැය කිරීමට අපේක්ෂිත ප්‍රාග්ධන අවශ්‍යතාව රුපියල් මිලියන 7 කි. සමාගමේ කොටස් වෙන් කිරීම ව්‍යාප්ත පදනමක් මත සිදු කෙරෙන අතර පළමු ප්‍රමුඛතාව ඒකාබද්ධ කෘෂිකාර්මික උපදේශක කමිටුවේ සාමාජිකයන්ට දෙනු ලැබේ. 1987 දී පරිභෝජනය සඳහා ශ්‍රී ලංකාවට රුපියල් මිලියන 79 ක් වටිනා සුදු ලූනු ආනයනය කරඇති බව සැලකිය යුතු කරුණකි. තවද ලෝකය පුරා සුදු ලූනු හිඟයක් පවතින අතර ''සෞඛ්‍යට හිතකර ආහාරයක්'' වශයෙන් සුදු ලූනු වලට ලැබී ඇති තත්ත්වය හේතුකොටගෙන, ලෝකයේ සුදු ලූනු පරිභෝජනය වර්ෂයකට 10 – 12% දක්වා ප්‍රමාණයකින් වැඩිවන බව පෙනේ.

### රම් කෙඳි

ශ්‍රී ලංකාවේ තෙත් කලාපය තුළ රම් කෙඳි සකස් කිරීමේ කර්මාන්තශාලාවක් පිහිටුවීම කෙරෙහි ඇමෙරිකා එක්සත් ජනපදයේ ග්‍රීන් ඉන්ටර්නැෂනල් සමාගම උනන්දුවක් දක්වා තිබේ. මෙම කර්මාන්ත ශාලාව තුළ නිෂ්පාදනය කිරීමට අපේක්ෂිත සකස් කරන ලද රම් කෙඳි ප්‍රමාණය මාසයකට මෙට්‍රික් ටොන් 200 ක් පමණ වේ. හෙක්ටයාර් එකකින් වර්ෂයකදී ලබා ගැනීමට බලාපොරොත්තුවන මැලියම් ඉවත් කළ රම් කෙඳි ප්‍රමාණය ආසන්න වශයෙන් කිලෝග්‍රෑම් 2000 කි. මෙම පදනම මත, හෙක්ටයාර් 100 ට ආසන්න බිම් ප්‍රමාණයක තනි වගාවක් වශයෙන් හෝ පොල් ඉඩම්වල අතුරු බෝගයක් වශයෙන් ඊට වඩා වැඩි බිම් ප්‍රමාණයක හෝ රම් වගා කළ යුතුවේ. දේශීය සංවිධානයක් සමග හෝ තනි තනියේ සම්බන්ධ වන ගොවීන් සමග හෝ හවුල් ව්‍යාපාර යක් පිහිටුවීමට ග්‍රීන් ඉන්ටර්නැෂනල් සමාගම අපේක්ෂා කරයි. මෙම ව්‍යාපෘතිය දියත් කිරීම කෙරෙහි ශ්‍රී ලංකා ව්‍යාපාර සංවර්ධන මධ්‍යස්ථාන සහ ඒකාබද්ධ කෘෂිකාර්මික උපදේශක කමිටුව උනන්දුවක් දක්වයි.

### උක් වගාව

ඉන්දියාවේ බැංගලෝරයේ ව්‍යාපාරිකයකු වන ජී.එස්.වදා මහතා දේශීය කොටස් කරුවකු සමග හවුල් ව්‍යාපාරයක් වශයෙන් මෙය ආරම්භ කිරීමට උනන්දුවක් දක්වයි. උක් වගා කර එම උක් ගස් සීමාසහිත පැල්වත්ත සීනි සමාගමට සැපයීමේ ව්‍යාපාරයක මුදල් ආයෝජනය කිරීමට ඔහු තුළ උනන්දුවක් තිබේ. ඔහු විසින් රජයේ ඉඩම් යටත් පිරිසෙයින් අක්කර 1000 ක් ඉල්ලා ඇත. නිෂ්පාදනය කරනු ලබන උක් දඩු පැල්වත්ත සීනි සංකීර්ණයට සැපයීමේ කොන්දේසිය මත, නක්කල සීනි ව්‍යාපෘතිය සඳහා වෙන්කර ඇති රජයේ ඉඩම් ඔහුට බදු දීමේ හැකියාව සොයා බැලීම සඳහා, සභාපති තුමාගේ එකහත්වය ඇතිව ඔහු කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම්තුමාට හඳුන්වා දෙන ලදී. සීමාසහිත නක්කල සීනි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් කරුණු විමසා බැලීමෙන් පසු ඒකාබද්ධ කෘෂිකාර්මික උප දේශක කමිටුවට දැනුම්දීමට අමාත්‍යාංශය එකඟ වී තිබේ

3. කරුණු සොයා බැලීමට භාජනය වී ඇති ව්‍යාපෘති

(අ) අපනයන සඳහා ගර්කින් වගා කිරීම සහ සකස් කිරීම
(ආ) දහයියාවලින් සක්‍රිය කාබන් නිෂ්පාදනය කිරීම
(ඇ) කිව්ගෙඩි/මැකඩේමියා ඇට වගා කිරීම
(ඈ) අපනයනය කිරීම සඳහා පොල්බඩ සකස් කිරීම
(ඉ) පලතුරු සකස් කිරීම ටින්වල ඇසිරීම ජංගම ඒකකය
(ඊ) අපනයනය කිරීම සඳහා වාණිජ මට්ටමකින් අලිගැට පේර වගා කිරීම
(උ) ඖෂධීය පැල වගා කිරීම හා සකස් කිරීම
(ඌ) පොල්තෙල් සකස් කිරීමේ නව ක්‍රමය
(ඍ) අපනයනය සඳහා පොල්ලෙලි කැබිලි

4. ශ්‍රී ලංකා / විදේශීය ඒකාබද්ධ කෘෂිකාර්මික උපදේශක කමිටුව – විදේශීය තානාපති කාර්යාලය

එක්සත් ජනපදය හැර සෙසු රටවල් ආවරණය වන පරිදී ඒකාබද්ධ කෘෂිකාර්මික උපදේශක කමිටුව ප්‍රති සංවිධානය කිරීමෙන් පසු ඒකාබද්ධ කෘෂිකාර්මික උපදේශක කමිටුවේ ලේකම්වරු ශ්‍රී ලංකාවේ පිහිටි විදේශීය තානාපති කාර්යාල සමග කෘෂි ව්‍යාපාර සම්බන්ධයෙන් අතර මැදියන් වශයෙන් ක්‍රියා කල අතර පහත සඳහන් තානාපති කාර්යාලය විසින් එලදායී ප්‍රතිචාරයක් දක්වන ලදී.

| රට | හමුවූතැනැත්තා |
|---|---|
| රාජකීය ඕලන්ද තානාපති ජනරාල් | තානාපති ජනරාල් |
| ජපන් විදේශීය වාණිජ සංවිධානය | යූජී හෂිමෝටෝ මයා |
| ශ්‍රී ලංකාවේ ප්‍රංශ තානාපති කාර්යාලය | ඒ.ජාරික් මහතා, වාණිජ උපදේශක |
| ඊශ්‍රායල කටයුතු අංශය | හයිම් ඩිවොන් මහතා, ප්‍රධානියා |

| | |
|---|---|
| ඩෙන්මාර්කයේ කර්මාන්තකරණ අරමුදල | එන්.එච්.ඇන්ඩසන් |
| ඕස්ට්‍රේලියානු මහා කොමසාරිස් කාර්යාලය | ඒ.කේ.ථිරියගම මහතා |
| රාජකීය නෙදර්ලන්ත තානාපති කාර්යාලය | සී.ඩී.එල්.බ්‍රාන්ඩ්ස් මහතා |

**5. ව්‍යාපෘති සම්බන්ධයෙන් ඒකාබද්ධ කෘෂිකාර්මික උප දේශක කමිටුව සහ කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය වෙත පැමිණි නියෝජිත මණ්ඩල/ආගන්තුකයෝ**

- අ. ආචාර්ය ලැන්සාන් ඇමන්දෝ සහ බෘනෝ දිවිතිනි මහතා, මිලානෝ, ඉතාලිය.
- ආ. පී.එස්.චදා මහතා, බැංගලෝර්, ඉන්දියාව
- ඉ. කසුඕ මිඩායාෂි මහතා, ජපානය
- ඊ. එන්.ඉචිජා මහතා, ජපානය
- උ. කියොසුකේ හොරි මහතා, ජපානය
- ඌ. ශිව් යෝසප් මහතා, ඊශ්‍රායලය
- එ. බෘස් ආර්. පෙන්සියස් මහතා, වොෂිංටන් ඇ.එ.ජ.
- ඒ. රොබට් මොන්පඩ් මහතා, ඔන්ටෙරියෝ, කැනඩාව
- ඔ. කොලින් ජේ. මැක්පාලන් මහතා, ටොරොන්ටෝ, කැනඩාව

**6. ව්‍යාපෘති සකස් කිරීම**

හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා කුකුළු සංවර්ධන ව්‍යාපෘතියක් මස් කුකුළු ගොවිපලක් සඳහා යෝජනාවක් සකස් කරන ලදී. මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ, ආරම්භයේදී බෙලිඅත්ත, මුල්කිරිගල, තංගල්ල හා තිස්සමහාරාම මැතිවරණ කොට්ඨාශවල ගැමි තරුණ තරුණියන් 2000 ට ස්වයං රැකියා අවස්ථා සලසා දීමයි. එක් එක් මැතිවරණ කොට්ඨාශයක් තුළ ගොවිපල ඒකක 100 ක් පිහිටුවීමටත් එක් එක් ගොවිපොලක කුකුළන් (මස් කුකුළු ) පැටවුන් 250 ඇති කිරීමටත් කටයුතු සලස්වනු ලැබේ. මූලික වැඩ කටයුතුවලට, කුකුළු මස් සකස් කිරීමේ, ඇහිරීමේ මධ්‍යම ඒකකයක් සහ ශීත ගබඩා පහසුකම් ඇතුළත්වේ. මෙම ව්‍යාපෘතිය සඳහා වන ප්‍රාග්ධන ආයෝජනය රුපියල් මිලියන 17 ක් වනු ඇතැයි ගණන් බලා ඇති අතර රුපියල් මිලියන 8.5 පරිභ්‍රමණ ගොවිපල ණය මුදලක් ඊට ඇතුලත්වේ. එක් ගොවියකුගේ අපේක්ෂිත ශුද්ධ ආදායම මසකට රුපියල් 750 ක් වනු ඇතැයි ගණන් බලා තිබේ. හම්බන්තොට දිස්ත්‍රික්කයේ නෝරාඩ් ආධාර යෝජනා ක්‍රමය යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා මෙම යෝජනාව හම්බන්තොට ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කර තිබේ.

**7. ව්‍යාපෘති ඇගයීම සහ පිරික්සීම**

පැල්වත්ත සීනි සමාගමේ භෞතික ප්‍රගතිය ව්‍යාපෘති අංශය මගින් පිරික්සනු ලැබේ. 1986 ජූනි මාසයේ වාණිජ වැඩ කටයුතු ආරම්භ කිරීමෙන් පසු පැල්වත්ත සීනි සමාගම පුද්ගලයන් 1331 දෙනෙකුට ස්ථිර රැකියා ලබා දී ඇති අතර තවත් 2500 දෙනෙකුට වාරික නොහොත් අනියම් සේවයන් වශයෙන් රැකියා සලසා දී තිබේ. පවුල් 650 කට නිවාස පහසුකම් සලසා දී ඇත. පැල්වත්ත සීනි සමාගමේ පදිංචිකරුවන්ට ස්ථිර නිවාස යෝජනා ක්‍රමයක් සහ සහන කෘෂිකාර්මික ණය යෝජනා ක්‍රමයක් සලසා තිබේ.

තවද, පැල්වත්ත සීනි සමාගමට උක් දඬු සපයන්නන් සඳහා බාහිර වගා කරුවන්ගේ (පෞද්ගලික ගොවීන්ගේ) ණය යෝජනා ක්‍රමයක් මහ බැංකුව විසින් අනුමත කර ඇති අතර, ලංකා බැංකුව විසින් මේ දක්වා ණය ඉල්ලුම් පත්‍ර 153 ක් අනුමත කර තිබේ. 1987 තුළ පෞද්ගලික ගොවියන් විසින් පැල්වත්ත සීනි සමාගමට උක් දඬු මෙට්‍රික් ටොන් 35,500 ක් සපයන ලදී.

1987 දෙසැම්බර් අවසානයේදී පැල්වත්ත සීනි සමාගම විසින් ඉඩම් අක්කර 21,515 ක් එළි කරනු ලැබ තිබුණු අතර එයින් අක්කර 14,290 උක් වගා කර තිබුණි. මූලික උක් වගාවෙන් සහ පදිංචිකරුවන් විසින් වගා කරන ලද ප්‍රදේශවලින් වර්ෂය තුළ උක්දඬු කපා ගත් මුළු ඉඩම් ප්‍රමාණය අක්කර 7692 ක් විය. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ මෙම කර්මාන්ත ශාලාවේදී උක් දඬු මෙට්‍රික් ටොන් 192,000 ක් අඹරා සුදු සීනි ටොන් 14,200 ක් සහ උක් පැණි මෙට්‍රික් ටොන් 12,000 ක් නිෂ්පාදනය කරන ලදී.

මෙම අංශය මගින් රජරට ආහාර ධාන්‍ය සකස් කිරීමේ සමාගමේ (රජසෝයා) ප්‍රගතියද පිරික්සනු ලැබේ. සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ ආහාර හා පෝෂණ ප්‍රතිපත්ති සැලසුම් කිරීමේ අංශයෙන් සහ පේරාදෙනියේ සෝයා බෝංචි පර්යේෂණ මධ්‍යස්ථානයෙන් කරුණු විමසා බලා මෙම ව්‍යාපෘතිය පුනරුත්ථාපනය කිරීම සඳහා නව වැඩ පිළිවෙලක් යෝජනා කර තිබේ.

අපනයනය සඳහා කේන්ද්‍රාපසාරිකෘත රබර් කිරි නිෂ්පාදනය කිරීම සඳහා යෝජිත ව්‍යාපෘතියක් අගයන ලදුව පිළිසැකසූ එම ඇගයීම් වාර්තාව ව්‍යාපෘතියේ කොටස්කරුවන්ගේ සහභාගීත්වය සඳහා සලකා බැලීම පිණිස ශ්‍රී ලංකා රාජ්‍ය සංස්ථාවේ සභාපති වෙත ඉදිරිපත් කරන ලදී. සීමාසහිත ලන්කෙම් මෙම ව්‍යාපෘතියේ යෝජකයන් වන අතර, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, ජනතා සංවර්ධන මණ්ඩලය සී.ඩී.අයි.සී. සහ මල්ට්ස්ට්‍රෙව් එහි ප්‍රධාන කොටස් කරුවෝ වූහ. රුපියල් මිලියන 5 ක සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයක් සහ රුපියල් මිලියන 6 ක ණය සංයුතියකින් සැදී ව්‍යාපෘතියේ ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 11 කි.

8. **කාරක සභා නියෝජනය**

මෙම අංශයේ අධ්‍යක්ෂවරයා පහත සඳහන් කාරක සභාවල කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් පෙනී සිටියේය.

අ. ශ්‍රී ලංකා / ජපන් ව්‍යාපාර සහයෝගතා කමිටුව (එස්.එල්.ජේ.බී.සී.සී.) මෙම කමිටුව අන්‍යෝන්‍ය වශයෙන් හිතකරවූ අරමුණු කරා ගමන් කිරීම පිණිස වාණිජ හා ආයෝජන ක්‍රියාකාරකම් වර්ධනය කරයි.

ආ. පාසල් සිසුන්ට විස්කෝතු සැපයීමේ වැඩ පිළිවෙල වෙනුවට සෝයාවලින් සකස් කරන ලද අතුරු ආහාරයක් සැපයීමේ සක්‍යතාව සොයා බැලීම සඳහා පත් කරන ලද තාක්ෂණික කමිටුව.

ඇ. සෝයා පදනම් කරගත් නිෂ්පාදන නිපදවීම සඳහා තාක්ෂණික – ආර්ථික සක්‍යතා අධ්‍යයනය පිණිස කොන්දේසි කෙටුම්පත් කිරීමේ කමිටුව.

9. **සාමාන්‍ය කරුණු**

සහභාගීවූ සම්මන්ත්‍රණ

අ. අපනයන සංවර්ධනයෙහිලා සුළු ව්‍යාපාරකරු සතු කාර්යභාරය පිළිබඳ සම්මන්ත්‍රණය.

ආ. විවෘත ආර්ථිකයක් තුළ රැඳී සිටීම හා වර්ධනය වීම සඳහා සාමූහික සැලසුම්කරණය පිළිබඳ සම්මන්ත්‍රණය.

**ඒ.බී.ඩී.පී. වික්‍රමරත්න**

අධ්‍යක්ෂ – ව්‍යාපෘති අංශය

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## 1987 දෙසැම්බර් 31 දිනෙන් අවසන් අවුරුද්දේ ශේෂ පත්‍රය

| | සටහන | ගත් මිළ | සමුච්චිත ක්ෂයවීම | 1987 | 1986 |
|---|---|---|---|---|---|
| **(අ) ප්‍රයෝජනයට ගත් සම්පත්** | | | | රු. ශත. | රු. ශත. |
| අනුමත ප්‍රාග්ධනය ... ... | | | | 20,000,000.00 | 20,000,000.00 |
| ලබාගත් ප්‍රාග්ධනය | | | | | |
| රජයේ දායක මුදල් ... ... | | | | 4,439,320.00 | 500,000.00 |
| පසුගිය වර්ෂයෙන් ඉදිරියට ගෙනාවා ... | | | | 38,402,499.00 | 37,902,499.00 |
| | | | | 42,841,819.00 | 38,402,499.00 |
| **අඩුකළා** | | | | | |
| 86/12/31 දිනට ආදායම් හා වියදම් ශේෂය | | | 16,913,842.86 | | |
| මේ වර්ෂයේ හිඟ මුදල ... ... | | | 2,498,890.69 | 19,412,733.55 | 16,913,842.86 |
| | | | | 23,429,085.45 | 21,488,656.14 |
| **(ආ) නියෝජනය කළා** | | | | | |
| **ස්ථාවර වත්කම්** | සටහන | ගත් මිළ | සමුච්චිත ක්ෂයවීම | ශුද්ධ අගය | ශුද්ධ අගය |
| උප ලේඛනය අනුව ... ... | 1 | 35,627,957.82 | 18,723,305.50 | 16,904,652.32 | 20,402,276.67 |
| **ව්‍යාපෘති ප්‍රාග්ධනය** | | | | | |
| **ජංගම වත්කම්** ... ... | 2 | — | 6,763,341.84 | | |
| **අඩුකළා** | | | | | |
| **ජංගම බැරකම්** ... ... | 3 | — | 239,108.71 | 6,524,433.13 | 1,086,379.47 |
| | | | | 23,429,085.45 | 21,488,656.14 |

**රන්ජන් විජේරත්න මයා**
සභාපති

**එච්. එම්. සී. කපිලරත්න මයා**
මණ්ඩල අධ්‍යක්ෂ

**එස්. සී. සමරසිංහ මිය**
- ප්‍රධාන ගණකාධිකාරී

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

**1987 වර්ෂය අවසානයේ ආදායම හා වියදම් ගිණුම**

| | සටහන් | රු. ශත | 1986 රු. ශත | 1987 රු. ශත |
|---|---|---|---|---|
| **ආදායම:** | | | | |
| පුනරාවර්තන වියදම් සඳහා රජයේ දායක මුදල් | | 28,000,000.00 | 28,000,000.00 | 24,650,000.00 |
| වෙනත් මාර්ගවලින් ලත් ආදායම ... | 4 | | 43,993.00 | 57,265.45 |
| මුළු ආදායම ... ... | | | 28,043,993.00 | 24,707,265.45 |
| **අඩුකළා වියදම** | | | | |
| පරිපාලන හා පොදු වියදම් ... ... | 5 | 15,757,498.16 | | |
| ක්‍රියාත්මක කිරීම හා නඩත්තු වියදම් ... | 6 | 10,699,363.67 | | |
| ක්ෂය වීම ... ... | | 3,085,565.67 | 29,542,427.50 | 28,597,637.53 |
| | | | (1,498,434.50) | (3,890,372.08) |
| **අඩුකළා:** | | | | |
| ස්ථාවර වත්කම් අළෙවියෙන් සිදුවූ පාඩුව ... | 7 | | 489,673.18 | 1,310,609.26 |
| | | | (1,988,107.68) | (5,200,981.34) |
| **එකතු කළා:** | | | | |
| පසුගිය වර්ෂය වෙනුවෙන් ගැලපීම් ... | 8 | | 510,783.01 | 701,636.14 |
| | | | (2,498,890.69) | (5,902,617.48) |

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

**1987 - 12 - 31 දිනට ස්ථාවර වත්කම් පිළිබඳ උපලේඛනය**

සටහන - 01

| ශීර්ෂය | මුලදී ගත්මිළ | | | | ක්ෂයවීම | | | | ශුද්ධ වටිනාකම |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 86.12.31. දිනට | එකතු කළා | ඉවත් කළා | 87.12.31 දිනට | 86.12.31 දිනට | මෙම වර්ෂයේදී | ඉවත් කළා | 87.12.31 දිනට | 87.12.31 දිනට |
| මෝටර් රථ | 33,122,829.29 | — | 1,120,639.90 | 32,002,189.39 | 14,660,949.62 | 2,731,989.84 | 579,532.42 | 16,813,407.04 | 15,188,782.35 |
| කාර්යාල උපකරණ | 2,381,430.12 | 113,375.00 | 54,000.00 | 2,440,805.12 | 1,301,954.62 | 216,248.98 | 39,549.30 | 1,478,654.30 | 962,150.82 |
| ලී බඩු | 544,256.70 | 29,988.00 | — | 574,244.70 | 195,682.13 | 34,857.46 | — | 230,539.59 | 343,705.11 |
| කාර්යාලීය සුළු උපකරණ | 610,582.11 | 136.50 | — | 610,718.61 | 98,235.18 | 102,469.39 | — | 200,704.57 | 410,014.04 |
| | 36,659,098.22 | 143,499.50 | 1,174,639.90 | 35,627,957.82 | 16,256,821.55 | 3,085,565.67 | 619,081.72 | 18,723,205.50 | 16,904,652.32 |

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## 1987 දෙසැම්බර් 31 දිනෙන් අවසන් අවුරුද්දේ ශේෂ පත්‍රය

සටහන 2
ජංගම වත්කම්

| | 1987 | 1986 |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| ලිපි ද්‍රව්‍ය තොගය ... ... ... ... | 95,308.04 | 75,887.19 |
| ඉදිරියට ගෙවූ වියදම් (සටහන 2.1) ... ... ... ... | 391,709.30 | 394,967.68 |
| ඉන්ධන තැන්පතු ... ... ... ... | 324,800.00 | 283,300.00 |
| කෘෂිකර්ම අමාත්‍යාංශය ... ... ... ... | 104,061.97 | 104,061.97 |
| අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ... ... ... ... | 48,092.55 | 48,092.55 |
| කාර්යමණ්ඩල විශේෂ අත්තිකාරම් ... ... ... ... | 4,250.00 | 1,800.00 |
| කාර්ය මණ්ඩල උත්සව අත්තිකාරම ... ... ... ... | 64,290.00 | 61,270.00 |
| කාර්ය මණ්ඩල ණය ... ... ... ... | 45,916.70 | 46,524.80 |
| වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය ... ... ... ... | 27,022.60 | 25,644.35 |
| විධායක නිලධාරීන් සඳහා අත්තිකාරම් ... ... | 11,968.86 | 58,569.91 |
| අතැති මුදල් ... ... ... ... | 3,920.00 | 3,920.00 |
| ලැබිය යුතු මුදල- ම/බැ මූලස්ථානය ... ... ... ... | 4,050.00 | 4,050.00 |
| සේ.අ.අ.හිඟ 10% (1983/1984) ... ... ... ... | 17,169.64 | 474,140.12 |
| ගෙවල් කුලී අත්තිකාරම් ... ... ... ... | 4,500.00 | —— |
| බැංකුවේ තැන්පතු මුදල් ... ... ... ... | 5,616,482.18 | —— |
| කාර්ය මණ්ඩලයෙන් ආපසු ලැබුනු මුදල් ... ... ... | —— | 1,336.43 |
| වියළි කලාපීය කෘෂිකාර්මික ව්‍යාපෘතිය ... ... ... ... | —— | 200,000.00 |
| | 6,763,541.84 | 1,783,565.00 |

සටහන : 2.1
**ඉදිරියට ගෙවූ වියදම්**

| | 1987 | 1986 |
|---|---|---|
| දායක මුදල් (පුවත් පත්) ... ... ... ... | 5,305.20 | 6,627.68 |
| ආදායම් බලපත්‍ර ... ... ... ... | 344,000.00 | 360,800.00 |
| සේවක හදිසි අනතුරු රක්ෂණය ... ... ... ... | 27,368.60 | 27,540.00 |
| තැපැල් පෙට්ටි ගාස්තු ... ... ... ... | 500.00 | —— |
| ඒ.එප්.එම්.ඒ. ... ... ... ... | 14,535.50 | 13,880.50 |
| | 391,709.30 | 408,848.18 |

සටහන : 3
**ජංගම බැරකම්**

| | 1987 | 1986 |
|---|---|---|
| උපචිත වියදම් 1987 (සටහන 3.1) ... ... ... ... | 235,000.00 | 280,000.00 |
| මැතිවරණ කොමසාරිස් ... ... ... ... | 3,819.06 | 3,819.06 |
| ගොවි ජන සේවා දෙපා. ... ... ... ... | 241.80 | 241.80 |
| සී.අයි.ආර්.ඩී.ඒ.පී. ... ... ... ... | 47.85 | 47.85 |
| බැංකු ශේෂය ... ... ... ... | —— | 426,957.32 |
| | 239,108.71 | 711,066.03 |

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## 1987 දෙසැම්බර් 31 දිනෙන් අවසන් අවුරුද්දේ ශේෂ පත්‍රය

**සටහන : 3.1**

**උපචිත වියදම්—** 1987

| | 1987 රු. ශත |
|---|---|
| යැපීම් දීමනා ... ... ... ... | 35,000.00 |
| ඉන්ධන ... ... ... ... | 75,000.00 |
| වාහන අළුත් වැඩියා කිරීම් (සාමාන්‍ය) ... ... ... ... | 60,000.00 |
| ටයර් සහ ටියුබ් ... ... ... ... | 15,000.00 |
| මැතිවරණ කොට්ඨාශ සඳහා වියදම් ... ... ... ... | 9,000.00 |
| විදුලිය ගාස්තු ... ... ... ... | 16,000.00 |
| දුරකථන ගාස්තු ... ... ... ... | 15,000.00 |
| ගෙවල් කුලී ... ... ... ... | 10,000.00 |
| | 235,000.00 |

**සටහන : 4**

**විවිධ ආදයම්**

| | |
|---|---|
| පාවිච්චිකළ ටයර්, ටියුබ් සහ පරණ පුවත්පත් අළෙවියෙන් ... ... | 28,596.50 |
| මාසයක් කල්දීම වෙනුවෙන් වැටුප් ආපසු ගෙවීම් ... ... ... | 7,764.50 |
| පිටපත් ... ... ... ... | 687.50 |
| ටෙන්ඩර් සඳහා තැන්පතු ... ... ... ... | 1,500.00 |
| විශේෂ අත්තිකාරම් සඳහා පොලිය ... ... ... ... | 5,444.50 |
| | 43,993.00 |

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## 1987-12-31 දිනට ක්‍රියාකාරී මුල් මුදල පිළිබඳ උපලේඛන

සටහන : 5

**පරිපාලන සහ සාමාන්‍ය වියදම්**

| | | 1987 | 1986 |
|---|---|---|---|
| | | රු. ශ. | රු. ශ. |
| 1. | අධ්‍යක්ෂ ගාස්තු ... ... ... ... | 15,000.00 | 12,700.00 |
| 2. | වේතන හා පඩි නඩි ... ... ... ... | 11,984,568.11 | 11,780,872.56 |
| 3. | සේ.අ.අ. සහ සේ.භා.අ. 15% ... ... ... ... | 1,786,392.70 | 1,753,459.72 |
| 4. | අතිකාල දීමනා ... ... ... ... | 53,416.76 | 37,778.52 |
| 5. | තැපැල් ගාස්තු ... ... ... ... | 103,892.00 | 102,558.75 |
| 6. | ලිපි ද්‍රව්‍ය/මුද්‍රණ වැඩ ... ... ... ... | 310,455.95 | 340,601.39 |
| 7. | දුරකථන ගාස්තු ... ... ... ... | 219,846.98 | 288,987.54 |
| 8. | වාර්ෂික වාර්තාව මුද්‍රණය කිරීම ... ... ... ... | 65,374.95 | 74,852.00 |
| 9. | දැන්වීම් ගාස්තු ... ... ... ... | 48,373.90 | 47,989.75 |
| 10. | විදුලිය ... ... ... ... | 51,892.78 | 9,630.60 |
| 11. | ගෙවල් කුලී ... ... ... ... | 501,303.54 | 486,903.84 |
| 12. | කාර්යාල උපකරණ අළුත්වැඩියා කිරීම ... ... ... | 69,310.65 | 39,171.85 |
| 13. | කාර්යාල ගොඩනැගිලි වැඩි දියුණු කිරීම ... ... ... | 17,107.45 | 17,404.28 |
| 14. | වැසිකිලි උපකරණ හා පොලිෂ් ... ... ... ... | 3,539.75 | 5,275.15 |
| 15. | නිල ඇඳුම් ... ... ... ... | —— | 41,460.00 |
| 16. | දායක මුදල් ... ... ... ... | 37,833.45 | 37,166.09 |
| 17. | සුභසාධක වියදම් ... ... ... ... | 17,268.23 | 16,676.95 |
| 18. | සභාපතිගේ සංග්‍රහ ... ... ... ... | 11,223.30 | 16,293.35 |
| 19. | විවිධ වියදම් ... ... ... ... | 74,565.82 | 79,314.30 |
| 20. | බැංකු ගාස්තු ... ... ... ... | 5,944.28 | 3,991.008 |
| 21. | විගණක ගාස්තු ... ... ... ... | 10,000,00 | 10,000.00 |
| 22. | පාරිතෝෂික දීමනා ... ... ... ... | 90,562.00 | 40,778.40 |
| 23. | සේවක හදිසි අනතුරු රක්ෂණ ... ... ... ... | 28,623.64 | 26,892.28 |
| 24. | කුලී රිය ගාස්තු ... ... ... ... | 155.00 | —— |
| 25. | ජේ.ඒ.සී.සී. ... ... ... ... | 50,000.00 | 40,000.00 |
| 26. | නීතිඥ ගාස්තු ... ... ... ... | 107,653.00 | 28,792.60 |
| 27. | ටෙලෙක්ස් ... ... ... ... | 19,061.50 | 55,150.00 |
| 28. | විදේශ ගමන් වියදම් ... ... ... ... | 74,132.42 | —— |
| | | 15,757,498.16 | 15,394,101.00 |

සටහන : 6

**ක්‍රියාත්මක කිරීමේ හා නඩත්තු කිරීමේ වියදම්**

| | 1987 | 1986 |
|---|---|---|
| | රු. ශ. | රු. ශ |
| ඉන්ධන සේවා ආදිය ... ... ... ... | 3,367,074.73 | 3,506,916.28 |
| වාහනවල සාමාන්‍ය අළුත්වැඩියා ... ... ... ... | 4,109,465.14 | 2,742,147.22 |
| ටයර් සහ ටියුබ් ... ... ... ... | 1,339,281.81 | 1,208,544.20 |
| පාඨමාලා හා සම්මන්ත්‍රණ වියදම් ... ... ... ... | 20,655.00 | 4,080.00 |
| වාහන රක්ෂණ ... ... ... ... | 476,718.97 | 557,753.75 |
| වාහන බලපත්‍ර ගාස්තු ... ... ... ... | 363,430.00 | 375,960.00 |
| මැතිවරණ කොට්ඨාශවල කාර්යාල වියදම් ... ... ... | 59,541.50 | 71,708.49 |
| ගමන් වියදම් හා යැපීම් දීමනා ... ... ... ... | 915,927.45 | 875,069.19 |
| පුහුණු කිරීම් හා ප්‍රචාරක වැඩ සටහන් ... ... ... | 11,141.75 | 29,313.25 |
| ග්‍රාමීය යෞවනයන් පුහුණු කිරීමේ වැඩ පිළිවෙල ... ... ... | 36,127.32 | 76,221.12 |
| | 10,699,363.67 | 9,447,713.50 |

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## 1987. 12. 31 දිනට ක්‍රියාකාරි මුල් මුදල පිළිබඳ උපලේඛන

සටහන 7

ස්ථාවර වත්කම් අලෙවියෙන් සිදුවූ පාඩුව

| | රු. ශ. |
|---|---|
| (අ) මෝටර් රථ | |
| මෝටර් රථ මිළට ගත් මුදල ... ... ... ... | 1,120,639.90 |
| අඩුකළා: | |
| සංචිත ක්ෂයවීම ... ... ... ... | 579,532.42 |
| | 541,107.48 |
| අඩුකළා: | |
| අලෙවි කිරීමෙන් ලත් මුදල ... ... ... ... | 60,885.00 |
| මෝටර් රථයු අලෙවියෙන් සිදුවූ පාඩුව ... ... ... | 480,222.48 |
| (ආ) ඡායා පිටපත් කිරීමේ යන්ත්‍රය | |
| ඡායා පිටපත් යන්ත්‍රය මිළට ගත් මුදල ... ... ... | 54.000.00 |
| අඩුකළා: | |
| සංචිත ක්ෂයවීම ... ... ... ... | 39,549.30 |
| | 14,450.70 |
| අඩුකළා: | |
| අලෙවි කිරීමට එකඟවූ මිළ ... ... ... ... | 5,000.00 |
| ඡායා පිටපත් යන්ත්‍රය අලෙවියෙන් සිදුවූ පාඩුව ... ... | 9,450.70 |

සටහන : 8

පසුගිය වර්ෂය සඳහා ගැලපීම්

| | |
|---|---|
| 1986 වර්ෂය සඳහා ගෙවූ මුදල් ... ... ... ... | 264,226.82 |
| 1987 හිඟ විදුලිය ගාස්තු සඳහා ගෙවූ මුදල් ... ... ... | 286,502.22 |
| අඩුකළා: | |
| 1986 වර්ෂයේ නිකුත් කරන ලද චෙක්පත් ගෙවීම් කටයුතු සඳහා ඉදිරිපත් නොකර බැහැර කරන ලද මුදල) ... | 39,946.03 |
| | 510,783.01 |

DEPARTMENT OF AGRICULTURE
CENTRAL
1 -5-1990
LIBRARY
PERADENIYA.

## විගණකාධිපති සටහන

කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ 1987 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් 1971 අංක 38 දරණ මුදල් පනතේ 13(1) වගන්තිය සමග කියැවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථා වෙහි අඩංගු විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

යොමුගත මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ප්‍රකාශයට පත්කළ යුතු මෙම ගිණුම් පිළිබඳ මාගේ නිරීක්ෂණයන් අධිකාරියේ සභාපතිවරයා අමතන ලද සම දින දරණ මාගේ වාර්තාවේ ඇතුළත්ව ඇත.

විගණකාධිපති.
1988 අගෝස්තු 12 දින,
කොළඹ 07, විගණකාධිපති දෙපාර්තමේන්තුවේදීය.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

**කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ 1987 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් පිළිබඳ 1971 අංක: 38 දරණ මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

සභාපති,
කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය,
කොළඹ 10.

**කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ 1987 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් පිළිබඳ 1971 අංක: 38 දරණ මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

1971 අංක: 38 දරණ මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාරව අධිකාරියේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු මගේ නිරීක්ෂණයන් අඩංගු වාර්තාව මේ සමග ඇත.

විගණකාධිපති.

පිටපත්: ලේකම්,
කෘෂිකාර්මික සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශය.

ලේකම්,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය.

අධි/888

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ 1987 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම් පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ 1987 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම් 1971 අංක 38 දරණ මුදල් පනතේ 13(1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මගේ විධානය යටතේ විගණනයට භාජනය කරන ලදී. මෙම විගණනයේදී පොදු ව්‍යාපාරික විගණන සමාගමක් මට සහාය විය. මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාරව සවිස්තරාත්මක වාර්තාවක් 1988 මැයි 24 දින සභාපතිවරයා වෙත යවන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාරව අධිකාරියේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යයි ම විසින් අදහස් කරන මාගේ නිරීක්ෂණයන් පහත දැක්වෙන ඡේදවල සඳහන් වේ.

### 1.1 විගණන විෂය පථය

මෙම වාර්තාවේ අඩංගු විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන් පිළිබඳ සමාලෝචන සහ ප්‍රමාණවත් ගණුදෙනු නියැදි පරීක්ෂණයන් මත පදනම් වී ඇත. එම සමාලෝචන සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්ති වලින් විගණකාධිපතිට අභිමතානුසාරී බලතල පැවරේ.

### 2. ගිණුම්

#### 2.1 විගණන මතය

ඉදිරිපත් කර ඇති ගිණුම්, මෙම වාර්තාවේ දැක්වෙන මාගේ අදහස් දැක්වීම්වලට යටත්ව ඉකුත් වර්ෂයේ අනුගමනය කරන ලද පදනමට අනුකූලව පොදු සම්මත ගණක මූලධර්ම පදනම් කරගෙන සතුටුදයක ලෙස පිළියෙල කර ඇති බව මගේ මතයයි.

**මූල්‍යමය ප්‍රතිඵල**

ගිණුම්වලට අනුව, 1987 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ අධිකාරියේ කටයුතු වලින් රු. 19,88,108 ක ආදායම ඉක්මවූ වියදම් අතිරික්තයක් දිස්වන අතර ඉකුත් වර්ෂයේ මීට අනුරූපිත ආදායම ඉක්ම වූ වියදම් අතිරික්තය රු. 14,45,158 කි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශණයෙන් දක් වේ.

| | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | | | |
|---|---|---|---|---|
| | 1987 | | 1986 | |
| | රු. | රු. | රු. | රු. |
| **ආදායම** | | | | |
| පුනරාවර්තන වියදම් සඳහා රජයේ දායකය ... | | 2,80,00,000 | | 2,46,50,000 |
| විවිධ ආදායම් ... ... | | 43,993 | | 57,265 |
| | | 2,80,43,993 | | 2,47,07,265 |
| **අඩුකළා : වියදම්** | | | | |
| වියදම් පරිපාලන හා පොදු ... | 1,57,57,498 | | 1,53,94,101 | |
| මෙහෙයුම් හා නඩත්තු ... | 1,06,99,364 | | 94,47,713 | |
| ක්ෂය ... ... | 30,85,566 | 2,95,42,428 | — | 2,48,41,814 |
| | | (14,98,435) | | (1,34,549) |

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

**කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ 1987 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම් පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (සි) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

| | | |
|---|---|---|
| **එකතුකළා :** | | |
| ස්ථාවර වත්කම් විකුණුම් අලාභ ... | (4,89,673) | (13,10,609) |
| ආදායම ඉක්ම වූ වියදම් අතිරික්තය ... | (19,88,108) | (14,45,158) |
| ඉකුත් වර්ෂය සඳහා ගැලපීම් ... ... | (5,10,783) | (7,01,636) |
| | (24,98,891) | (21,46,794) |
| **එකතුකළා :** | | |
| ඉදිරියට ගෙන ආ සමුච්චිත පාඩුව | (1,69,13,843) | (1,47,67,049) |
| | (1,94,12,734) | (1,69,13,843) |

**2.3 මූල්‍ය ව්‍යුහය**

1987 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ මූල්‍ය ව්‍යුහය 1986 දෙසැම්බර් 31 දිනට පැවති තත්ත්වය සමග සසඳා පහත දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනට 1987 රු. | 1986 රු. |
|---|---|---|
| **සම්පත්** | | |
| දයක ප්‍රාග්ධනය ... ... ... ... | 4,28,41,819 | 3,84,02,499 |
| සමුච්චිත අතිරික්තය/(ඌනතාවය) ... ... ... | (1,94,12,734) | (1,69,13,843) |
| | 2,34,29,085 | 2,14,88,656 |
| **උපයෝජනය** | | |
| ක්ෂය අඩුකල වටිනාකමට ස්ථාවර වත්කම ... ... | 1,69,04,652 | 2,04,02,277 |
| ශුද්ධ ජංගම වත්කම් ... ... ... ... | 65,24,433 | 10,86,379 |
| | 2,34,29,085 | 2,14,88,656 |

**2:4 අරමුදල් ප්‍රභවය හා යෙදවීම**

සමාලෝචිත වර්ෂය තුලදී අධිකාරියේ අරමුදල් ප්‍රභවය සහ යෙදවීම පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| | රු. | රු. | රු. |
|---|---|---|---|
| ආදායම ඉක්ම වූ වියදම් අතිරික්තය ... ... | (19,88,108) | | |
| **අඩුකළා :** ස්ථාවර වත්කම් විකිණුම් අලාභ ... ... | (4,89,673) | | |
| | (14,98,435) | | |
| **එකතුකළා :** ඉකුත් වර්ෂය සඳහා ගැලපීම් ... ... | (5,10,783) | | |
| | (20,09,218) | | |

**කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ 1987 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම් පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (සි) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

| | | | |
|---|---|---|---|
| **අරමුදල් චලනය නොවන ගැලපීම්** | | | |
| අඩුකළා : වර්ෂයේ ස්ථාවර වත්කම ක්ෂය ... ... | 30,85,566 | 10,76,248 | |
| **අරමුදල් ප්‍රභවය** | | | |
| ප්‍රාග්ධන දායකය ... ... ... | | 44,39,320 | |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලත් මුදල ... ... | | 65,885 | 55,81,553 |
| **අරමුදල් යෙදවීම** | | | |
| ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම ... ... | | --- | 1,43,500 |
| පහතින් විස්තර කර ඇති පරිදි කාරක ප්‍රාග්ධනයේ වැඩිවීම | | | 54,38,053 |

| | කාරක ප්‍රාග්ධනය කෙරෙහි බලපෑම වැඩිවීම රු. | අඩුවීම රු. | |
|---|---|---|---|
| බැංකු හා මුදල් ශේෂ වැඩිවීම ... ... | 60,43,439 | | |
| අනිකුත් ජංගම වත්කම් වැඩිවීම ... ... | | 6,50,386 | |
| ජංගම බැරකම් අඩුවීම ... ... ... | 45,000 | | |
| | 60,88,439 | 6,50,386 | |
| | 6,50,386 | | |
| කාරක ප්‍රාග්ධනයේ ශුද්ධ වැඩිවීම ... ... | | | 54,38,053 |

2:5 **ගිණුම් පිළිබඳ අදහස් දැක්වීම**

2:5:1 **ගිණුම් ආකෘතිය**

සමාලෝචිත වර්ෂයේ දක්වෙන ශේෂයන්ට අදාල පසුගිය වර්ෂයේ ශේෂයන් ශේෂ පත්‍රයේ පෙන්නුම් කර නොමැත.

2:5:2 **වංචා සහගත ගණුදෙනු**

අනිසි ලෙස වෙනස් කල චෙක්පතක් මත වංචනිකව බැංකුවෙන් ලබාගෙන ඇති රු. 4,050 පිළිබඳ වගකීම මහජන බැංකුවෙන් ලැබිය යුතු වත්කමක් ලෙස ගිණුම්වල දක්වා ඇත. එහෙත් මෙ සම්බන්ධයෙන් වගකීම බැංකුව විසින් පිළිගත් බවට සාධක නොවිය.

2:5:3 **විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| | ගණුදෙනු විෂය | වටිනාකම රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| i. | ඉන්ධන සේවා | 33,67,074 | (1) රු. 45,000 ක් සඳහා වූ ගෙවීම් වවුචරය ඉදිරිපත් නොකිරීම. |
| ii. | ඉන්ධන ටැන්පතු | 3,24,800 | සැපයුම්කරුවන් හයදෙනෙකු යටතේ ගිණුම්වල දක්වා ඇති රු. 19,300 න් රු. 15,300 ක් පමණක් අදාල සැපයුම් කරුවන් විසින් සනාථ කර තිබුණි. |

| | | |
|---|---|---|
| iii. සංයුක්ත දීමනා | 402.36 | ගෙවීම් වවුචරය ඉදිරිපත් නොකිරීම. |
| iv. ටයර් හා ටියුබ් | 7,600 | අදාල බිල්පත් ඉදිරිපත් නොකිරීම. |

2:5:4 **නොනිසි හෙළිදරව් කිරීම**

පෝස්ට් මාස්ටර් ජනරාල් වෙත තැන්පත් කරන ලද රු. 5,000 ක මුදලක් ඉන්ධන සඳහා තැන්පතු මුදලක් ලෙස ගිණුම්වල දක්වා ඇත.

2:5:5 **පරමාර්ථ, නීතිරීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම**

පරමාර්ථ, නීතිරීති සහ රෙගුලාසි වලට අනුකූල නොවූ අවස්ථා පහත දක් වේ.

| පරමාර්ථ, නීතිරීති සහ රෙගුලාසි වලට යොමුව | අවශ්‍යතාවය | අනුකූල නොවීම |
|---|---|---|
| 1. 1972 අංක 11 දරණ රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 22(3) වගන්තිය. | අධිකාරිය අනුදත් ප්‍රාග්ධනය වැඩිකිරීම සඳහා පාර්ලිමේන්තු අනුමැතිය අවශ්‍යය. | රු. 2,00,00,000 සිට රු. 4,28,41,819 දක්වා ප්‍රාග්ධනය වැඩි කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| 2. 1972 අංක 38 දරණ මුදල් පනතේ 14(1) වගන්තිය. | 1987 වර්ෂය සඳහා අධිකාරියේ කෙටුම් පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම. | ඉදිරිපත් කර නොතිබුණි. |

2:5;6 **එලදායී නොවන ගණුදෙනු**

සමීක්ෂණ මණ්ඩලයක් විසින් විකිණීම සඳහා නිර්දේශ කරන ලද ක්ෂය අඩුකල මිළ රු. 5,41,107 ක් වූ වාහන පහක් සමීක්ෂණ මණ්ඩලය විසින් තක්සේරු කරන ලද රු. 77,000 ට වඩා අඩුවෙන් රු. 6885 කට වෙන්දේසියේ විකුණා ඇති අතර, මෙම ගණුදෙනුවෙන් රු. 16,115 ක පාඩුවක් සිදුවී තිබුණි. තත් වාහන 1982 මිළදී ගන්නා ලද, රුමේනියාවේ නිෂ්පාදන වන අතර, වාහන සේවා සඳහා කාර්යක්ෂම වැඩ පිළිවෙලක් දේශීය නියෝජිතයින් සමග සැකසී නොතිබූ නිසා, මෙම වාහන සියල්ලම 1987 වන විට ධාවන තත්ත්වයේ නොතිබූ බවත්, එමනිසා වාහන මෙසේ අපහරනය කරන්නට සිදුවූ අතර, මෙම වර්ගයේ වාහන සියල්ල දැනට අපහරනය කර ඇති බවද මේ සම්බන්ධයෙන් සභාපති මා වෙත දන්වා එවීය.

3. **මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

3.1 **මූල්‍ය ප්‍රතිඵල**

ගිණුම් අනුව සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ ආදායම ඉක්ම වූ වියදම් අතිරික්තය පසුගිය වර්ෂයට වඩා ලක්ෂ 5.43 කින් වැඩිවී ඇත. මෙම වැඩිවීම පහත සඳහන් පරිදි විශ්ලේෂණය කළ හැක.

| | හිතකර රු.ලක්ෂ | අහිතකර රු.ලක්ෂ |
|---|---|---|
| ප්‍රාග්ධනය සඳහා රජයේ දයකය වැඩිවීම | 33.5 | — |
| විවිධ ආදායම් | — | 0.13 |
| වියදම් වැඩිවීම | — | 47.0 |
| ස්ථාවර වත්කම් විකුණුම් අලාභ | 8.2 | — |
| | 41.7 | 47.13 |
| | | 41.7 |
| | 41.7 | |
| | | 5.43 |

3.2 **අයවැය පාලනය**

ඇස්තමේන්තුගත අයවැය පදනමක් මත අධිකාරියේ කටයුතු මෙහෙයවා නොතිබුණි.

**විගණකාධිපති**

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ 1987 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ ගිණුම් පිළිබඳ විගණකාධිපති වාර්තාව

ජූලි 18 දින 1988

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.

මහත්මයාණෙනි,

**කෘෂිකර්ම සංවර්ධන අධිකාරියේ 1987 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ ගිණුම් පිළිබඳ විගණකාධිපති වාර්තාව**

ඉහත සඳහන් කරුණ සම්බන්ධව ඔබගේ 8/7/88 දරණ වාර්තාව සම්බන්ධයෙන්, මාගේ අදහස් මෙසේ පහත දක්වේ.

2:5:2 **වංචා සහගත ගණුදෙනු – ලැබිය යුතු මුදල් රු. 4050/-**

පසුගිය වර්ෂයේදී සඳහන් කළ පරිදි, මේ සම්බන්ධයෙන් බැංකුව විසින් දිගටම පරීක්ෂණ පවත්වා ගෙන යන බව සඳහන් කරණු කැමැත්තෙමු.

2:5:3 **විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැති වීම**

(1) **ඉන්ධන තැන්පතු රු. 324,800/-**

මෙහි සඳහන් වන ෆිලික්ස් පෙරේරා සහ පුත්‍රයින් වෙත ගෙවන ලද රු. 45,000/- මුදල ඉන්ධන තැන්පතුවක් නොවන අතර, එය අප ආයතනය ෆිලික්ස් පෙරේරා සහ පුත්‍රයා වෙතින් ලබාගන්නා ඉන්ධන වෙනුවෙන් සෑම මසකම මැදදී ගෙවන රු. 45,000/- ක ඉන්ධන අත්තිකාරම් මුදල වේ. කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය ෆිලික්ස් පෙරේරා සහ පුත්‍ර සමාගමෙන් ණය මුදලට ඉන්ධන ලබාගන්නා අතර, සෑම මසකම මැදදී රු. 45,000/- ක අත්තිකාරම් මුදලක් ගෙවන අතර, එය මාසයේ අවසානයේ ගෙවිය යුතු මුළු මුදලින් අඩු කෙරේ.

2:5:5 **පරමාර්ථ නීති රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම**

(1) අනුදත් ප්‍රාග්ධනය වැඩි කිරීමට පාර්ලිමේන්තු අනුමැතිය ලබාගැනීම සඳහා ගත යුතු මූලික පියවර ගෙන ඇත.

(2) ණය හිමියන් නොමැතිවීම නිසා ණය හිමියන් සම්බන්ධයෙන් වාර්තා ඉදිරිපත් නොකරන ලදී. තවද ණය ගැතියන් යටතට මූලික වශයෙන් ගැනෙනුයේ සේවක ණය ගැතියන් පමනක් වන හෙයිනුත්, තොග යටතට ගැනෙන්නේ අධිකාරියේ එදිනෙද පාවිච්චිය සඳහා යොදගන්නා ලිපිද්‍රව්‍ය වන හෙයිනුත් මේ සම්බන්ධයෙන් වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් නොකෙරුනි. එනමුදු විස්තර වශයෙන් පිළියෙල කරන ලද ණය ගැතියන් සහ තොග පිළිබඳ ලේඛණ විගණන සමාගම වෙත ඉදිරිපත් කරන ලදී.

(3) අධිකාරියේ වාර්ෂික කෙටුම් පත් වාර්තාව, 1/10/10/404 වන 11/04/1986 දින දරණ අමාත්‍යාංශ චක්‍ර ලේඛණයට අනුව 30/06/88 දින අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී.

2:5:6 **ඵලදායී නොවන ගණුදෙනු**

සමීක්ෂණ මණ්ඩලයක් මගින් විකිනීම සඳහා තක්සේරු කර, 1987 වර්ෂයේ විකුණන ලද වාහන පහඹ රුමේනියාවේ නිෂ්පාදනය කරන ලද 'ඇරෝ' වර්ගයේ ජීප් රථ වේ. මෙම වාහන 1982 ජූලි මසදී ගෙන්වන ලද්දේ කෘෂිකාර්මික සංවර්ධන හා පර්යේෂන අමාත්‍යාංශය මගින් ටෙන්ඩර් පත් කැඳවීමෙනි.

රුමේනියානු සමාගම විසින් ශ්‍රී ලංකාවේ මෙම වාහන සඳහා පත්කරන ලද නියෝජිත සමාගම මූල්‍ය අපහසුකම් මත වසා දමන ලදී. ඉන්පසු වෝකර් සහ පුත්‍ර සමාගම නියෝජිතයින් ලෙස පත්කරනු ලැබූ අතර, එයද ටික කලකින් අසාර්ථක විය.

තවද, 1986 වර්ෂයේදිද මෙසේ ගෙන්වන ලද 'ඇරෝ' ජීප් රථ 12 ක් විකුනා තිබූ අතර, ඒ සම්බන්ධයෙන්ද විගණකාධිපති විසින් ප්‍රශ්ණ කරන ලදුව මෙම සියළුම විස්තර පසුගිය වසරේද සපයනු ලැබූ බවද දන්වනු කැමැත්තෙමු.

# කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

## කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ 1987 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ ගිණුම් පිළිබඳ විගණකාධිපති වාර්තාව

1987 වර්ෂයේ විකුණනු ලැබූ ජීප් රථ පහම ධාවනය කළ නොහැකි තත්වයේ පැවතුනි. විස්තර පහත දැක්වේ.

| වාහන අංකය | තක්සේරු මිල | විකුණූ මිල |
|---|---|---|
| 31/9141 | රු. 12,000/- | රු. 9,702/- |
| 31/9130 | රු. 18,000/- | රු. 9,900/- |
| 31/9142 | රු. 22,000/- | රු. 15,345/- |
| 31/9154 | රු. 15,000/- | රු. 6,138/- |
| 31/9152 | රු. 10,000/- | රු. 19,800/- |
| එකතුව | රු. 77,000/- | රු. 60,885/- |

ඉහත විස්තරයෙන් පැහැදිලි වන්නේ, මෙම වාහන විකුණා ඇත්තේ තක්සේරු කළ මිලට වඩා රු. 16,115/- ක් අඩුවෙන් බවය. එනමුදු ඔබගේ වාර්තාවේ සඳහන්ව ඇත්තේ එය රු. 19,115/- ක් බවය. තවද මෙම වාහන විකුණන අවස්ථාවේ එහි ක්ෂය අඩුකළ ශුද්ධ වටිනාකම ඔබේ වාර්තාවේ සඳහන් පරිදි රු. 579,532/42 නොව රු. 541,107/48 වේ.

'ඇරෝ' වර්ගයේ වාහන ශ්‍රී ලංකාවේ ජනප්‍රිය නොවන නිසාත්, ඒවා ධාවන තත්වයේ නොතිබූ නිසාත්, ලැබෙන වැඩිම ඉල්ලුමට මෙම වාහන අලෙවි කිරීමට තීරණය කරන ලදී. එසේ නොවිකුණා තබාගත්තේ නම් සිදුවන්නේ තවත් කාලයක් ගතවීමෙන් එම වාහන ඊටත් අඩු මිලකට විකිණීමට සිදුවීමයි.

මෙයට - විශ්වාසී,
කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය

සභාපති.